56 වන කාණ්ඩය
7 වන කලාපය

බ්‍රහස්පතින්දා
1964 ජූලි 23

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ

### නිල වාර්තාව

(අශෝධිත පිටපත)

### අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදනය

ව්‍යවස්ථාදායක සභාවර කාරක සභා

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

පිළිගන්වන ලද කෙටුම්පත් පණත් :

**Trade Marks Bill :**

**Milk Board (Amendment) Bill :**

**Ceylon (Parliamentary Elections) (Amendment) Bill :**

දෙවන වර සහ සංශෝධන සහිතව තුන්වන වර කියවා සම්මත කරන ලදි.

ගම්සභා ව්‍යවස්ථා

නිවාස සහ නගර සංවර්ධන සම්මති

කල් තැබීමේ යෝජනාව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 56
இல. 7

வியாழக்கிழமை,
23, ஜூலை 1964

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

## பிரதிநிதிகள் சபை

அதிகாரபூர்வமான அறிக்கை

(பிழை திருத்தப்படாதது)

பிரதான உள்ளடக்கம்


அறிவிப்பு :

சட்டவாக்க நிலையற் குழுக்கள்

வினுக்களுக்கு வாய்மூல விடைகள்

முதன்முறை மதிப்பிடப்பெற்ற மசோதாக்கள் :

Trade Marks Bill

Milk Board (Amendment) Bill

Ceylon (Parliamentary Elections) (Amendment) Bill :

இரண்டாம் மூன்றும் முறை மதிப்பிடப்பெற்று திருத்தப் பெற்றவாறு நிறைவேற்றப்பட்டது.

கிராமச் சபை விதிகள்

வீடமைப்பு, நகர அபிவிருத்தித் தீர்மானம்

ஒத்திவைப்புப் பிரேரணை


---

Volume 56
No. 7

Thursday,
23rd July, 1964

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## HOUSE OF REPRESENTATIVES

OFFICIAL REPORT

(Uncorrected)

PRINCIPAL CONTENTS


ANNOUNCEMENT

LEGISLATIVE STANDING COMMITTEES

ORAL ANSWERS TO QUESTIONS

BILLS READ THE FIRST TIME :

Trade Marks Bill

Milk Board (Amendment) Bill

CEYLON (PARLIAMENTARY ELECTIONS) (AMENDMENT) BILL :

Read a Second and the Third time, and passed as amended.

VILLAGE COUNCIL RULES

HOUSING AND TOWN IMPROVEMENT RESOLUTIONS

ADJOURNMENT MOTION



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

## 1964 ජූලි 23 වන බ්‍රහස්පතින්ද

අ. භා. 2ට මන්ත්‍රී මණ්ඩලය රැස් විය. කථානායකතුමා [ගරු හියු ප්‍රනාන්දු] මූලාසනාරූඪ විය.

---

## නිවේදනය

*அறிவிப்பு*

ANNOUNCEMENT

### ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභා

*சட்டவாக்க நிலையற் குழுக்கள்*

LEGISLATIVE STANDING COMMITTEES

**කථානායකතුමා**

*(சபாநாயகர்)*

(Mr. Speaker)

122 වන ස්ථාවර නියෝගය අනුව තේරීම් කාරක සභාව විසින් මතු සඳහන් වන මන්ත්‍රීන් "ඒ" සහ "බී" ව්‍යවස්ථා දායක ස්ථාවර කාරක සභාවල සේවය සඳහා නම් කර ඇත:

"ඒ" ස්ථාවර කාරක සභාව

වෛද්‍යාචාර්ය එල්. ඕ. අබේරත්න.
ඒ. අමිර්තලිංගම් මයා.
ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.
ලෙස්ලි ගුණවර්ධන මයා.
එස්. ඩී. ආර්. ජයරත්න මයා.
යු. පී. වයි. ජිනදාස මයා.
ආචාර්ය ඩබ්ලිව්. දහනායක
මෙරිල් ප්‍රනාන්දු මයා.
ටී. ක්වෙන්ටින් ප්‍රනාන්දු මයා.
එම්. ඩී. බණ්ඩා මයා.
එස්. ඩී. බණ්ඩාරනායක මයා.
පී. බී. බාලසූරිය මයා.
ස්ටැන්ලි මොල්ලිගොඩ මයා.
එම්. ඊ. එච්. මොහමඩ් අලි මයා.
කේ. බී. රත්නායක මයා.
බී. ෂාහිර් ලයි මයා.
එම්. ඒ. ජේ. විජේසිංහ මයා.
ඊ. විජේසූරිය මයා.
ඩී. පී. ආර්. වීරසේකර මයා.
ඩඩ්ලි සේනානායක මයා.

"බී" ස්ථාවර කාරක සභාව

පී. ද එස්. කුලරත්න මයා.
පී. ජී. බී. කෙනමන් මයා.
ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.
ලක්ෂ්මන් ජයකොඩි මයා.
ජේ. ආර්. ජයවර්ධන මයා.
ටී. බී. ජයසුන්දර මයා.
නීල් ද අල්විස් මයා.
ලක්ෂ්මන් ද සිල්වා මයා.
හෙන්රි ඩබ්ලිව්. දිසානායක මයා.
ශ්‍රීමත් රසීක් ෆරීඩ්, ඕ.බී.ඊ.
කේ. ඩී. ඩී. පෙරේරා මයා.
ඒ. එච්. මාකන්-මාකර් මයා.
චන්ද්‍රසේන මුණවීර මයා.
සී. රාජදුරෙයි මයා.
කුසුමා රාජරත්න මිය.
එස්. බී. ලේනව මයා.
සෝමා වික්‍රමනායක මිය.
එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.
ස්ටීවන් සමරක්කොඩි මයා.
ටී. සිවසිතම්පරම් මයා.

In terms of Standing Order No. 122, the following Members have been nominated by the Committee of Selection to serve on Legislative Standing Committees "A" & "B":

STANDING COMMITTEE "A"

Dr. L. O. Abeyratne.
Mr. A. Amirthalingam.
Mr. D. B. R. Gunawardena.
Mr. Leslie Goonewardene.
Mr. S. D. R. Jayaratne.
Mr. U. P. Y. Jinadasa.
Dr. W. Dahanayake.
Mr. Meryl Fernando.
Mr. T. Quentin Fernando.
Mr. M. D. Banda.
Mr. S. D. Bandaranayake.
Mr. P. B. Balasuriya.
Mr. Stanley Molligoda.
Mr. M. E. H. Mohamed Ali.
Mr. K. B. Ratnayake.
Mr. B. Zahiere Lye.
Mr. M. A. J. Wijesinghe.
Mr. E. Wijesuriya.
Mr. D. P. R. Weerasekera.
Mr. Dudley Senanayake.

STANDING COMMITTEE "B"

Mr. P. de S. Kularatne.
Mr. P. G. B. Keuneman.
Mr. D. P. R. Gunawardena.
Mr. Lakshman Jayakody.
Mr. J. R. Jayewardene.
Mr. T. B. Jayasundera.
Mr. Neal de Alwis.
Mr. Lakshman de Silva.
Mr. Henry W. Dissanayake.
Sir Razik Fareed, O.B.E.
Mr. K. D. D. Perera.
Mr. A. H. Macan Markar.
Mr. Chandrasena Munaweera.
Mr. C. Rajadurai.
Mrs. Kusuma Rajaratna.
Mr. S. B. Lenawa.
Mrs. Soma Wickramanayake.
Mr. Edmund Samarakkody.
Mr. Stephen Samarakkody.
Mr. T. Sivasithamparam.

2—ආර් 19425—1,410(64/7)

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# ලිපි ලේඛනාදිය පිළිගැන්වීම

சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்

PAPERS PRESENTED

(1) 1964 වර්ෂය සඳහා වූ ලංකා පොල් මණ්ඩලයේ අයවැය ලේඛනය.

(2) 1962 දෙසැම්බර් මස 31 වැනිදැයින් අවසන් වූ වර්ෂය සඳහා ලංකා පොල් මණ්ඩලයේ ගණන් හිලව් පිළිබඳ පරීක්ෂිත ප්‍රකාශය.

(3) 1961 අංක 62 දරණ වෙළඳුන්ට බලපත්‍ර නිකුත් කිරීමේ පනතේ 3 වැනි හා 4 වැනි වගන්ති යටතේ වාණිජ, වෙළඳ ආහාර හා නැව්කටයුතු පිළිබඳ ඇමති විසින් පනවන ලද නියෝගයක්.

(4) 1961 අංක 62 දරණ වෙළඳුන්ට බලපත්‍ර නිකුත් කිරීමේ පනතේ 3 වැනි හා 4 වැනි වගන්ති යටතේ වාණිජ හා කර්මාන්ත පිළිබඳ ඇමති විසින් පනවන ලද නියෝගයක්.

(5) 1946 අංක 37 දරණ කිරුම් හා මිණුම් පනතේ 55 වැනි වගන්තිය යටතේ සම්පාදනය කරන ලද රෙගුලාසියක්.—

[ගරු පී. බී. ඉලංගරත්න]

**සභා මේසය මත තිබිය යුතු යයි නියෝග කරන ලදී.**

Supplementary Estimate No. 12 of 1963-64.—[ගරු බදිඋද්දීන් මහ්මුද්]

**සභා මේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

1960 අප්‍රේල් 1 වැනි දින සිට 1961 මාර්තු 31 වැනි දින හා 1961 අප්‍රේල් 1 වැනි දින සිට 1962 මාර්තු 31 වැනි දින දක්වා වූ කාලයන් සඳහා සහතික කරන ලද ගණන් හිලව් සහ ශේෂ පත්‍රද ඇතුළත් ලංකා පිගන් බඩු සංයුක්ත මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තා.—[ගරු මෛත්‍රීපාල සේනානායක]

**සභා මේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු

வினாக்களுக்கு வாய்மூல விடைகள்

ORAL ANSWERS TO QUESTIONS

## පී. පියසේන මයා. ලොරි පැදවීම සඳහා බලපත්‍රයක් ඉල්ලීම

திரு. பீ. பியசேன : லொறி செலுத்துவோர் அனுமதிப் பத்திர விண்ணப்பம்

MR. P. PIYASENA: APPLICATION FOR LORRY DRIVER'S LICENCE

1. පී. සී. ඉඹුලාන මයා. (රුවන්වැල්ල)

(திரு. பீ. ஸீ. இம்புலான—ருவான்வல்ல)

(Mr. P. C. Imbulana—Ruanwella)

ප්‍රවාහණ කටයුතු පිළිබඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) (i) නිර්මාණ ඉංජිනේරු (පාලම්) යටතේ සේවය කරන රුවන්වැල්ලේ, ගෝනරඹේ පී. පියසේන මෝටර් වාහන පැදවීම සඳහා අංක 122,984 දරණ බලපත්‍රය දරණ බවත්; (ii) මෝටර් ලොරි පැදවීම සඳහා දීර්ඝකර ගැනීම පිණිස ඔහු මෙම සහතිකය රත්නපුරේ ප්‍රාදේශීය මාර්ග ප්‍රවාහණ නිලධාරි තැන වෙත ඉදිරිපත් කළ බවත්; (iii) අවුරුදු 20කට පමණ පෙර දකුණු කොළඹ මහේස්ත්‍රාත් උසාවියේ අංක 6,464 දරණ නඩුවෙන් ඔහු වැරදිකරුවූ හෙයින් පොලිස් වාර්තා අනුව ඔහු නමගිය අපරාධකරුවෙකු හෙයින් ඔහුගේ අයදුම්පත ප්‍රතික්ෂේප කරන ලද බවත් එතුමා දන්නවාද? (ආ) මෙම නඩුවේදී ඔහුට විරුද්ධව නගන ලද චෝදනා නම් ඔහු කොළඹ වීදිවල නිකරුණේ ගැවසීම බවත්, ඔහුට දෙන ලද දඬුවම නම් කස පහර හතරක් ගැසීම පමණක් බවත් එතුමා දන්නවාද? (ඉ) පසුගිය අවුරුදු 20 තුළ ඔහුගේ හැසිරීම යහපත් වූ නිසාත්, ඉන් අවුරුදු 17ක්ම රජයේ සේවයේ යෙදී සිටි නිසාත් රිය පැදවීමේ බලපත්‍රය ලබාදීම සඳහා පියසේනගේ අයදුම් පත ගැන නැවත සලකා බලන ලෙස එතුමා ප්‍රාදේශීය මාර්ග ප්‍රවාහණ නිලධාරි තැනට නියෝග කරනවාද?

போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா: (அ) (i) பிரதான பொறியியலாளர் (பாலங்கள்) பகுதியில் கடமையாற்றுபவரும் ருவான்வெல்ல, கோணரம்பவைச் சேர்ந்தவருமான

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

திரு. பி. பியசேன மோட்டார் வாகனங்களைச் செலுத்துவதற்குரிய 122984 ஆம் இலக்கத் தகைமை அத்தாட்சிப்பத்திரத்தைக் கொண்டுள்ளாரென்பதையும், (ii) மோட்டார் லொறிகளையும் செலுத்துவதற் கேதுவாக அவ்வத்தாட்சிப்பத்திரத்தில் மாற்றம் செய்யும் பொருட்டு இரத்தினபுரி மாவட்ட வீதிப் போக்கு வரத்து உத்தியோகத்தருக்கு அவர் அதனை அனுப்பினாரென்பதையும், (iii) கொழும்பு தெற்கு மாஜிஸ்திரேட் நீதிஸ்தல 6464 ஆம் இலக்க வழக்கில் 20 வருடங்களுக்கு முன்னர் அவர் குற்றவாளியாகக் காணப்பட்டமையால் பொலிஸ் தகவலின் பிரகாரம் பன்முறை தண்டனைக்காளானவரெனக் கணிக்கப்பட்டு அவரது விண்ணப்பம் நிராகரிக்கப்பட்டதென்பதையும் அவர் அறிவாரா? (ஆ) கொழும்பில் உள்ள வீதிகளில் அலைந்து திரிந்தாரென்பதுதான் அவருக்கெதிரான குற்றச்சாட்டென்பதையும், இதற்கு அவருக்களிக்கப்பட்ட தண்டனை நான்கு பிரம்படிகள்தான் என்பதையும் அவர் அறிவாரா? (இ) பதினேழு வருடகாலம் அரசாங்கத்திற் கடமையாற்றியமையுட்பட கடந்த 20 வருடகாலமாக அவர் திறமையான நடத்தையுடையவராயிருப்பதை முன்னிட்டு, தகைமை அத்தாட்சிப்பத்திரம் பெறுதல் சம்பந்தமான அவரது விண்ணப்பம் சார்பாய் மீண்டும் ஆலோசனையிடுமாறு மாவட்ட வீதிப் போக்குவரத்து உத்தியோகத்தருக்கு அவர் கட்டளையிடுவாரா?

asked the Minister of Communications: (*a*) Is he aware that (i) P. Piyasena of Gonarambe, Ruwanwella, who is an employee under C. E. (Bridges) holds a certificate of competence No. 122984 to drive motor vehicles; (ii) he forwarded this certificate to the D. R. T. O., Ratnapura, to get it extended to motor lorries; (iii) his application was refused because he was an I. R. C. according to the Police Record in view of his conviction in M. C. Colombo South 6464 about 20 years ago? (*b*) Is he also aware that the charge against him in this case was that he was found straying in the streets of Colombo and that the punishment meted out was only 4 cuts with a cane? (*c*) In view of the fact that he has had a clean record for the last 20 years out of which 17 years have been in Government Service, will he direct the D. R. T. O. to reconsider Piyasena's application to obtain a certificate of competence?

**පී. ආර්. රත්නායක මයා. (ප්‍රවාහණ කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. பீ. ஆர். ரத்னாயக்க—போக்குவரத்து அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

Mr. P. R. Ratnayake—Parliamentary Secretary to the Minister of Communications)

(අ) (i) ඔව්. (ii) ඔව්. (iii) ඉල්ලුම්කරු ලේඛනගත අපරාධකරුවෙකු (අංක 165270) බව දැක්වෙන පොලිස් වාර්තාව නිසා, මෝටර් ප්‍රවාහණ පනතේ 125 (3) වැනි වගන්තියේ ප්‍රකාර, ඔහුගේ ඉල්ලුම් පත ප්‍රතික්ෂෙප කරන ලදි. (ආ) 61. 8. 7 වැනි දින අවිස්සාවේල්ලේ උප පොලිස් අධිකාරි වාර්තා කර ඇති පරිදි, අවසාන වරට ඔහු උසාවියට ඉදිරිපත් කරන ලද අවස්ථාවේදී, ඔහුට විරුද්ධව නගා තුබූ චෝදනාව නම් අපරාධ ක්‍රියාවක් කිරීමේ අදහසින් ඔහු ගොඩනැගිල්ලක් තුළ සිට අසු වීමයි. මේ සඳහා දඬුවම් වශයෙන් කසපහර 4 ක් ඔහු ලබා ඇත. (ඉ) මෝටර් ප්‍රවාහණ පනතේ 125 (3) වැනි වගන්තියෙන් පනවා ඇති තහනම් නිසා, රියැදුර බලපත්‍රයක් පියසේන මහතාට නිකුත් කළ නොහැකිය. මේ තහනම නිසා මතු වී ඇති දුෂ්කරතාවන් ගැන සලකා බලා, මේ වගන්තිය සංශෝධනය කැරෙමින්, යථෝක්ත තහනම ඉවත් වන ලෙස කෙටුම්පත් පනතක් සකස් කිරීම දැනට සැලකිල්ලට භජන වෙමින් පවතී.

**ඉඹුලාන මයා.**

*(திரு. இம்புலான)*

(Mr. Imbulana)

මේ පියසේන මහත්මයා මීට අවුරුදු 20 කට පෙරයි කස පහර හතරක දඬුවමක් ලබා තියෙන්නෙ. ඊට පසුව ඒ මහත්මයා දඬුවම් ලැබිය යුතු කිසිම වැරද්දක් කර නැහැ. අවුරුදු 20 කට උඩදී ඔහු පොඩි ළමයකු කාලේ මිලිටරි කෑම්ප් එකකට ගොස් තිබෙන නිසා මේ කස පහර දී තිබෙනවා. මෙවැනි වැරද්දක් කළ, අවුරුදු 17 ක් රාජකාරිය කළ පියසේන මහත්මයාට සහනයක් ලබා දෙන්න ඇමතිතුමාට පුළුවන්කමක් නැද්ද? එසේ පුළුවන්කමක් තිබෙනවා නම්, කරුණා කර සහනයක් ලබා දෙන්න.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**පී. ආර්. රත්නායක මයා.**
*(திரு. பீ. ஆர். ரத்ணயக்க)*
(Mr. P. R. Ratnayake)

මෙවැනි ප්‍රශ්න සම්බන්ධයෙන් පැන නැගෙන කරුණු ගැන සලකා බැලීමෙන් පසු දැන් 125 (3) වන වගන්තිය සංශෝධනය කරන්ට අමාත්‍යාංශය කල්පනා කර තිබෙනව.

**ඉඹුලාන මයා.**
*(திரு. இம்புலான)*
(Mr. Imbulana)

ඒ සංශෝධනය කොයි කාලයේ පමණ කෙරේවිද?

**පී. ආර්. රත්නායක මයා.**
*(திரு. பீ. ஆர். ரத்ணயக்க)*
(Mr. P. R. Ratnayake)

මේ සැසි වාරයේදීම ඒ සංශෝධනය ඉදිරිපත් කර සම්මත කර ගන්න අපි උත්සාහ කරනව.

## ගුරු මාරු
## ஆசிரியர் இடமாற்றம்
## TEACHER'S TRANSFERS

2. **ජී. ජේ. පාරිස් පෙරේරා මයා.** (ජාඇල)
*(திரு. ஜீ. ஜே. பாரிஸ் பெரேரா—ஜா-எல)*
(Mr. G. J. Paris Perera—Ja-Ela)

අධ්‍යාපන ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) අළුත් සේවා ස්ථානවල ඇති පහසුකම් ගැන කිසිම සැලකිල්ලක් නොදක්වා දුෂ්කර ප්‍රදේශවලට ගුරුවරුන් විශාල සංඛ්‍යාවක් යැවීමට කර ඇති යෝජිත ස්ථාන මාරු නිසා ඉමහත් දුෂ්කරතාවයන් සිදු වී ඇති බව එතුමා දන්නවාද? (ආ) නිවාස හා විශේෂ දීමනා වැනි පහසුකම් ප්‍රමාණවත් ලෙස සලස්වා දීමෙන් මෙම දුෂ්කර ප්‍රදේශවලට සෑහෙන තරම් ගුරුවරුන් එතුමා ලබා දෙනවාද? (ඉ) දැනට යෝජනා කර ඇති පරිදි අත්තනෝමතික අන්දමට නොව, සම්බන්ධිත ගුරුවරුන් සමග සාකච්ඡා කිරීමෙන් පසු මෙම ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමේ වැඩ පිළිවෙලක් එතුමා යොදනවාද?

*கல்வி அமைச்சரைக் கேட்ட வினா: (அ) புதிய இடங்களில் அவர்களுக்குக் கிடைக்கக் கூடிய வசதிகள் சம்பந்தமாய் எவ்வித ஆலோசனையும் செய்யப்படாது கஷ்டமான பிரதேசங்களுக்குப் பெருமளவில் ஆசிரியர்களை மாற்றும் உத்தேச திட்டத்தின் விளைவாய் அவர்களுக்குப் பெருமளவு அசௌகரியங்கள் ஏற்படுத்தப்பட்டுள்ளன வென்பதை அவர் அறிவாரா? (ஆ) குடிமனைகள், விசேட படிகள் போன்ற போதிய வசதிகளை அளிப்பதுமூலம் இக்கஷ்டமான பகுதிகளுக்குத் தேவையான ஆசிரியர்களைப் பெறுவாரா? (இ) தற்பொழுது உத்தேசிக்கப்பட்டுள்ள ஒருதலைப்பட்சமான தீர்மானத்தை விடுத்து, சம்பந்தப்பட்ட ஆசிரியர்களைக் கலந்தாலோசித்த பின்னர் அம்மாற்றங்களைச் செய்வதற்கேற்ற திட்டமொன்றினை அவர் வகுப்பாரா?*

asked the Minister of Education: (*a*) Is he aware that great inconvenience has been caused by the proposed mass transfers of teachers to difficult stations without any consideration for the facilities available to them at the new stations? (*b*) Will he get enough teachers to these difficult stations by providing them adequate facilities like quarters and a special allowance? (*c*) Will he devise a scheme to effect these transfers after consulting the teachers concerned and not in an arbitrary fashion as is proposed now?

**එස්. කේ. කේ. සූරියාරච්චි මයා.** (අධ්‍යාපන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)
*(திரு. எஸ். கே. கே. சூரியாரச்சி—கல்வி அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*
(Mr. S. K. K. Suriarachchi—Parliamentary Secretary to the Minister of Education)

(අ) දුෂ්කර පෙදෙස්වලට බහුල වශයෙන් ගුරුමාරුවීම් සිදු කර නොමැත. සමහර පාසල්වල උග්‍ර ගුරු හිඟය මගහරවාලීම් වස් පාසල්වල වැඩිපුර සිටි අවිවාහක පිරිමි ගුරුවරුන් සංඛ්‍යාවකට ඔවුන්ගේ ගම් පෙදෙස් අයත් දිස්ත්‍රික්කවලින් බැහැරට මාරුවීම් දෙන ලදී. (ආ) නිවාස, විශෙෂ දීමනා වැනි පහසුකම් ලබා දීමෙන් නොදියුණු පෙදෙස්වලට ගුරුවරුන් බඳවා ගැනීමේ ප්‍රශ්නය එවැනි පහසුකම් ලබා දීම සඳහා මුදල් ප්‍රතිපාදනයක් ලබාගත හැකි වූ විට සලකා බලනු ලැබේ. (ඉ) අළුත් ගුරුමාරු යෝජනා ක්‍රමය අනුව ගුරුමාරු මණ්ඩලවලට ගුරු නියෝජිතයන්ද පත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කිරීමට විධිවිධාන සලසා ඇත. එහෙයින් ගුරුවරුන්ගේ අදහස්ද ඔවුන්ගේ නියෝජිතයන් මගින් ගුරුමාරු මණ්ඩල වලට ලැබෙනු ඇත.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.** (කොට්ටාව)
*(திரு. டீ. பி. ஆர். குணவர்தன—கொட்டாவ)*
(Mr. D. B. R. Gunawardena—Kottawa)

ගරු කථානායකතුමනි, මා අතුරු ප්‍රශ්න යක් අහන්ට කැමතියි. මේ ප්‍රශ්නය තවම අධ්‍යාපන දෙපාර්තමේන්තුව විශේෂ සැල කිල්ලට භාජන කර නැහැ. ගුරු නිවාස පහසුකම් නැති පාසැල්වලට ගුරු වෘත්ති යේ යෙදී සිටින දහස් ගණන් ගුරුවරුන් මාරු කර යවනව. දරුවන් කීප දෙනා සිටින ගුරු පවුල් වෙනත් පාසැල්වලට මාරු කර යවන අවස්ථාවලදී ඒ දරුවන්ට නියම අන්දමට අධ්‍යාපනයක් ලබා ගැනීම අපහසු වෙනවා නේද? ගුරු නිවාසයක් තබා පැල්පතක්වත් නැති ස්ථාන තිබෙනවා නේද? ඒ පාසැල් සඳහා විශේෂයෙන් මුදල් යොදවා නිවාස පහසු කම් ඇති කරන්ට කටයුතු කරනවාද?

**සූරියාරච්චි මයා.**
*(திரு. சூரியாரச்சி)*
(Mr. Suriarachchi)

අප සඳහන් කළේ අවිවාහක ගුරුවරුන් මාරු කිරීමේ ක්‍රමය ගැනයි. විවාහක ගුරු වරුන් මාරු කිරීමේදී එවැනි අපහසුකම් කම් ගැන සලකා බලායි, මාරුවීම් කරන්නෙ.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

ඔය ආකාරයට අද ගුරුවරුන් දහස් ගණන් මාරු කරනව. ඒ ගුරුවරුන් සඳහා පාසැල්වල දැනට ගුරු නිවාස නැහැ. එම නිසා සමහරවිට ගුරුවරුන්ට හැතැප්ම හත අට පමණ දුර බැහැරසිට පාසැලට පැමිණෙන්ට සිදු වී තිබෙනව. වහාම ගුරු වරුන් ඒ තත්ත්වයෙන් මුදවනවාද?

**සූරියාරච්චි මයා.**
*(திரு. சூரியாரச்சி)*
(Mr. Suriarachchi)

පිළිතුරේ (ආ) කොටසෙන් නිවාස ගැන සඳහන් කළා. මුදල් ප්‍රතිපාදනයන් ලබා ගත හැකි වූවිට ඒ ගැන කටයුතු කරනවා යයි එහි සඳහන් වෙනවා.

**කේ. එම්. පී. රාජරත්න මයා.** (වැලිමඩ)
*(திரு. கே. எம். பீ. ராஜரத்ன—வெலிமடை)*
(Mr. K. M. P. Rajaratna—Welimada)

පාර්ලිමේන්තු ලේකම්තුමා විසින් කියන්ට යෙදුණා, ගුරුවරුන් මාරුකිරීම සම්බන්ධව ගුරු සංගමයේ නියෝජිතයන් ගෙන් සමන්විත මණ්ඩලයක් පිහිටුවන්ට යනවාය කියා. මා දැනගන්නට කැමතියි. කවදා සිට මේ අලුත් ගුරුමාරු මණ්ඩලය වැඩ කටයුතු ආරම්භ කරනවාද කියා.

**සූරියාරච්චි මයා.**
*(திரு. சூரியாரச்சி)*
(Mr. Suriarachchi)

ගුරු සංගම්වලට මේ පිළිබඳව දැනට දන්වා යවා තිබෙනවා. මා හිතනවා, ලබන ජනවාරි මාසයේ පමණ සිට මේ ක්‍රමය ක්‍රියාත්මක කරන්ට පුළුවන් වෙයි කියා.

## ස.තො.සේ. මගින් ආනයනය කරනු ලබන රෙදිවල ගොඩබෑමේ මිළ සහ සිල්ලරට විකුණන මිළ

*கூ. மொ. வி. நிலைய புடவை இறக்குமதி: இறக்குமதிச் செலவும் சில்லறை விலையும்*

C. W. E. TEXTILE IMPORTS : LANDED COST AND RETAIL PRICES

**3. ඉඹුලාන මයා.**
*(திரு. இம்புலான)*
(Mr. Imbulana)

අධ්‍යන්තර සහ බාහිර වෙළඳාම හා සැපයීම් කටයුතු පිළිබඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) සමුපකාර තොග වෙළඳ ආයතනය විසින් ආනයනය කරනු ලබන "4000" වර්ගයේ පොප්ලින් හා "ජම්පිං පිෂ්" වර්ගයේ රෙදි යාරයක මිළ ගොඩ බෑමේදී, කීයක් වේද? (ආ) සමුපකාර තොග වෙළඳ ආයතනයේ හා එහි ශාඛාවල මෙම වර්ගයේ රෙදි යාරයක් සිල්ලරට විකුණන මිළ කීයද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉඹුලාන මයා.]

உள்நாட்டு, வெளிநாட்டு வர்த்தக, வினியோக அமைச்சரைக் கேட்ட வினா: (அ) பப்ளின் "4000", "ஜம்பிங் பிஷ்" ஆகிய துணிகளை இறக்குமதிசெய்வதற்குக் கூட்டுறவு மொத்த விற்பனை நிலையத்திற்கு ஒரு யாருக்கு ஏற்படும் செலவு எவ்வளவு? (அ) கூட்டுறவு மொத்த விற்பனை நிலையத்திலும் அதன் கிளைத்தாபனங்களிலும் இத்துணிகளின் ஒரு யாரின் சில்லறை விலையென்ன?

asked the Minister of Internal and External Trade and Supply: (*a*) What is the landed cost per yard of '4000' Poplin and Jumping Fish textiles imported by the C. W. E.? (*b*) What is the retail price per yard of these materials at the C. W. E. and its branches?

**ගරු ටී. බී. ඉලංගරත්න (අභ්‍යන්තර සහ බාහිර වෙළඳාම හා සැපයීම් කටයුතු පිළිබඳ ඇමති)**

*(கௌரவ ரீ. பி. இலங்கரத்ன—உள்நாட்டு, வெளிநாட்டு வியாபார, விநியோக அமைச்சர்)*

(The Hon. T. B. Illangaratne—Minister of Internal and External Trade and Supply)

(අ) (i) "4000" හේ සුදු පොප්ලින් අගල් 36" යාරයක ගොඩබෑම් මිළ රු. 1.66. (ii) "4000" හේ පාට පොප්ලින් අගල් 36" යාරයක ගොඩබෑම් මිළ රු. 1.81. (iii) මුද්‍රිත ජම්පිං පිෂ් අගල් 36" යාරයක ගොඩබෑම් මිළ රු. 1.39. (ආ) (i) "4000" හේ සුදු පොප්ලින් යාරයක සිල්ලර මිළ රු. 2.30. (ii) "4000" හේ පාට පොප්ලින් යාරයක සිල්ලර මිළ රු. 2.50. (iii) ජම්පිං පිෂ් යාරයක සිල්ලර මිළ රු. 1.55.

**ඩී. ෂෙල්ටන් ජයසිංහ මයා.** (වත්තල)

*(திரு. டீ. செல்டன் ஜயசிங்ஹ—வத்தளை)*

(Mr. D. Shelton Jayasinghe—Wattala)

The difference between the imported price and the selling price, in the first instance, is almost 70 cents. Does the Hon. Minister not consider that an unreasonable profit, a profit of over 50 per cent, for the C. W. E.?

**ගරු ඉලංගරත්න**

*(கௌரவ இலங்கரத்ன)*

(The Hon. Ilangaratne)

The arithmetic of the hon. Member seems to be absolutely weak.

**ජයසිංහ මයා.**

*(திரு. ஜயசிங்ஹ)*

(Mr. Jayasinghe)

Then how much is it?

**ගරු ඉලංගරත්න**

*(கௌரவ இலங்கரத்ன)*

(The Hon. Ilangaratne)

Work it out yourself.

**ජයසිංහ මයා.**

*(திரு. ஜயசிங்ஹ)*

(Mr. Jayasinghe)

Does the Hon. Minister think that that is a reasonable margin of profit for the C. W. E.?

**ගරු ඉලංගරත්න**

*(கௌரவ இலங்கரத்ன)*

(The Hon. Ilangaratne)

Compared to the blackmarket, it is.

**ජයසිංහ මයා.**

*(திரு. ஜயசிங்ஹ)*

(Mr. Jayasinghe)

You are a blackmarketeer yourself.

**ගරු ඉලංගරත්න**

*(கௌரவ இலங்கரத்ன)*

(The Hon. Ilangaratne)

A blackmarketeer cannot pass judgment on others.

**ඩී. පී. ආර්. වීරසේකර මයා.** (රත්නපුරය)

*(திரு. டீ. பீ. ஆர். வீரசேக்கர—இரத்தினபுரி)*

(Mr. D. P. R. Weerasekera—Ratnapura)

කථානායකතුමනි, මාද අතුරු ප්‍රශ්නයක් අසන්න කැමතියි. කුට ධනපති වෙළඳුන් සියයට දෙසියයක් පමණ ලාබ ගන්නා නිසා ඔවුන්ට පහර වදින පරිදි, ඒ ද්‍රව්‍ය ඔවුන් අතට පත් නොවන්නට විධිවිධාන යොදනවාද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)
යොදනවා.

## ස. තො. සේ. වෙළඳ සැල, රුවන්වැල්ල: සේවකයන් තෝරා ගැනීම

## கூ. மொ. வி. கடை, ருவான்வெல: தொழிலாளரைச் சேர்த்தல்

## C. W. E. SHOP, RUWANWELLA: RECRUITMENT OF EMPLOYEES

4. පී. සී. ඉඹුලාන මයා. (රුවන්වැල්ල)
(திரு. பீ. ஸீ. இம்புலான—ருவான்வெல)
(Mr. P. C. Imbulana—Ruwanwella)

අභ්‍යන්තර සහ බාහිර වෙළඳාම හා සැපයීම් කටයුතු පිළිබඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) 1963. 12. 28 වැනි දින රුවන්වැල්ලේදී සමූපකාර තොග වෙළඳායතනයේ වෙළඳ සැලක් විවෘත කළ බව එතුමා දන්නවාද? (ආ) මෙම වෙළඳ සැලේ සේවය කිරීම සඳහා කී දෙනෙකු බඳවා ගන්නා ලද්දේද? (ඉ) ඔවුන් බඳවා ගැනීමට පෙර, ඔවුන්ගේ පුද්ගලික ලිපිනයන් මොනවාද? (ඊ) ඔවුන් තෝරාගත්තේ කෙසේද? කවුරුන් විසින්ද? (උ) සමූපකාර තොග වෙළඳ ආයතනයේ සේ කිරීම සඳහා බඳවා ගැනීමට අවශ්‍ය මූලික සුදුසුකම් මොනවාද? (ඌ) රුවන්වැල්ල වෙළඳ සැලට සේවකයින් තෝරා ගන්නා ලද්දේ කුමණ ක්‍රමයක් අනුවද? (එ) මෙම ස්ථානය සකස් කිරීම සඳහා වැය වූ මුලු මුදල කොපමණද? ඒ විෂයයන් මොනවාද?

உள்நாட்டு வெளிநாட்டு வர்த்தக, வினியோக அமைச்சரைக் கேட்ட வினா: (அ) ருவான்வெலயில் 28.12.63 இல் கூட்டுறவு மொத்த விற்பனை நிலையக் கடையொன்று திறக்கப்பட்டதை அவர் அறிவாரா? (ஆ) இக் கடையில் தொழிலுக்கமர்த்தப்பட்டோர் எத்தனை பேர்? (இ) தொழிலுக்கமர்த்தப்படுவதன் முன்னர் அவர்களது தனிப்பட்ட முகவரிகள் என்ன? (ஈ) அவர்கள் எவ்வாறு யாரால் தெரிவு செய்யப்பட்டனர்? (உ) கூட்டுறவு மொத்த விற்பனை நிலையத்தில் தொழில் பெறுவதற்குத் தெரிவு செய்யப்படுவதற்குத் தேவையான ஆகக் குறைந்த தகைமைகள் என்ன? (ஊ) ருவான்வெலக் கடையில் ஊழியர்கள் எவ்வடிப்படையில் தெரிவு செய்யப்பட்டனர்? (எ) இக்கடையை நிறுவுவதற்குச் செலவிடப்பட்ட மொத்தத் தொகையெவ்வளவு? எவ்வினங்களிற் செலவிடப்பட்டது?

asked the Minister of Internal and External Trade and Supply: (a) Is he aware that a C. W. E. Shop was opened at Ruwanwella on 28.12.63? (b) How many have been recruited for employment in this shop? (c) What were their private addresses prior to their recruitment? (d) How were they selected and by whom? (e) What are the basic qualifications necessary for selection for employment in the C. W. E.? (f) On what basis were the employees for the Ruwanwella shop selected? (g) What was the total amount spent on fitting up these premises and what are the items?

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

(අ) ඔව්.

| | | |
|---|---|---|
| (ආ) | වෙළඳ සේවකයින් | — 5 යි. |
| | කම්කරුවන් | — 5 යි. |
| | මුරසේවක | — 2 යි. |
| | එකතුව | —12 යි. |

(ඉ) **වෙළඳ සේවකයින්:**

1. ආර්. ඇස්. ඩී. ගුණරත්න, ඇම්. පුංචි මුදලාලි බාරේ, එගොඩ ඉඹුල්ගොඩ, ගලපිටමඩ, රුවන්වැල්ල.

2. ඇල්. පී. ඒ. රොසලින්, කිතුලන්ගමුව, ගලපිටමඩ.

3. අයි. ඇම්. පියරත්න, බොරලුවත්ත, ඉහල තල්දූව—අවිස්සාවේල්ල.

4. දේවයලාගේ සෝමදේව වෛද්‍යසේකර, දන්නොරුව, රුවන්වැල්ල.

5. ඇන්. ගුණවර්ධන, "විමල්සිරි", පිටදෙනිය, දෙහිඕවිට.

**කම්කරුවන්:**

1. ඇම්. කරුණාදාස, අංක 50, කෙළින් වීදිය, රුවන්වැල්ල.

2. ඇම්. ඩී. ගුණසේකර, රුවන්වැල්ල.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඉලංගරත්න]

3. විතානගේ විමලසේන, යටන්වල, පහල ගෙදර වත්ත, රුවන්වැල්ල.

4. වයි. පී. පියදාස, යටන්වල, රුවන් වැල්ල.

5. විතානගේ සෝමපාල, මාගම්මන, දෙහි ඕවිට.

**මුරසේවක :**

1. ඇස්. ඇම්. උක්කු බංඩා, මාකුර, කොටියා කුඹුර.

2. ඇල්. එච්. සෝමදාස, වැන්දල, කරව නැල්ල.

(ඊ) අයදුම් කරුවන්ගේ සුදුසුකම් අනුව සතොස සභාපති තැන විසින්. (උ) වෙළඳ සේවකයින් : රජයේ හෝ රජය මගින් පිළිගත් පාසැලක කණිෂ්ඨ විභාගයෙන් සමත් වී තිබීම. **කම්කරුවන් :** ලොරි වලින් බඩු බෑම හා පැටවීම, බඩු පාර්සල් කිරීම, ආදිය කළහැකි හොඳ ශරීර ශක්තියක් ඇති වීම. **මුරසේවකයින් :** හොඳ ශරීර ශක්ති යක් ඇති නීරෝගී අයවලුන් වීම. (ඌ) අවශ්‍ය සුදුසුකම් අනුව. (එ) **ගොඩනැගිලි සකස් කිරීම සඳහා වියදම් ලැයිස්තුව :**

| | |
|---|---|
| රෙදි අංශය | —රු. 4663.92 |
| සිල්ලර හා කුළුබඩු අංශය | —රු. 2049.93 |
| ලෝහ භාණ්ඩ අංශය | —රු. 1332.25 |
| මිශ්‍ර හා ආරක්ෂක විධිවිධාන | —රු. 1034.58 |
| එකතුව | —රු. 9080.68 |

මෙම කටයුතු රුවන්වැල්ලේ සීමාසහිත මොරාවත්ත විවිධ සේවා සමුපකාර සමිතිය ලවා කරවා ගන්නා ලදී.

**ඉඹුලාන මයා.**
*(திரு. இம்புலான)*
(Mr. Imbulana)

මෙම තනතුරු සඳහා ජ්‍යෙෂ්ඨ සමතුන් විශාල රාශියක් ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කළ බවත්, ඒ එක්කෙනකුටවත් එකම ඍකාන්තරයක්වත් නොලැබුණ බවත් ගරු ඇමතිතුමා දන්නවාද?

**ගරු ඉලංගරත්න**
*(கௌரவ இலங்கரத்ன)*
(The Hon. Ilangaratne)

මං හිතන හැටියට බලාපොරොත්තු වූ සුදුසුකම් අනුවයි මේ පත් කිරීම් කර තිබෙන්නෙ. ඒ ඒ ශ්‍රේණිවලට අනුවයි සුදුසුකම් නියම කරනු ලබන්නෙ.

**පාරිස් පෙරේරා මයා.**
*(திரு. பாரிஸ் பெரேரா)*
(Mr. Paris Perera)

ස. තො. සේ. වෙළඳසැලක් යම් ප්‍රදේශයක පිහිටු වූ විට එම වෙළඳසැලේ සේවය සඳහා පළාතෙන්ම සේවකයින් තෝරා ගැනීමට ඉඩ ප්‍රස්තා තිබෙනවාද? එහෙම නැති නම් කොළඹ මහ ආයතනයේ සේවකයින් ගෙන්වා ගන්නවාද?

**ගරු ඉලංගරත්න**
*(கௌரவ இலங்கரத்ன)*
(The Hon. Ilangaratne)

සමහර දෙනෙක් ඒ ප්‍රදේශයෙන්ම තෝරා පත් කර ගන්නවා. සමහර දෙනෙක් කොළඹ මහ ආයතනයෙන් ගෙන්වා ගන්නවා.

**පාරිස් පෙරේරා මයා.**
*(திரு பாரிஸ் பெரேரா)*
(Mr. Paris Perera)

සියලුම සේවකයින් ප්‍රදේශයෙන්ම තෝරා ගන්නවා නම් හොඳ නේද?

**ගරු ඉලංගරත්න**
*(கௌரவ இலங்கரத்ன)*
(The Hon. Ilangaratne)

සමහර ශ්‍රේණිවලට පුහුණු අය වුවමනා වුණු නිසා එසේ කිරීම අපහසුයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය ඇතුළත හාල් මෝල්වලට දෙන වී ප්‍රමාණයන්

*திருகோணமலைப் பகுதியிலுள்ள அரிசி ஆலைகள் : பங்குகள்*

**RICE MILLS IN TRINCOMALEE DISTRICT : QUOTAS**

5. **ඒ. ෂිවසුන්දරම් මයා.** (කිලිනොච්චි) (එම්. ඊ. එච්. මොහමඩ් අලි මයා. වෙනුවට)

*(திரு. ஏ. சிவசுந்தரம்—கிளிநொச்சி—ஜனாப் எம். ஈ. எச். முகம்மது அலி சார்பாக)*

(Mr. A. Shivasunderam—Kilinochchi—on behalf of Mr. M. E. H. Mohamed Ali)

කෘෂිකර්ම, ආහාර හා ධීවර කටයුතු පිළිබඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය ඇතුළත හාල් මෝල් කීයකට තාවකාලික වී ප්‍රමාණයන් දෙන ලද්දේද ? කොපමණ කාලයක් වී කෙටීමට ඔවුන්ට බලය දෙනු ලැබේද ? (ආ) තාවකාලිකව දෙනු ලබන වී ප්‍රමාණයන් ස්ථිර කිරීම ගැන එතුමා සලකා බලනවාද ? එසේ නම්, ඒ කවදාද ? නො එසේ නම් ඒ මන්ද ?

*கமத்தொழில், உணவு, கடற்றொழில் அமைச்சரைக் கேட்ட வினா : (அ) திரிகோணமலை மாவட்டத்தில் தற்காலிக அனுமதிப்பங்குகள் வழங்கப்பட்ட அரிசி ஆலைகள் எத்தனை ? எவ்வளவு காலம்வரை அவை அரிசி குத்துவதற்கும் அனுமதிக்கப்படும் ? (ஆ) தற்காலிகமாக வழங்கப்படுகின்ற அனுமதிப்பங்குகளை நிரந்தரமாக்குவது பற்றி அவர் சிந்திப்பாரா ? அவ்வாறாயின், எப்பொழுது ? அன்றேல், ஏன் ?*

asked the Minister of Agriculture, Food and Fisheries : (*a*) How many rice mills were given temporary quotas within the Trincomalee District and how long will they be permitted to mill ? (*b*) Will he consider making temporary quotas permanent ; if so when and if not, why ?

**සී. එස්. රත්වත්තෙ මයා.** (කෘෂිකර්ම, ආහාර හා ධීවර කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)

*(திரு. சீ. எஸ். ரத்வத்த—விவசாய, உணவு, கடற்றொழில் அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. C. S. Ratwatte—Parliamentary Secretary to the Minister of Agriculture, Food and Fisheries)

(අ) ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ හාල් මෝල් හිමියන් 21 දෙනෙකුට තාවකාලික සලාකයක් දෙන ලදී. දිස්ත්‍රික්කය ඇතුළත වැඩිපුර වී තිබෙන තාක් කල් මෙම තාවකාලික සලාකයක් දිගටම දෙනු ලැබේ. (ආ) අධික වශයෙන් වී මිළ දී ගන්නා කාලයන් තුළදී හැර වැඩිපුර වී නොලැබෙන ප්‍රදේශයන්හි ඒවා පිහිටුවා තිබේ. කරුණු මෙසේ හෙයින් මේ මෝල් හිමියන්ට ස්ථිර සලාකයක් දිය නොහැකිය. කෙසේ වෙතත් වී නිෂ්පාදනය අධික ලෙස කෙරෙන ප්‍රදේශයන්ට මෙම මෝල් ගෙන යෑමට මෝල් හිමියන් එකඟ වන්නේ නම්, ඔවුන්ට ස්ථිර සලාකයක් දීමේ ප්‍රශ්නය ගැන අනුග්‍රාහකව සලකා බලනු ඇත.

**කේ. හේරත් මයා.** (නිකවැරටිය)

*(திரு. கே. ஹேரத்—நிக்கவரட்டிய)*

(Mr. K. Herath—Nikaweratiya)

Will the hon. Parliament Secretary tell us the number of millers who have been taken off the list and whether no others have been appointed in their place ? Will he consider the question of making these appointments early, because there is a certain amount of frustration among the people not being able to get their quotas ?

**රත්වත්තෙ මයා.**

*(திரு. ரத்வத்த)*

(Mr. Ratwatte)

ඒ ගැන සලකා බලන ලෙස ඇමතිතුමාට දන්වන්නම්.

## යාපනයේ කණිෂ්ඨ කාර්මික විද්‍යාලය

*கனிட்ட தொழில் நுட்பப் பாடசாலை, யாழ்ப்பாணம்*

**JUNIOR TECHNICAL SCHOOL, JAFFNA**

6. **ෂිවසුන්දරම් මයා.**—(මොහමඩ් අලි මයා. වෙනුවට)

*(திரு. சிவசுந்தரம்—திரு. எம். ஈ. எச். முகம்மதலி சார்பில்)*

(Mr. Shivasunderam—on behalf of Mr. Mohamed Ali)

අධ්‍යාපන ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) කාර්මික අධ්‍යාපන කොමිෂන් සභාවේ වාර්තාව ලැබුනුවිට යාපනයේ කණිෂ්ඨ කාර්මික විද්‍යාලයය උසස් කිරීම ගැන සලකා බලන බව කලින් සිටි අධ්‍යාපන ඇමතිතුමා 1962.5.11 වැනි දින මෙම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ශිවසුන්දරම් මයා.]

සභාවේ දී ප්‍රකාශ කළ බව එතුමා දන්නවා ද? (ආ) කාර්මික අධ්‍යාපන කොමිෂන් සභාවේ වාර්තාව පළ කර ඇතත් මෙම කරුණ සම්බන්ධව මේ දක්වා කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නැත්තේ මන්ද? (ඉ) පහත සඳහන් පාඨමාලාවන් දෙමළ මාධ්‍ය යෙන් කණිෂ්ඨ කාර්මික විද්‍යාලයේ ඉගැන් වීමට එතුමා වහාම ක්‍රියා කරනවාද? නො එසේ නම්, ඒ මන්ද? (i) කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ පාඨමාලාව. (ii) මිනින් දෝරුවන් හා මට්ටම්කරුවන් සඳහා ප්‍රාරම්භ පාඨමාලාව. (iii) සටහන් ඇඳීම පිළිබඳ ප්‍රාරම්භ පාඨමාලාව, (iv) ගණක විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව. (v) වාණිජ විද්‍යා පාඨමාලාව. (vi) දෙමළ යතුරු ලියන් නන් සඳහා පාඨමාලාව.

*கல்வி அமைச்சரைக் கேட்ட வினா: (அ) யாழ்ப்பாணத்திலுள்ள கனிட்ட நுட்பப் பாடசாலையைத் தரமுயர்த்தும் விடயம் சம்பந்தமாக, தொழில் நுட்பக் கல்வி விசாரணை ஆணைக்குழுவினரின் அறிக்கை சமர்ப்பிக்கப் பட்டதும் நடவடிக்கையெடுக்கப்படுமென முன்னாள் கல்வி அமைச்சர் 11.5.1962 அன்று பிரதிநிதிகள் சபையில் தெரிவித்தாரென்பதை அவர் அறிவாரா? (ஆ) தொழில்நுட்பக் கல்வி விசாரணை ஆணைக்குழுவினரின் அறிக்கை சமர்ப்பிக்கப்பட்டும் இன்றுவரை இதுவிடயமாக நடவடிக்கையெதுவும் மேற்கொள்ளப் படாததேன்? (இ) கீழ்க்காணும் வகுப்புக்களைத் தமிழ் மொழிமூலம் கனிட்ட தொழில் நுட்பப் பாடசாலையில் ஆரம்பிப்பதற்கு அவர் உடனடியாக நடவடிக்கைகள் மேற்கொள்வாரா? அன்றேல், ஏன்?:—(i) கனிட்ட தொழில் நுட்ப வல்லுனர் போதனையினம். (ii) அளப்போரும் மட்டம் பார்ப்போருக்குமான ஆரம்பப் போதனையினம். (iii) படம் வரையும் தொழில் பயில்வோர் ஆரம்பப் போதனையினம். (iv) கணக்கியல் தகுதித் தேர்வுப் பத்திரப் போதனையினம். (v) வணிகத் தகுதித் தேர்வுப் பத்திரப் போதனையினம். (vi) தமிழ்த் தட்டெழுத்தாளர் போதனையினம்.*

asked the Minister of Education: (*a*) Is he aware that his predecessor stated on the Floor of the House on 11.5.1962 that he would consider upgrading the Junior Technical School, Jaffna, when he received the Report of the Commission on Technical Education? (*b*) Why has no action been taken on this matter up to date even though the Report of the Commission on Technical Education has been published? (*c*) Will he take immediate steps to have the following courses conducted in the Tamil Medium at the Junior Technical School? If not, why? (i) Junior Technical Officers' Coursee; (ii) Preliminary Course for Surveyors and Levellers; (iii) Preliminary Course in Draughtsmanship; (iv) Diploma Course in Accountancy; (v) Diploma Course in Commerce; (vi) Tamil Typists' Course.

සූරියආරච්චි මයා.

*(திரு. சூரியாரச்சி)*

(Mr. Suriarachchi)

(*a*) Yes. (*b*) The recommendation of the Technical Education Commission that the Junior Technical College at Jaffna, among others, should be up-graded as a Polytechnic has been accepted and it is incorporated in the White Paper, which is now before Parliament (vide paragraph 226). (*c*) The courses to be provided at the Junior Technical Schools will be according to the proposals for the National System of Education as will be accepted by Parliament. It is therefore too early to give any definite undertaking on this score.

## දෙමළ කථා කරන ජනතාව සඳහා ලලිත කලායතනයක්

*தமிழ் பேசும் மக்களுக்கு நுண்கலைக் கல்லூரி*

COLLEGE OF FINE ARTS FOR TAMIL-SPEAKING PEOPLE

7. ශිවසුන්දරම් මයා.—(මොහමඩ් අලි මයා. වෙනුවට)

*(திரு. சிவசுந்தரம்—ஜனாப் எம். ஈ. எச். முகம்மதலி சார்பில்)*

(Mr. Shivasunderam—on behalf of Mr. Mohamed Ali)

සංස්කෘතික කටයුතු හා සමාජ සේවා ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) දෙමළ කථා කරන ජනතාව සඳහා ලලිත කලා යතනයක් පිහිටුවීම රජය ප්‍රතිපත්තියක් වශයෙන් පිළිගෙන ඇතත්, එය පිහිටුවීමට මෙතෙක් කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නැති බව එතුමා දන්නවාද ? (ආ) කොළඹ පිහිටි ලලිත කලායතනයේ ඉගැන්වීමේ මාධ්‍යය සිංහල බැවින්, දෙමළ භාෂාව කථා කරන ජනතාව සඳහා ලලිත කලායතනයක් පිහිටුවන තුරු දෙමළ කථා කරන ශිෂ්‍යයින්ට ඉන්දියාවේ ලලිත කලා ඉගැනීම සඳහා අවසර දීමට එතුමා ක්‍රියා කරනවාද ? නොඑසේ නම්, ඒ මන්ද ?

*கலாச்சார விவகார, சமூகசேவை அமைச்சரைக் கேட்ட வினு: (அ) தமிழ் பேசும் மக்கள் இனத்திற்கு நுண்கலைக் கல்லூரியொன்றினை ஆரம்பிப்பதை அரசாங்கம் கொள்கையளவில் ஏற்றிருந்தும் இன்றுவரை நடவடிக்கையெதுவும் எடுக்கப்படவில்லையென்பதை அவர் அறிவாரா? (ஆ) கொழும்பிலுள்ள நுண்கலைக் கல்லூரியில் சிங்களமொழிமூலமே சகல போதனையினங்களும் நடைபெற்று வருகின்றமையால், தமிழ் பேசும் மக்களுக்கென நுண்கலைக் கல்லூரியொன்றை ஆரம்பிக்கப்படும்வரை அவர்கள் இந்தியாவில் நுண்கலைகளைப் பயில்வதற்கு அரசாங்கம் ஏற்ற நடவடிக்கையெடுக்குமா? அன்றேல், ஏன்?*

asked the Minister of Cultural Affairs and Social Services: (*a*) Is he aware that no action has yet been taken to establish a College of Fine Arts for the Tamil-speaking people although the Government has accepted it in principle? (*b*) As the medium of instruction at the College of Fine Arts in Colombo is Sinhala, will he take steps to permit Tamil-speaking students to study Fine Arts in India till such time as a College of Fine Arts for the Tamil-speaking people is established in Ceylon? If not, why?

**ගරු එම්. පී. ද සොයිසා සිරිවර්ධන (කම්කරු හා නිවාස කටයුතු පිළිබඳ ඇමති)**—(සංස්කෘතික කටයුතු හා සමාජ සේවා ඇමති වෙනුවට)

*(கௌரவ எம். பீ. டி சொய்சா சிறிவர்தன —தொழில், வீடமைப்பு அமைச்சர்—கலாச்சார, விவகார அமைச்சர் சார்பில்)*

(The Hon. M. P. de Zoysa Siriwardena —Minister of Labour and Housing—on behalf of the Minister of Cultural Affairs and Social Services)

(*a*) Government accepts in principle that Colleges of Fine Arts should be established in the provincial towns including Jaffna. An earlier proposal to establish such an institution in Jaffna was postponed due to lack of funds. The establishment of such institutions will be considered once the financial position improves. (*b*) Tamil students are, in fact, admitted to the Colleges of Fine Arts. In the College of Fine Arts provision has been made to give theory instructions in Tamil to students who are not sufficiently proficient in Sinhala. Since the provision for study of Fine Arts is sufficiently available in this country, in non-government institutions as well, permission cannot be granted to study three subjects in India.

## කෙටුම්පත් පණත් පිළිගැන්වීම

*சமர்ப்பிக்கப்பட்ட மசோதாக்கள்*

## Bills Presented

### TRADE MARKS BILL

"to amend and consolidate the law relating to trade marks".

පිළිගන්වන ලද්දේ අභ්‍යන්තර සහ බාහිර වෙළඳාම හා සැපයීම් කටයුතු පිළිබඳ ඇමති ගරු පී. බී. ඉලංගරත්න විසිනි. 1964 ජූලි 24 වන සිකුරාදා දෙවන වර කියවිය යුතුයයිද, එය මුද්‍රණය කළ යුතුයයිද නියෝග කරන ලදි.

### MILK BOARD (AMENDMENT) BILL

"to amend the Milk Board Act".

පිළිගන්වන ලද්දේ කෘෂිකර්ම, ආහාර හා ධීවර කටයුතු පිළිබඳ ඇමති වෙනුවට ගරු පී. බී. ඉලංගරත්න විසිනි. 1964 ජූලි 24 වන සිකුරාදා දෙවන වර කියවිය යුතුයයිද, එය මුද්‍රණය කළ යුතුයයිද නියෝග කරන ලදි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) (සංශෝධන) පණත

## இலங்கை (பாராளுமன்றத் தேர்தல்கள்) (திருத்த) மசோதா

## CEYLON (PARLIAMENTARY ELECTIONS) (AMENDMENT) BILL

**දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.**

**අ.භා. 2.20**

**ගරු සී. පී. ද සිල්වා (කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ ඇමති හා සභානායක)**

*(கௌரவ சீ. பீ. டி சில்வா—கமத்தொழில், காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரும் சபை முதல்வரும்)*

(The Hon. C. P. de Silva—Minister of Agriculture, Land, Irrigation and Power, and Leader of the House)

මෙම යෝජනාව මම ඉදිරිපත් කරමි:

"කෙටුම්පත් පණත දැන් දෙවන වර කියවිය යුතුය."

**කථානායකතුමා**

*(சபாநாயகர்)*

(Mr. Speaker)

Do the Party Leaders agree to dispose of the Second Reading of this Bill by 6 o'clock?

**ගරු සී. පී. ද සිල්වා**

*(கௌரவ சீ. பீ. டி சில்வா)*

(The Hon. C. P. de Silva)

And to finish it today.

**කථානායකතුමා**

*(சபாநாயகர்)*

(Mr. Speaker)

And finish the Committee Stage at 7 o'clock?

**ජයසිංහ මයා.**

*(திரு. ஜயசிங்ஹ)*

(Mr. Jayasinghe)

We shall make an effort.

**ගරු සී. පී. ද සිල්වා**

*(கௌரவ சீ. பீ. டி சில்வா)*

(The Hon. C. P. de Silva)

Other than making an effort, what else can we do?

ගරු කථානායකතුමනි, 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාවේ ප්‍රතිපාදනයන් ක්‍රියාත්මක කරවීම සලකා බැලීම සඳහා සහ 1960 පවත්වනු ලැබූ මහා මැතිවරණයන්ගෙන් ලත් අත්දැකීම් අනුව මැතිවරණයන්ට අදාලව දැනට පවත්නා නීතියට සහ ක්‍රියාකාරිත්වයට අවශ්‍ය සහ මනොඥ යයි සැලකෙන නිර්දේශයන් ඉදිරිපත් කිරීම සඳහා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ උපදේශක කමිටුවක් පත් කළා. ඒ කමිටුවට මේ ගරු සභාවේ පෙනී සිටින සියලුම දේශපාලන පක්ෂවල සාමාජිකයන් ඇතුළත් වුණා. මෙම කමිටුව ඒකච්ඡන්දයෙන් වාර්තාවක් ඉදිරිපත් කළා. ඒ වාර්තාව අනුව පසුගිය සැසිවාරයේදී "ලංකා ආණ්ඩුක්‍රම සහ පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) ව්‍යවස්ථා කෙටුම්පත" සහ "ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) (සංශෝධන) ව්‍යවස්ථා කෙටුම්පත" යන කෙටුම්පත් පණත් දෙක මේ ගරු සභාවට ඉදිරිපත් කළා. එයින් පළමුවැන්න වූ "ලංකා ආණ්ඩුක්‍රම සහ පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) ව්‍යවස්ථා කෙටුම්පත" මෙම ගරු සභාවේ තුනෙන් දෙකක ඡන්දයක් ලබා සම්මත වුණා. එය 1964 අංක 8 දරණ ලංකා ආන්ඩුක්‍රම හා පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) පණත යනුවෙන් නීතිගත වුණා. මැතිවරණ නීතියට තව දුරටත් සංශෝධනයක් කිරීම සම්බන්ධයෙන් වූ වැදගත් නිර්දේශයන් බොහොමයක් මේ අනික් පණතට, ඇතුළත් වෙනව.

ගරු කථානායකතුමනි, 1960 ඇති වූ මැතිවරණ දෙකේදීම අප ඉගෙන ගත් පාඩම් ගැන කල්පනා කර සහ පොලිස් දෙපාර්තමේන්තුව සහ ඇටර්නි ජනරාල් දෙපාර්තමේන්තුව ආදි මැතිවරණ කටයුතුවලට සහභාගි වන අනිකුත් දෙපාර්තමේන්තු සමගත්, සියලුම දේශපාලන පක්ෂ සමග සහ නොයෙකුත් සමිති සමගත් සාකච්ඡා කරල වැදගත් සංශෝධන කීපයක් මෙම පණතට ඇතුළත් කරල තියෙනව. ඒ කාරණා එක එකක් ගැන මේ අවස්ථාවේදී කථා කරන්නට මගේ අදහසක් නැහැ. මෙම අවස්ථාවේදී මේ කෙටුම්පත් පණත ඉතා සන්තෝෂයෙන් මෙම ගරු සභාවට ඉදිරිපත් කරනව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අද උදේ මේ පණත අද අවසන් කිරීම ගැන කථා කළාම ප්‍රශ්න දෙකක් පමණක් තියෙන බව කීව. ඒ ප්‍රශ්න දෙක තිබුණත්, හුඟක් දුරට සාකච්ඡා ඇති නොවේය කියා මම අදහස් කරනව. අද සවස 6 ට මෙම පණතේ දෙවන වර කියවීම පිළිබඳ විවාදය අවසන් කිරීමට උත්සාහ කරන බව ඔබ තුමා කීව. අද සවස අවසාන වන්නට ප්‍රථම මෙම පණතෙහි සියලුම අවස්ථා අවසාන කර ගැනීමට අපට පුළුවන් වේය කියා මම බලාපොරොත්තු වෙනව.

**ප්‍රශ්නය සභාසම්මත කරන ලදී.**

අ.භා. 2.23

**ඒ. එච්. මාකන්-මාකර් මයා.** (මඩකලපුව දෙවන මන්ත්‍රී)

*(ஜனாப் ஏ. எச். மாக்கன் மாக்கர்—மட்டக் களப்பு இரண்டாம் அங்கத்தவர்)*

(Mr. A. H. Macan Markar—Second Batticaloa)

Mr. Speaker, while I am not opposed to the proposed Bill to amend the Ceylon (Parliamentary Elections) Order in Council, as it has had the unanimous support of all parties, represented as they were by what I call the cream of talent, I would like to say a few words without taking much of the time of this House.

Firstly, it appears that recent legislation has a tendency towards removing the little glamour or *tamasha* which, hitherto, used to be associated with elections, and particularly general elections, with all the banners, posters, processions and loudspeakers. In spite of the fact that we Ceylonese are a volatile nation, we are, by doing this, trying to imitate or emulate the example of the phlegmatic British. I am afraid that henceforth elections are going to be dull, drab and dreary as ditch water.

However, I would like to make a few suggestions for the consideration of the next Joint Select Committee that would sit on a future date.

There is a proposal to introduce section 28 (*a*) to replace the previous section relating to the legal recognition of political parties. Now, our parliamentary system is modelled on the British parliamentary system, and for its successful working there should not be a multiplicity of parties. However, Clause 16 has been introduced. I do not know why. Perhaps, it is to enable the Joint Select Committee to appease all sections of the House, making special provision to enable a happily married couple, whose views at least in politics are identical, to function as a recognized political party.

Likewise there is the case of the crusted bachelor whose only camp—follower crossed over to the Government party. He too would continue as the sole representative of a one-man party. The particular gentleman I refer to is the hon. Member for Galle (Dr. W. Dahanayake) who would always continue to make a very valuable contribution to the debates in this House. Even though his is a single-member party, I am sure he would be able to debate more than any party in this House.

So, in order to preclude the small splinter groups from functioning as fully-fledged parties, in order to encourage new groups which are ideologically similar to unite, it should be laid down that in order to gain recognition each party should have at least ten members returned to the House of Representatives at a General Election. Furthermore, I also suggest that no person should be permitted to contest an election as an independent candidate. A candidate must belong to one of the recognized political parties. An exception may be made of the Speaker who would be permitted to come forward uncontested as an independent candidate.

A Member who resigns or is expelled from his political party should, *ipso facto*, be deemed to have vacated his seat in Parliament. This would ensure stricter party discipline. In that connection I may refer to the great and good example set by the *ex*-Member for Nikaweratiya (Mr. Mudiyanse Tennekoon), who resigned not only from his party and his

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මැකන්-මාකර් මයා.]

portfolio of Acting Minister of Finance but also his seat and re-contested and lost. His example should be emulated. I would suggest that legislation be framed to enable political parties to exert greater discipline among their members in that should a Member be expelled from a party or should he resign, he would be deemed to have vacated his seat in Parliament.

There is another provision in the Bill which affects particularly the orthodox, Muslim female voter. I refer to the clause which enables males to act as presiding officers at such polling booths which are ear-marked for female voters. I am sorry this should have been done, because there seems to be a tendency among legislators to whittle away the little privileges, rights and concessions that had hitherto been enjoyed by the minorities—this is indeed a sad sign of the times!

Clause 28 enables a presiding officer, if requested by a polling agent or a candidate, to call upon a voter to make the prescribed declaration before a ballot paper is given to that voter. There are unscrupulous polling agents who invariably harass voters by insisting on such a declaration being signed. I have seen for myself cases where genuine voters have been maliciously challenged by polling agents and refused the right to vote. At the 1962 Colombo Municipal Elections a female voter whose identity was not in doubt was challenged by a polling agent of the rival candidate and she was detained by the presiding officer despite the fact that I was prepared to guarantee that she was the person referred to in the list of voters. That female voter was detained by the presiding officer until the voting was over and then handed over to the police; subsequently, when the police found out that she was a genuine voter and not an impersonator she was released. So that it is necessary to provide a safeguard for voters to exercise their democratic right to vote; it is unfair on our part to allow such a state of affairs to continue without the necessary safeguards. I would, therefore, suggest that a person who challenges maliciously, whose challenge is counter-challenged by the other party, should be penalized by a fine or term of imprisonment. He must be penalized if his challenge is found to be false and malicious, and such challenges are in fact, made in order to dissuade voters, specially female voters, from coming to the polling booths. When other female voters come to know that a genuine voter has been detained, they too are dissuaded from coming to the polling booth to exercise their democratic right to vote.

I find that under Clause 30 there could be two recounts—

කථානායකතුමා
(சபாநாயகர்)
(Mr. Speaker)

That matter can be dealt with at the Committee stage.

මැකන්-මාකර් මයා.
(ஜனாப் மாக்கன் மாக்கர்)
(Mr. Macan Markar)

I only want to make one comment on this matter: Instead of bundles being counted individual ballot papers should be counted.

With regard to the prohibition of the display of banners, posters and flags, I would suggest that party banners should be allowed—they are allowed at elections in Italy. The individual poster of a candidate should be prohibited but the party banner should be permitted so as to make the people realize that there is something " cooking ".

Then employers are to be penalized for undue influence exercised on their employees. Likewise I fell that trade unions should be subject to the same restrictions in that they too should not be permitted to influence employees outside the trade union to vote in a particular manner.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

There is also a clause dealing with false statements published in newspapers. I would extend this clause to include cartoons too, through which greater damage is done.

I find that the election expenses allowed to a candidate has been reduced to Rs. 5,000 or 20 cents per voter, whichever is less. This is very unrealistic in view of the high cost of living. We must also take into consideration the fact that there is such a long period between the date of nomination and the date of election. In view of this I do not think that the election expenses allowed a candidate—which was previously Rs. 7,500—should be reduced.

I also feel that full-pay leave should be granted to all employees so that they may be able to exercise their democratic right of voting at elections. I feel that even those persons who are self-employed—farmers, cultivators, and carpenters—should be compensated for any loss of earnings on election day.

Finally, I find that under our Constitution a period of four months may elapse between the date of dissolution of one Parliament and the date of election. I would appeal to the Government to see that this period of four months is reduced to four or five weeks because of the ordeal that candidates have to undergo when that period is so unreasonably long. In the U. K. and other countries elections are held within 4 weeks of the dissolution of Parliament and I would suggest that steps be taken to hold our elections within four or five weeks of the dissolution of Parliament.

**කේ. ඇම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

ගරු කථානායකතුමනි, මේ ඉදිරිපත් කර තිබෙන කෙටුම්පත් පණත සම්මත වුණායින් පසුව මෙය නීති ගත වන්නේ සිංහල භාෂාවෙන්ද? සිංහලෙන් පිළියෙල කර තිබෙන පණත නීතිය අනුව පිළිගන්නේ නැත්නම් මේ පණතට එකතු කිරීම සඳහා අප ඉදිරිපත් කරන සංශෝධනත් ඉංග්‍රීසියෙන් ඉදිරිපත් කරන්න වෙනවා. එම නිසා මුලදීම මේ කාරණය ගැන ඔබ තුමාගේ නියෝගය දැන ගන්නට කැමතියි. සිංහලෙන් ඉදිරිපත් කර තිබෙන පණතක් ඉංග්‍රීසි එක හා සමානම වලංගුද? පසුගිය කාලයේදී මුදල් පණත පිළිබඳවද මේ ප්‍රශ්නයම මතු වූ විට දැනට සිටින වෙළෙඳ ඇමතිතුමා කියා සිටියේ සිංහලෙන් ඉදිරිපත් කර තිබෙන පණත වලංගු නැති බවයි. එදා මා ඇසූ නීති ප්‍රශ්නය ගැන පැහැදිලි තීන්දුවක් දෙන්න ඔබතුමාට අවසථාවක් ලැබුණේ නැහැ. එම නිසා දැන්වත් මේ ගැන පැහැදිලි තීන්දුවක් දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

මා දන්නා තරමින් පසුගිය කාලයේදී මේ ප්‍රශ්නය පිළිබඳව පක්ෂ නායකයන් සමඟ සාකච්ඡා කර තිබෙනවා. මුල් නීති සියල්ලම ඉංග්‍රීසි භාෂාවෙන් තිබෙන නිසා ඒවා රාජ්‍යභාෂාවට පරිවර්තනය කරන තුරු එම මුල් නීතිවලට එකතු කරන සංශෝධන ඉංග්‍රීසි භාෂාවෙන් ඉදිරිපත් නොකළොත් යම් යම් දුර්වලකම් ඇති වන්නට පුළුවන්. එම නිසා මුල් නීති සිංහල භාෂාවට පරිවර්තනය කිරීම පිළිබඳ යුක්තිය ඉෂ්ට වන තුරු ඒ මුල් නීතිවලට ඇඳන සංශෝධන ඉංග්‍රීසි භාෂාවෙන් විය යුතුයි.

අ.භා. 2.38

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක** (ගාල්ල)
*(கலாநிதி டப்ளியு. தகநாயக்க—காலி)*
(Dr. W. Dahanayake—Galle)

ගරු කථානායකතුමනි, මඩකලපුවේ දෙවන ගරු මන්ත්‍රීතුමා විසින් මතු කරන ලද ප්‍රශ්නයක් සම්බන්ධයෙන් මා මුලින්ම පිළිතුරු දෙන්න කැමතියි. දේශපාලන පක්ෂවලට දී තිබෙන ඉඩ ගැන සලකන විට, මන්ත්‍රීවරුන් දෙපළක් සිටින දේශ පාලන පක්ෂයකටත් ඉඩ ලැබෙන බව සඳහන් කළ ඒ ගරු මන්ත්‍රීතුමා මා ගැනත් මතක් කළා. මේ විධියේ සංශෝධනයක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය ඩබ්ලිව්. දහනායක]

ඉදිරිපත් කර ඇත්තේ මට පෞද්ගලික වාසියක් බලාපොරොත්තුවෙන් නොවන බව කිව යුතුව තිබෙනවා. මන්ත්‍රීවරුන් දෙදෙනා වෙනුවට මන්ත්‍රීවරුන් දහ දෙනාය කියා සඳහන් කරතොත් මා නම් පෞද්ගලික වශයෙන් කැමතියි. 1960 දී මන්ත්‍රීවරුන් දහ දෙනකු හෝ ඊට වැඩි දෙනකු හෝ මේ ගරු සභාවට පත් වුණු දේශපාලන පක්ෂ පමණක් පිළිගැනීම ගැන මා පෞද්ගලික වශයෙන් කැමතියි. ඒ විධියේ සංශෝධනයක් මඩකලපුවේ දෙවන ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරනවා නම් මා ඊට එකඟ වෙනවා. නමුත් මේ විධියට මන්ත්‍රීවරුන් දෙදෙනකු ගැන පමණක් සඳහන් කර තිබෙන්නේ සියලු දෙනාටම අවසථාවක් ලබා දීමටයි. යම්කිසි සුළු දේශපාලන පක්ෂයක් තිබුණත් ඒ පක්ෂයට මන්ත්‍රීවරුන් ගණන වැඩි කර ගැනීමට අවසථාව සලසා දීම ප්‍රජාතන්ත්‍ර වාදයට හුරුය කියා කල්පනා කරන්නට පුළුවනි. එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ සංඛ්‍යාව 1956 දී අටදෙනා දක්වා අඩු වූ බව සියලු දෙනාටම මතක ඇති. අෂ්ට ලෝක ධර්මය අනුව යමක් ඇති වෙනවා ; නැති වෙනවා. නගිනවා ; බහිනවා. යම්කිසි දේශපාලන පක්ෂයට කොතරම් මන්ත්‍රීවරුන් ගණනක් ඇති වේදැයි කාටවත් කියන්න බෑ. එම නිසා මෙය ප්‍රජාතන්ත්‍රවාදයට හුරුය කියන අදහස පිටයි, අප මේ තීරණයට බැස්සේ. නමුත් මෙයින් පෞද්ගලික වාසියක් ලබා ගන්න මා කැමති නැහැ. එම නිසා මන්ත්‍රීවරුන්ගේ ගණන දෙදෙනා වෙනුවට දහ දෙනකු විය යුතුයයි මඩකලපුවේ දෙවන ගරු මන්ත්‍රීතුමා යෝජනා කර තොත් මා සතුටින් එය පිළිගන්නවා. දේශපාලන පක්ෂයක නියෝජිතයෙකු වශයෙන් ඉදිරිපත් නොවන, ස්වාධීන ලෙස තරයගට ඉදිරිපත් වන නිදහස් මන්ත්‍රීධුරාපෙක්ෂකයන්ට ඉඩ දීම වැරදිය කියාත් එවැන්නන්ට එන්න ඉඩ දෙන්න එපාය කියාත් මඩකලපුව දෙවන ගරු මන්ත්‍රීතුමා (මාකන් මාකර් මයා.) ප්‍රකාශ කර සිටියා. එය එක්සත් ජාතික පක්ෂයේ අදහසද කියන්න මා දන්නෙ නැහැ.

**ඒ. රත්නායක මයා.** (වත්තේගම)
*(திரு. ஏ. ரத்னுயக்க—வத்தேகம)*
(Mr. A. Ratnayake—Wattegama)
නැහැ.

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**
*(கலாநிதி டப்ளியு. தகனுயக்க)*
(Dr. W. Dahanayake)

ඒ අදහස සම්පූර්ණයෙන්ම ප්‍රජාතන්ත්‍ර වාදයට විරුද්ධයි. මේ ලෝකෙ ඕනෑම මතයකට එක්කෙනෙකුට වුණත් ඉඩ දෙන්න ඕනෑ. ලෝකයේ අනෙකුත් සියලු දෙනාම විරුද්ධ වුණත් තමන්ගේ මතයට අනුව ක්‍රියා කරන්න නිදහස තියෙන්න ඕනෑ. සමහර විට අපි තනියම පැත්තක් ගැනීමට බිය වෙන්නෙ නැහැ. එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්තිය මොකක්ද කියා මා දන්නෙ නැහැ. ඒ කොයි හැටි වෙතත් ඒක නම් ප්‍රතිගාමී අදහසක් හැටියට මම පිළිගන්නවා.

**ජේ. ආර්. ජයවර්ධන මයා.** (දකුණු කොළඹ පළමුවන මන්ත්‍රී)
*(திரு. ஜே. ஆர். ஜயவர்தன—கொழும்புத் தெற்கு முதலாம் அங்கத்தவர்)*
(Mr. J. R. Jayewardene—First Colombo South)
ඒක නොවෙයි අපේ අදහස.

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**
*(கலாநிதி டப்ளியு. தகனுயக்க)*
(Dr. W. Dahanayake)

පක්ෂයකින් නැතිව ස්වාධීනව එන්න ඉඩ දෙන්න ඕනෑ. යම්කිසි පුද්ගලයෙක් එය තහනම් කරන්න උත්සාහ කරනවා නම් ඒක සම්පූර්ණයෙන්ම ප්‍රජාතන්ත්‍ර වාදයට විරුද්ධ ක්‍රියාවක්ය කියා මා කල්පනා කරනව.

**ජේ. ආර්. ජයවර්ධන මයා.**
*(திரு. ஜே. ஆர். ஜயவர்தன)*
(Mr. J. R. Jayewardene)

ඒක මඩකලපුවේ අදහසක් වෙන්න ඇති.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**
*(கலாநிதி டப்ளியு. தகனாயக்க)*
(Dr. W. Dahanayake)

එක්සත් ජාතික පක්ෂයේ අදහසක් නොවෙයි ?

**ජේ. ආර්. ජයවර්ධන මයා.**
*(திரு. ஜே. ஆர். ஜயவர்தன)*
(Mr. J. R. Jayewardene)

නැහැ.

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**
*(கலாநிதி டப்ளியு. தகனாயக்க)*
(Dr. W. Dahanayake)

මා බොහොම සන්තෝෂ වෙනව, ඒක එක්සත් ජාතික පක්ෂයෙ අදහසක් නොවේය කියනව නම්.

**ගරු ඉලංගරත්න**
*(கௌரவ இலங்கரத்ன)*
(The Hon. Ilangaratne)

එතුමා ඒ පකෂයෙ නැද්ද දන් ?

**ජේ. ආර්. ජයවර්ධන මයා.**
*(திரு. ஜே. ஆர். ஜயவர்தன)*
(Mr. J. R. Jayewardene)

සම්පූර්ණ නිදහස තියෙනව පෞදගලික අදහසක් ඉදිරිපත් කරන්න.

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**
*(கலாநிதி டப்ளியு. தகனாயக்க)*
(Dr. W. Dahanayake)

වැදගත් කාරණයක් ඉදිරිපත් කරන්න කැමතියි. මේකයි ඒ කාරණය. පසුගිය මැතිවරණවලදී ඇති වූ වැරදි පුළුවන් තරම් ඉක්මනින් හරි ගස්සන්න ඕනෑ බව මේ ගරු සභාව කල්පනා කරන්න ඕනෑ. 1960 පැවැත්වුණු මැතිවරණයෙදි පෙනී ගිය එක්තරා බරපතළ වැරද්දක් නැවත ඇති නොවීම සඳහා ගතයුතු ක්‍රියා මාර්ගයක් මේ සංශෝධනයට ඇතුළත් වී නැහැ. ඒ නිසා ඒ සම්බන්ධයෙන් අතුරු යෝජනාවක් ඉදිරිපත් කරන්න මා කල්පනා කරනව. මගේ අතුරු යෝජනාව මැතිවරණවලදී ඡන්දදායක කොට්ඨාශවල ඇති වන කන්තෝරු ගැනයි. මැතිවරණ කාලෙට හන්දියක් හන්දියක් ගානේ, වීදියක් වීදියක් ගානේ, කසිප්පු බෙදා දෙන, මුදල් බෙදා දෙන, නොයෙකුත් විධියේ වෙනත් වෙනත් දූෂණ ක්‍රියාවල යෙදෙන මැතිවරණ පොළවල් ආරම්භ කරනව. ඒවට කියන්නෙ මැතිවරණ කන්තෝරු කියලයි. මන්ත්‍රීවරුන්ට මේ ප්‍රශ්නය ඉතාමත් බැරෑරුම් හිස රදයක් වෙනව. මන්ද, එක් මන්ත්‍රීධුරාපෙක්ෂක යෙක් ඒ විධියට කන්තෝරුවක් විවෘත කළාම අනික් මන්ත්‍රීධුරාපේක්ෂකයාටත් එවැනි කන්තෝරුවක් විවෘත නොකර බැරි තත්ත්වයක් ඇති වෙනවා. කන්තෝරුවක්ය කියන්නෙ මොන විධියෙ තැනකටද ? මුලින්ම ගෙයක් බද්දට ගන්නව. ඒ සඳහා විශාල මුදලක් ගෙවන්න සිදු වෙනව. සාමාන්‍ය බද්ද රුපියල් පණහක් නම් මෙවැනි කන්තෝරුවකට ගෙවන්න වෙනව රුපියල් 500ක්, 1,000ක් විතර. ඒ විධියටයි බද්දට ගන්නෙ. හොඳට සැරසිලි එහෙමත් කරව, මේස—පුටු විකකුත් තියල, ඊළඟට කසිප්පු ටික හංගල තියා ගන්න රහස් කාමරයකුත් ගහගෙනයි කන්තෝරුව පටන් ගන්නෙ. තබ්ලා පාටියක් ඇතුව, සරපිනාවක් තියාගෙන, ඉලෙක්ෂන් කරනව කියල, මැතිවරණ වැඩ කටයුතු කරනවය කියල කන්තෝරුවක් හැටියට පෙන්නනව. නියම ඉලෙක්ෂන් කන්තෝරුවක් නම් අපට විරුද්ධ වෙන්න විධියක් නැහැ. විශාල ඡන්දදායක කොට්ඨාශවල ඉන්න ඡන්දදායකයින්ට පැමිණ නොයෙක් කරුණු සාකච්ඡා කර ගැනීම පිණිස කන්තෝරුවක් අවශ්‍යයි. ඒ බව අප පිළිගන්නව. නිසි විධියේ වැඩක් නොකර, කිසිම ප්‍රයෝජනයක් නැති කන්තෝරු වීදියක් වීදියක් ගානේ ඇති වීම මැතිවරණයකදී ඇති වන ලොකුම දූෂණය හැටියට මා කල්පනා කරනව. වෙන විධියකට අල්ලස් ගන්න බැරි වුණාම කන්තෝරුවක් පිහිටුවා අල්ලස් ගන්න පුළුවනි. ඒ නිසා මේ කන්තෝරු ප්‍රශ්නය ගැන මේ ගරු සභාව කල්පනා කරනව නම් බොහොම හොඳය කියා මා කල්පනා කරනව. මා ඉදිරිපත් කරන අතුරු යෝජනාව මෙන්න මෙහෙමයි : ඡන්දදායක කොට්ඨාශයක මැතිවරණ කන්තෝරු දෙකකට වඩා පිහිටුවන්න බැහැ. පක්ෂයකට කන්තෝරු දෙකකට ඉඩ දෙනව. යම්කිසි පක්ෂයක් අනුව කන්තෝරු තිබෙනව නම් එවැනි කන්තෝරුත් දෙකකට ඉඩ දෙනව. ලොකු මැතිවරණ කන්තෝරු දෙකයි.

3

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ඉලංගරත්න**
*(கௌரவ இலங்கரத்ன)*
(The Hon. Ilangaratne)

එතකොට තරුණ පෙරමුණු කාන්තා පෙරමුණු ආදිය ?

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**
*(கலாநிதி டப்ளியு. தகநாயக்க)*
(Dr. W. Dahanayake)

ඒවත් පක්ෂ කන්තෝරු හැටියට සලකන්න ඕනෑ. තරුණ පෙරමුණු පක්ෂයකට අයිති නම් ඒවා පක්ෂ කන්තෝරු වෙනවා.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

ගමක් පාසා තරුණ සමිති කන්තෝරු තිබෙනවා නම් ?

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**
*(கலாநிதி டப்ளியு. தகநாயக்க)*
(Dr. W. Dahanayake)

ඒවත් පක්ෂ කන්තෝරු. අහවල් ගණන යයි ගණන පිළිබඳව තමුන්නාන්සේලා සමග මා තර්ක කරන්නේ නැහැ. එක මදිය, තුනක් ඕනෑය කියතොත්, මා එය පිළිගන්නවා. මා කියන්නේ සීමාවක් නැතිව දූෂණය ඇති වන විධියට කන්තෝරු තබන්න ඉඩ දෙන්න එපාය කියලයි. එකක් මදිනම් 2ක්, 2ක් මදි නම් 3ක්, තුනක් මදිය හතරක් ඕනෑය කියනවා නම්, මා එයටත් එකඟ වෙනවා. අද සීමා රහිතව කන්තෝරු ඉදි වෙනවා. එයට ඉඩ තබන්න එපා.

මේ සංශෝධන පණතින් හොර ඡන්ද වළක්වන්නට විධිවිධාන යොදා තිබෙනවා. මේ සංශෝධන පණත ගැන අපි සතුටු වෙනවා. නමුත් හොර ඡන්ද සම්පූර්ණයෙන්ම වැළැක්වීමට විධිවිධාන සලස්වා නැහැ. සම්පූර්ණයෙන්ම හොර ඡන්ද වැළැක්වීමට එක්තරා වැඩ පිළිවෙලක් ක්‍රියාවේ යෙදවීමට මේ සිරිමාවෝ බණ්ඩාරනායක ආණ්ඩුවට 1960 ජුලි මාසයේ සිට අද වන විට අවුරුදු 4 ක කාලයක් තිබුණා. නමුත් එය ඉටු නොවීම ගැන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුවට දොස් පැවරීමට සිදුවීම ගැන මා කනගාටු වෙනවා. මේ ආණ්ඩුව එවැනි පියවරක් අරගෙන නැහැ. පළමුවැනි බණ්ඩාරනායක ආණ්ඩුව මැතිවරණ නීති සංශෝධනය කිරීම පිණිස 1957 දී විශේෂ කාරක සභාවක් පත් කළා. හොර ඡන්ද වැළැක්වීම පිණිස "අයිඩෙන්ටිටි කාඩ්" නොහොත් තමන්ගේ ඡායාරූපය සහිත කාඩ් පතක් දිය යුතුය කියා ඒ විශේෂ කාරක සභාව යෝජනා කළා. ඒ යෝජනාව අනුව සෑම ඡන්දදායකයකුටම තමාගේ ඡායා රූපය සහිත හැඳින්වීමේ කාඩ් පතක් ආණ්ඩුවෙන් දිය යුතුයි. ඒ යෝජනාව ඊට පෙරත් විශේෂ කාරක සභාවකදී පිළිගෙන තිබුණා. 1957 දී පළමුවැනි බණ්ඩාරනායක ආණ්ඩුව ඒ යෝජනාව පිළිගත්තා. පළමුවැනි බණ්ඩාරනායක ආණ්ඩුව 1959 මැයි මාසයේ 7 වැනිදා "Ceylon Parliamentary Elections (Amendment) Act, No. 11 of 1959". කියා සංශෝධන පණතක් සම්මත කර ගත්තා: ඒ කියන්නේ 1959 අංක 11 දරන පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) පණතයි. මේ පණත සම්මත වුණේ 1959 මැයි 7 වැනි දායි. ඒ පණතේ එක්තරා වගන්තියක් තිබෙනවා. මෙන්න මෙහෙමයි ඒ වගන්තිය තිබෙන්නේ :

"*Issue of official identity cards*

The Commissioner shall, after such date as may be appointed for the purpose of this Section by the Minister of Home Affairs by Order published in the *Government Gazette,* send or cause to be sent an official identity card to each elector whose name appears in any register of electors which is in operation on that date and who complies with the notice given under sub-section (5) of this section."

එක්තරා නියම කරන දිනයකදී තම තමන්ගේ ඡායාරූපය සහ තවත් විස්තර ඇතුළත් ආණ්ඩුව මගින් නිකුත් කරනු ලැබූ කාඩ් පතක් මැතිවරණ කොමසාරිස් විසින් සෑම ඡන්දදායකයකුටම යැවිය යුතුය කියා ඒ වගන්තියේ සඳහන් වී තිබෙනවා. නමුත් එය ක්‍රියාවේ යෙදෙන්නේ ස්වදේශ කටයුතු භාර ඇමතිතුමා ගැසට් නිවේදනයකින් නියම කළ දිනකය කියාත් ඒ වගන්තියේ කියා තිබෙනවා. එතකොට පළමුවැනි බණ්ඩාරනායක ආණ්ඩුව මේ නීතිය හදා රටට

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

දුන්නා. මගේ චෝදනාව මේකයි. හතර අවුරුද්දක් තිබුණා: තමුන්නාන්සේලා මේ නීතිය ක්‍රියාවේ යෙදෙව්වේ නැහැ. ඇයි ?

මෙම ඡායාරූප කාඩ්පත් පිළියෙල කරන්න හතර අවුරුද්දක් මදිද ? එය ක්‍රියාත්මක නොකිරීමෙන් තමුන්නාන් සෙල හොර ඡන්ද ව්‍යාපාරයට ධෛර්‍ය දෙන්නෙ ඇයි කියා මා අහනවා. තමුන් නාන්සෙල දන්නවා, අද අපේ රටට ගලා එන කල්ලතෝනින් ගැන. එම කල්ල තෝනින්ගෙන් වන උවදුර නැති කරන් නත් මෙම කාඩ්පත් ක්‍රමය රුකුලක් වෙනව ඇති. ඒ බව සියලු දෙනාම පිළි ගෙන ඉවරයි. ඒ අනුව බැලුවාම මෙම කාඩ් පත් ක්‍රමය නිසා හොර ඡන්ද ව්‍යාපාරය වලක්වන්න වාගෙම කල්ලතෝනි ව්‍යාපා රය වලක්වන්නත් පුළුවනි. ඒ කියන්නෙ එක වෙඩි පහරින් කුරුල්ලන් දෙන් නෙක් මරන්න පුළුවනි.

ගරු කථානායකතුමනි, මෙම නීතිය පළමුවන බණ්ඩාරනායක ආණ්ඩුව මගින් නීන්දු කර, සම්මත කර ඉවරයි. 1959 මැයි මස 7 වනදා එය සම්මත කර රටට දුන්නා. ඉතින්, හතර පස් අවුරුද්දක් ගත වන තුරු මේ ඉතාම වැදගත් යෝජනාව අනුව ක්‍රියා නොකොට, ඒ ගැන කිසිම සැලකිල් ලක් නැතිව, උදාසීනව, තමුන්නාන්සෙල නිදාගෙන සිටි නිසා මා මෙසේ චෝදනා කරන බව කියන්න ඕනැ. තමුන්නාන් සෙල අද පොරොන්දුවක් දෙනවද, මෙය ක්‍රියාවෙ යොදවන බවට. මෙවැනි වැදගත් මහජන කටයුත්තක් ගැන කල්පනා නොකර තමුන්නාන්සෙල මෙතෙක් කල් සිටිය. නමුත් නොබෝදා තමුන්නාන්සෙලාගෙම ඕනෑකම උඩ ලංකා සමසමාජ පක්ෂයෙ නියෝජිතයන් තමුන්නාන්සෙලගෙ ආණ්ඩු වට එකතු කර ගත්ත. දැන් මේ අළුත් හවුල් ආණ්ඩුවෙ ක්‍රියා පටිපාටිය අනුවවත් මෙම හඳුනාගැනීමේ කාඩ්පත් ක්‍රමය ඉදිරි පත් කරනවද ? මේ ළඟක් වන තුරු, ඒ කියන්නෙ ඊයෙ පෙරේද වන තුරු, ලංකා සමසමාජ පක්ෂයෙ ඉතා වැදගත් ප්‍රති පත්තියක්ව තිබුණු දෙයක් තමයි, හොර ඡන්ද ව්‍යාපාරය සම්පූර්ණයෙන් නැති කිරීම. එම ව්‍යාපාරය නැති කර දමනවා කියා, ලංකා සමසමාජ පක්ෂයෙ නායකයන් දහස් වර පොරොන්දු දී තිබෙනවා. දැන් ඒ ලංකා ,සමසමාජ පක්ෂයෙ නායකයන්ට විශෙෂයෙන් අළුත් මුදල් ඇමතිතුමාට, එම නීතිය ක්‍රියාවෙ යෙදවීමට අවස්ථාවක් ඇවිත් තියෙනවා. මෙම නීතිය ක්‍රියාවෙ යොදවන්න මුදල් අවශ්‍යයි. කාඩ්පත් පිළි යෙල කිරීම සඳහායි, මුදල් අවශ්‍ය වන්නෙ. මා විශ්වාස කරනව ලබන 30 වනදා ඉදිරි පත් කරන්ට යන අයවැය කථාවෙන් වැද ගත් කොටසක් මෙම කාරණය සඳහා වෙන් කරනවා ඇත කියා. මෙම හඳුනා ගැනීමේ කාඩ්පත් පිළියෙල කිරීම සඳහා මෙපමණ මුදලක් වෙන් කර තිබෙනවාය කියා එම කථාවට ඇතුළත් කරාවියයි මා කල්පනා කරනවා. එසේ කර තිබුණොත්, කොපමණ වැරදි තිබුණත්—ඒ කියන්නෙ, එම අය වැය ලේඛනයෙ සියයක් වැරදි තිබුණත්, මෙම කාඩ්පත්වලට මුදල් වෙන් කිරීම නිසාම—මගෙ ඡන්දය මේ අළුත් මුදල් ඇමතිතුමාට දෙනවය කියා මා පොරොන්දු වෙනවා. අය වැය ලේඛන කථාවෙ කොප මණ වැරදි තිබුණත් මෙම එක හොඳ ක්‍රියා වට ගරු කිරීමක් වශයෙන් මගෙ ඡන්දය දෙන්න කැමතියි, තමුන්නාන්සෙලට පක්ෂව. මෙම කාරණය ඉතා වැදගත් නිසයි. මා එසේ කියන්නෙ: මෙම කාරණය කරුණු දෙකක ලා වැදගත් වන නිසා, අනිකුත් සියළු වැරදි අමතක කර මා ආණ් ඩුව පැත්තට මගෙ ඡන්දය දෙන්න කැම තියි, මේ කියන ලොකු හොඳ කාර්යය කර තිබෙනව නම්.

ගරු කථානායකතුමනි, තමුන්නාන්සෙ අපට කීව අපේ කතා සීමා කිරීමට එකඟ වන්නය කියා. අපට බොහොම දිගටත් කතා කරන්න පුළුවනි ; කෙටියෙනුත් කතා කරන්න පුළුවනි. නමුත් අපි ඉල්ලන්නෙ අපේ අදහස් ප්‍රකාශ කිරීමට සහාය දෙන්න කියායි. එම සහාය අපට ලැබෙනව නම්, අපත් හැම වේලෙම ආණ්ඩුවට සහාය දෙන්න ලෑස්තියි, පණත් සම්මත කර ගන්න.

ගරු කථානායකතුමනි, තවත් එක් කාරණයක් ගැන කියන්නට තිබෙනවා. මැතිවරණයකදී, මන්ත්‍රීධුරාපේක්ෂක යන් වශයෙන් පක්ෂයකින් පෙනී සිටින අයගේ තැන්පත් මුදල රුපියල් දෙසිය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය ඩබ්ලිව්. දහනායක]

පණහ දක්වා අඩු කිරීමෙන් මෙම ශංශෝධන පණතින් ඉතාමත්ම හොඳ දෙයක් කර තිබෙනව. රුපියල් දහස වෙනුවට රුපියල් දෙසිය පණහ කිරීම හොඳ දෙයක් පක්ෂයකින් මන්ත්‍රීධුරාපේක්ෂකයන් 30 ක්, 40 ක්, 50 ක් ඉදිරිපත් කරනවා නම් මේ අන්දමේ සංශෝධනයක් කිරීම නිසා ඒ අයට ලොකු පහසුවක් සැලසෙනව. එක පක්ෂයකින්, 40 දෙනෙක්, 50 දෙනෙක් රුපියල් දහස බැගින් කච්චේරියේ මුදල් තැන්පත් කර තබනවාට වඩා ඒ මුදල් වෙනත් අවශ්‍ය වැඩ කටයුතු සඳහා යොදවන්නට පුළුවනි. නමුත් පක්ෂයකට අයත් නැති අය විසින් තැන්පත් කළයුතු මුදල—රුපියල් දහස— අඩු කර නැහැ. එම නිසා මම එයට සංශෝධනයක් ඉදිරිපත් කරනව, පක්ෂයකින් ඉදිරිපත් නොවන අපේක්ෂකයන් සඳහා දැනට තැන්පත් කළයුතු රුපියල් දහස වෙනුවට රුපියල් පන්සියයක මුදලක් තැන්පත් කරන ලෙස වෙනස් කරන්නට ය කියා. ,

ගරු කථානායකතුමනි, තවත් එක් කාරණයක් ගැන මම සංශෝධනයක් ඉදිරිපත් කරන්නට කැමතියි. මම දන්නෙ නැහැ මේ කාරණය ගැන තමුන්නාන්සෙලා මා සමග එකඟ වේවිද කියා. තමුන්නාන්සෙ දන්නවා, අපට සර්වජන ඡන්දය ලැබුණෙ 1931 දී බව. පසුගිය අවුරුදු තිහක කාල පරිච්ඡෙදය තුළ සිදුවීම් ගැන කල්පනා කර බලනවා නම් ලංකාවාසීන් විසින් ඡන්දය හොඳින් පාවිච්චි කර ඇති බව පෙනී යනව. එම නිසා මම කල්පනා කරනව, දැන් තිබෙන ඇතැම් දුර්වලකම් නැති කර දැමීමට, මග හරවා ගැනීමට ඡන්දය දීම අනිවාර්ය—කම්පල්සරි වෝට්ං— කිරීම හොඳ බව. ඡන්ද ලැයිස්තුවේ නමක් තිබෙනවා නම් ගිහින් ඡන්දය දෙන්නම ඕනෑය කියා නියම කරන්න ඕනෑ. එසේ නැතිනම් රාජකාරිය හරිහැටි කරන්නට බැරි වුණු නිසා, එයට හේතුව දක්වෙන නියම අන්දමක සහතිකයක් ඉදිරිපත් කරන්නට ඕනෑ; "අසනීපයෙන් සිටි නිසා ඇඳෙන් නැගිට යන්නට බැරිව සිටියා"යයි ඔප්පු කරන්නට වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කරන්නට ඕනෑ. එහෙම ඉදිරිපත් කරන්නට බැරි නම් තමන්ගෙ යුතුකම් ඉටු නොකිරීම ගැන දඩුවම් කරන්නට ඕනෑ. එම නිසා මම කල්පනා කරනවා ඡන්දය පාවිච්චි කිරීම අනිවාර්ය දෙයක් කිරීම වැදගත් බව. මන්ද? අප සියළු දෙනාම උත්සාහ කරන්නෙ ඉතාම පිරිසිදු අන්දමින් මැතිවරණ පැවැත්වීමටයි. ගරු කථානායකතුමනි, මා විසින් මෙම ගරු සභාවට ඉදිරිපත් කරන ලද මෙම සංශෝධන තුනට තමුන්නාන්සෙල සියළු දෙනාගේම සහාය ලැබෙනවා ඇත කියා බලාපොරොත්තු වෙනව. තවත් නොයෙකුත් කාරණා කියන්නට තිබෙන නමුත් ඒවා කාරක සභා අවස්ථාවේදී පැහැදිලි කිරීමට මම අදහස් කරනව.

**ඩී. ජී. එච්. සිරිසේන මයා.** (අකුරණ පළමුවන මන්ත්‍රී) , ,

*(திரு. டீ. ஜீ. எச். சிரிசேன—அக்குறனை முதலாம் அங்கத்தவர்)*

(Mr. D. G. H. Sirisena—First Akurana)

මේ ගරු සභාවේදී ඡන්දය නොදී මග හරින අයට මොකක් කරන්නටද තමුන්නාන්සෙ කියන්නෙ? ,

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**

*(கலாநிதி டப்ளியு. தகநாயக்க)*

(Dr. W. Dahanayake)

තමුන්නාන්සෙලගෙ ආණ්ඩු පක්ෂයෙ උදවියම නිසා නොයෙක් දේවල් කරගන්නට පුළුවන්. ඡන්දය නොදෙන්නෙ තමුන්නාන්සෙලගෙ අයයි. සමහර අවස්ථාවලදී මෙම සභා ගර්භයෙ සිට, ඡන්දය දෙන අවස්ථාවලදී යන්න යනව. නමුත් විරුද්ධ පාර්ශ්වයෙ සියළු දෙනාම එඩිතරව ඇවිත් ඡන්දය දෙනව. ගරු කථානායකතුමනි, අවසාන වශයෙන් තමුන්නාන්සෙට ස්තුති කරමින් මගේ කථාව අවසන් කරනව. ,

අ. භා. 2.59

**වී. ධර්මලිංගම් මයා.** (උඩුවිල්)

*(திரு. வி. தர்மலிங்கம்—உடுவில்)*

(Mr. V. Dharmalingam—Uduvil)

*கௌரவ சபாநாயகர் அவர்களே! இலங்கைப் பாராளுமன்ற தேர்தல் சட்டத்திருத்த மசோதாவை ஆதரித்துச் சில கருத்துக்களைச்*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

கூறுவதோடு இத்திருத்த மசோதாவிற்கு அனுகூலமாக இரண்டொரு ஆலோசனைகளையும் கூற விரும்புகின்றேன். அரசாங்கம் இத்திருத்த மசோதாவைக் கொண்டுவந்துள்ள தன் நோக்கம் என்னவென்ருல் நாட்டில் நடைபெறக்கூடிய பொதுத்தேர்தல்கள் சச்சரவுகளோ பரபரப்போ எவையுமின்றி நல்ல முறையில் நடைபெற வேண்டும் என்பது தாஞ். தேர்தற் காலங்களில் பரபரப்பேற்படுவதற்கான காரணங்களில் ஒன்று நியமனப் பத்திரங்கள் தாக்கல் செய்யப்பட்ட பின்னர் வாக்களிப்பு நடைபெறும் தினம் அதிக தூரத்தில் இருப்பதேயாகும். இங்கிலாந்து போன்ற நாடுகளில் நியமனப் பத்திரங்கள் தாக்கல் செய்யப்படும் தினத்திற்கும் வாக்களிப்பு நடைபெறும் தினத்திற்கும் இடையிலுள்ள காலம் மிகக் குறுகியதாகும். நியமனப் பத்திரங்கள் தாக்கல் செய்யப்பட்ட இரண்டு மூன்று வார இடைவெளியில் மேல் நாடுகள் பலவற்றில் தேர்தல் நடைபெற்று விடுவதுண்டு. அதைப் போன்ற சில நடவடிக்கைகளை நமது நாட்டிலும் மேற்கொண்டால் பொதுத் தேர்தல்கள் பரபரப்பெதுவுமின்றி நல்ல முறையில் நடக்கக்கூடியதாக இருக்கும். எனவே இதற்கேற்பவும் திருத்தங்களை அரசாங்கம் கொண்டுவர வேண்டும். இரண்டாவதாக கௌரவ காலித் தொகுதிப் பாராளுமன்ற அங்கத்தவர் (கலாநிதி டபிள்யு. தகநாயக்க) அவர்கள் கூறியதுபோல கட்டாய வாக்களிப்பு முறை அவசியமானதாகும். வாக்களிப்பு நடைபெறும் தினங்களில் தனிப்பட்ட வாகனங்களின் உபயோகத்தைத் தடைசெய்யும் திருத்தத்தை நாம் வரவேற்காமல் இருக்க முடியாது. இத்தகைய சில திருத்தங்களினுல் சில சமயங்களில் மக்கள் வாக்களிப்பு நிலையங்களுக்கு வராது இருந்து விடுகிருர்கள். இதை நாம் தவிர்க்கக் கட்டாய வாக்களிப்பு முறை உதவிபுரியும். கட்டாய வாக்களிப்பின் அவசியத்தை விளக்க இரண்டொரு உதாரணங்களைக் கூற விரும்புகிறேன். அனைவருக்கும் விளங்கக்கூடிய விதத்தில் அதை நான் ஆங்கிலத்திலேயே கூறுகிறேன்.

First, by compulsory voting we strengthen the authority of representation; secondly, the parliamentary system as a whole is in a precarious position as long as a great proportion of the electoral body forms an unknown and incalculable factor; thirdly, obligatory voting will favour general political education.

அடுத்ததாகத் தேர்தற் காலங்களில் தனிப்பட்ட வாகனங்களின் உபயோகம் கட்டுப்படுத்தப்படுவதனுல் பொது மக்களுக்குச் சில சங்கடங்கள் இருக்கக்கூடும். எங்களுடைய தொகுதிகளில் கிராமங்கள் சிதறுண்டு கிடக்கின்றன. சில சமயங்களில் எல்லாக் கிராமங்களிலும் வாக்களிப்பு நிலையங்களை வைப்பது முடியாத காரியமாக இருக்கும். இந்த விதமான கஷ்டங்களைப் போக்கும் முகமாக mobile polling booths வசதிகளை அரசாங்கம் ஏற்படுத்த வேண்டும். தேர்தல் சட்டத் திருத்த மசோதாவில் இந்த அம்சங்களையும் அரசாங்கம் தனது கவனத்திற்குக் கொண்டு வரவேண்டும் என்று கேட்டு எனது பேச்சை முடித்துக் கொள்ளுகிறேன்.

**එම්. සිවසිතම්පරම් මයා.** (උඩුප්පිඩ්ඩි)
(திரு. எம். சிவசிதம்பரம்—உடுப்பிட்டி)
(Mr. M. Sivasithamparam—Udupiddi)

Mr. Speaker, while congratulating the Hon. Leader of the House on introducing this Amending Bill which would enable the voters to exercise their right to vote with greater freedom than they have had in this country, I must protest against one of the provisions of the Bill in regard to the language in which the electoral registers should appear. Before I proceed to speak on this matter, I wish to endorse the sentiments expressed by both the hon. Member for Galle and the hon. Member for Uduvil so far as the question of compulsory voting goes in this country. I think that is a very necessary and urgent measure which I hope the Government would introduce in this House very soon.

As far as electoral registers are concerned, prior to 1956 all the electoral registers were in the English language. By an amendment brought in 1956 the principle of the electoral registers appearing in a language other than the English language was introduced for the first time into the Parliamentary Elections Order in Council.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. සිවසිතම්පරම් මයා.]

By the amendments of 1956 there was the conception that was introduced of the language of the majority, the language of the minority and also the English language. It was sought that where the language of the majority of the people of an electoral district was one particular language, then the electoral registers should appear in that language. Further, if there was in that electoral district a section of the people amounting to twenty per cent. of the population which does not speak the language of the majority, then the electoral registers should also be in that language. Besides, of course, the electoral registers in English would also continue till the prescribed date.

Now, that position continued till 1959 when there was a further amendment to this provision whereby it was enjoined that all registers should be in the official language but where the majority of the people are not conversant with that language, then it should be in that language also. That was the position till 1959. I might state that on both the occasions when these amendments were brought, Members of both the Tamil-speaking group as well as the Lanka Sama Samaja Party opposed the innovations relating to the language in which the electoral registers should appear.

Today, we are having a new amendment in the form that where there was reference to the " people " in the original amending Bill, it shall now be changed to " electors ". That is, where the majority of the electors do not speak the official language, then the electoral registers shall be in that language.

Mr. Speaker, at the very outset I wish to state that this question of a right of the voter is not something which he derives from the fact that he belongs to any particular community or political party or speaks any particular language. It is a right which every person in this country has by virtue of the fact that he is a citizen and not for any other reason. Therefore, any legislation dealing with elections should make it possible for the individual voter to exercise that right in the fullest possible manner.

The electoral register, if I may say so, is the most important part of the election machinery. One has to get one's name into the register before one can exercise the vote. Therefore, the question in what language the electoral register should be is not confined to any community or language or any such thing. It is purely and simply to facilitate an individual voter to find out firstly whether his name is in the voters' register and, secondly, if his name is not there, to take certain steps to see that his name is put on the register. The register should, therefore, be in the language in which every voter can see whether his name appears in the register.

You will find that this question of the language in which an electoral register is prepared is not based on any consideration of official language or reasonable use of any other language or any such matter. It is based purely on the right of a citizen who is entitled to be a voter to know that his name is in the register and, if it is not in the register, to take certain steps.

Let us take the case of a candidate. His name must first be in the register before he can become a candidate. Even from that point of view, therefore, every person must be able to know whether or not his or her name is in the electoral register.

Apart from these matters this new principle of introducing the word " electors " instead of the word " people " is going to adversely affect a large number of up-country electorates. There is a very large number of Tamil-speaking people in most of these electoral districts in the up-country, and if you adopt the word " electors ", in view of the operation of the citizenship laws of this country a large section of these people would not have the vote, although they form

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

part of the population of those districts. You will find, therefore, that if you adopt these definitions of majority and minority language in respect of a section of electors, a large number of the up-country electorates where there is a very large population of Tamil-speaking people will not be able to have their electoral registers in both languages. This new innovation, if I may say so, in an otherwise very good Bill will make it possible for the administration not to have the registers in the up-country areas in particular—and even in an electoral district like Beruwela—in the language which the majority of the people can understand. That is why we strongly opposed the substitution of the word " electors " for the word " people " in the earlier Amendment.

I remember, when this matter was discussed in connection with the Local Authorities Elections (Amendment) Act, and when we objected to the introduction of the word " electors ", the hon. Member for Dehiwala-Mt. Lavinia (Dr. Colvin R. de Silva) who was then in the Opposition with us was appealing to us that we should not delay the passing of that Bill on account of this matter, and he said that it could be rectified when the Parliamentary Elections (Amendment) Bill came before the House. For my part I accepted the advice of the hon. Member for Dehiwala-Mt. Lavinia at that stage, and we did not delay the passing of that Bill. But I am surprised that this Bill which is now being introduced after the hon. Member has gone over to the Government side has still the defect which we noticed when the earlier Bill was discussed in this House.

The simplest solution which will be acceptable to all sections is to have all registers of all electoral districts in both languages. That is a very simple solution. Unfortunately in this country we have a population dispersed throughout the length and breadth of the country speaking both languages. One way out of this problem is to have your registers in both languages. It will undoubtedly cost a little more than what it might otherwise do, but what is a few thousand rupees when one deals with the fundamental right of citizens to have their names in the electoral registers in a language which they understand? I would appeal to the Government even at this stage to remove the word " electors " and substitute the words " all registers shall be in both languages." The Government should seriously consider this matter when it is taken up at the Committee stage.

අ. භා. 3.13

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

ගරු කථානායකතුමනි, මෙම සංශෝධන පණතට අපේ කැමැත්ත ප්‍රකාශ කරන අතර, මෙහි ඇති අඩුපාඩුකම් කීපයක් ගැනද සඳහන් කරන්න කැමතියි. මෙය අපි අවුරුදු 4කට පමණ ඉහත සිට ඉදිරිපත් කළ කරුණක්. ගාල්ලේ ගරු මන්ත්‍රීතුමාත් (ආචාර්ය ඩබ්ලිව්. දහනායක) ඒ ගැන කියන්න යෙදුණා. එනම් තමන්ගේ ඡායාරූපයත් සමග හැඳින්වීමේ පත්‍රිකාවක් සෑම ඡන්දදායකයකුටම ලබා දීමයි. ඒ කාරණය මෙයට අඩංගු වී නැහැ. එය තදබල දුර්වලකමක් හැටියට සලකන්න සිදු වී තිබෙනව. මෙම සංශෝධන පණතේ සඳහන් ඇඟිලි සලකුණු දැමීමත් ඉතා වැදගත් එකක්. දැනට මේ ක්‍රමය ඉන්දියාවේ තිබෙනව. ඡන්ද පත්‍රිකාව ඡන්දදායකයාට දෙන්නට කලින් යම්කිසි අමුතු තීන්ත වර්ගයකින් ඇඟිල්ලේ ලකුණක් දානව. නමුත් ඒ ක්‍රමයත් අද දුර්වල තත්ත්වයකට වැටී තිබෙනව. ඒ මොකද? පැය දෙකක් තුනක් යන විට ඒ ලකුණ ඇඟිල්ලෙන් ඉවත් කර ගැනීමට මිනිස්සු දැන් ක්‍රම සොයාගෙන තිබෙනව. ඒ නිසා ඒ උපක්‍රමවලින් තව දුරටත් ආරක්ෂා වීමටයි මා කිව්වේ, හැඳින්වීමේ පත්‍රිකා අවශ්‍යය කියා. ගරු මුදල් ඇමතිතුමා මේ පැත්තෙ සිටිද්දී තදින්ම කියා සිටි කාරණයක් තමයි මේ. එම නිසා ඒ කාරණය මේ පණතට අඩංගු කළ යුතුයි. එසේ අඩංගු කළොත් ඇතැම් අය ගෙන යන හොර ඡන්ද ව්‍යාපාරය මඟ හරවා ගන්නට පුළුවන් වෙනවාට කිසිම සැකක් නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.]

ඒ සමගම මෙහි අඩංගු කර තිබෙන තවත් කාරණයක් නම් ඡන්දාපේක්ෂකයන් ඉදිරිපත් කිරීම සඳහා යම් පක්ෂයක් පිහිටුවා අවුරුදු 5ක් ගත වී තිබිය යුතුය යන්නයි. ඒ කියන්නෙ 1960 දී මැතිවරණයට ඡන්දාපේක්ෂකයන් ඉදිරිපත් කළ පක්ෂ පිළිගන්න බවයි. මෙසේ සීමා කර තැබීම කිසිසේත් යුක්ති යුක්තය කියා අපට පිළිගන්න බැහැ. අපි එදා පක්ෂ වලින් අපේක්ෂකයන් ඉදිරිපත් කෙළේ යම්කිසි ක්‍රියා මාර්ගයක් පිළිගැනීම උඩයි. රටේ ජනතාව පිළිගන්න ක්‍රියා මාර්ග උඩයි පක්ෂ හැඩ ගැසී තිබෙන්නෙ. නමුත් ඇතැම් හදිසි අවස්ථාවලදී ඒ ක්‍රියා මාර්ග උල්ලංඝනය කරමින් පැන දුවනවා නම්, ඉතුරු වන කොටස් වැඩ කරන්නෙ කොහොමද කියන එක ගැනත් කල්පනා කරන්න ඕනෑ. මූලික දේ ක්‍රියා මාර්ගයයි. ප්‍රතිපත්ති අනුව ඒ ක්‍රියාමාර්ගය ඉදිරියට ගෙන යන අවස්ථාවේදී ඇතැම් කරුණු හේතුකොට ගෙන කොටසක් ඒවා කඩා දමා යනවා නම්, ඒ ක්‍රියා මාර්ගය අනුගමනය කරන අනික් කොටස් කොහාටද යන්නෙ කියන එක කල්පනා කරන්න ඕනෑ. දේශපාලන පක්ෂ බිහි වන්නෙ යම් යම් ක්‍රියා මාර්ග උඩයි. විටින් විට ඒ ක්‍රියා මාර්ග උල්ලංඝනය කරන විට ඒ පක්ෂ කැඩී යනව. කැඩුණ කොටස් කොයි ආකාරයටද ගමන් කරන්නෙ කියන එක ගැන කල්පනා කරන්නය කියා මම ඉල්ලන්න කැමතියි. අද තමුන්නාන්සේලා කල්පනා කරනවා ඇති එක් කොටසක් බලවත්ව ඒ ක්‍රියා මාර්ග උල්ලංඝනය කරමින් ආණ්ඩුවට එකතු වුණාය කියා. එතකොට ඉතුරු වන කොටසට මොකක්ද සිද්ධ වන්නෙ, මේ විධියට 1960 ට සීමා කළ විට? අන්න ඒ නිසා මා විශෙෂයෙන් ඉල්ලන්න සතුටුයි, මේ සීමා කිරීම ඉවත් කරන්නය කියා. එසේ නොකළොත්, ප්‍රතිපත්තියට අනුකූලව නියම ක්‍රියා මාර්ගයක් උඩ ජනතාවගේ කැමැත්ත පරිදි ඉදිරියට යාමට ඇතැම් දේශපාලන පක්ෂවලට ඉඩ ලැබෙන්නෙ කොහොමද? අමුතු නමකින් අමුතු පක්ෂයක් වශයෙන් අමුතු සලකුණු ඉල්ලන්න බැහැ තමුන්නාන්සේලාගේ මේ නීතිය උඩ.

නිදර්ශනයක් වශයෙන් බණ්ඩාරනායක උන්නැහේ 1952 දී අත සලකුණ අරගෙන ඉදිරිපත් වුණා. යම් විධියකින් අවුරුදු 5කට සීමා කර මේ විධියේ නීතියක් ද තිබුණා නම් බණ්ඩාරනායක මහත්මයා එන්නෙ කොහොමද? එන්න බැහැ. ඒ නිසා තමන් අතට බලය ආවාය කියා රජයේ ඉඳ ගෙන ඒ විදියේ ආඥාදායක ක්‍රියා කිරීම වැරදියි.

අපි බොහෝ කල් පක්ෂවල සිටි අය. මම ලංකා සමසමාජ පක්ෂයේ අවුරුදු 30 ක් සිටියා. එහි ප්‍රතිපත්ති උල්ලංඝනය කළ බව එදා කී නිසා මා පිට කළා. ප්‍රතිපත්ති උල්ලංඝනය කර රටට යාමට මම කැමති වුනේ නැහැ. ඊට පසුව මහජන එක්සත් පෙරමුණ ආණ්ඩු පක්ෂයෙන් කැඩී ආවාට පසු මම එහි අවුරුදු 4 ක් තිස්සේ වැඩ කළා. නමුත් ඒ පක්ෂයේත් ප්‍රතිපත්ති පදනම් කර ගත් ක්‍රියා මාර්ගය උල්ලංඝනය කර රජයට ඇතුළු වන්නට ලෑස්ති වූ නිසා මම එතැනිනුත් පිට වුණා. (බාධා කිරීමක්.) පිට කළාය කියා මට නම් ලියවිල්ලක් ඇවිත් නැහැ. කෙසේ වුවත් එහි ප්‍රතිපත්ති උල්ලංඝනය කිරීම නිසා එහි තව දුරටත් වැඩ කිරීම අපහසු වුණා. ඒ වාගේ අවස්ථාවලදී මේ වාගේ සීමා දැමීමෙන් කරුණු විසඳන්නේ කොහොමද? එවැනි අය සමහර විට 25 දෙනෙක් පමණ සිටින්න පුළුවනි.

යම්කිසි විදියකින් හෙට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය එක්සත් ජාතික පක්ෂය සමඟ එකතු විය යුතුයයි කැබිනට් මණ්ඩලය තීරණය කළොත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ 25 දෙනෙක් පමණ මේ පැත්තට එන්න පුළුවනි, අධිරාජ්‍යවාදීන් සමඟ එකතු වන්නේ නැත කියා. එවිට ඒ අය ඉදිරියේ ඇති වන මැතිවරණයකදී තමන්ගේ ප්‍රතිපත්ති අනුව කටයුතු කරන්නේ කොහොමද? ජනතාව අනුගමනය කරන ප්‍රතිපත්ති පදනම් කර ගත් ක්‍රියාමාර්ගය දිගටම ගෙනයාමට පුළුවන් විදියට ඔවුන්ට පහසුකම් තිබෙන්න වුවමනායි. ඒ නිසා මේ අවුරුදු සීමා කිරීම වැරදියි. ගණන් සීමා කිරීම වැරදියි. මඩකලපුවේ දෙවන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු මන්ත්‍රීතුමා (මාකන්-මාකර් මයා.) එක්සත් ජාතික පක්ෂයේ මතයක් වශයෙන් එසේ ප්‍රකාශ කළා.

**පාරිස් පෙරේරා මයා.**
*(திரு. பாரிஸ் பெரேரா)*
(Mr. Paris Perera)
නැහැ; නැහැ.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)
එය පක්ෂයේ මතය බව හොඳටම පැහැදිලියි. දකුණු කොළඹ පළමුවන ගරු මන්ත්‍රීතුමාගේ මතයත් ඒකයි.

**ජේ. ආර්. ජයවර්ධන මයා.**
*(திரு. ஜே. ஆர். ஜயவர்தன)*
(Mr. J. R. Jayewardene)
මම මේ වාර්තාව අත්සන් කර තිබෙනවා.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)
මෙය බැරරුම් ප්‍රශ්නයක්. අවුරුදු ගණනටත්, ඉන්න ගණනටත් සීමා කිරීම බරපතළ ප්‍රශ්නයක්. ඒ නිසා ඒ වගන්තිය ඉවත් කිරීම ඉතාම යෝග්‍ය බව මම කියා සිටිනවා. මන්ද? විටින් විට යම් යම් උපාය සොයා පක්ෂ පතිපත්ති පැතත්කට දමන අය සිටින නිසා පක්ෂ ප්‍රතිපත්ති නියම ලෙස ගෙනයාමට ඉඩ ප්‍රස්තා තිබිය යුතු නිසයි. කොටින් කියනවා නම් පක්ෂ සීමා කිරීම වැරදියි. සලකුණු පිළිබඳවත් අවුරුදු 5 ක සීමාව වැරදියි. ඇතැම් පක්ෂයකින් සිය දෙනෙක් ඉදිරිපත් කරනවා නම් ඔවුන්ට සලකුණක් ගැනීමට ඉඩ තිබෙන්න ඕන. මම මේ කෙටුම්පත් පණතට එකඟයි. නමුත් මා කී මේ කරුණු දෙක අඩංගු කරන්නටය කියා මම යෝජනා කරනවා.

අ. භා. 3.23

**ජේ. ආර්. ජයවර්ධන මයා.**
*(திரு. ஜே. ஆர். ஜயவர்தன)*
(Mr. J. R. Jayewardene)
ගරු කථානායකතුමනි, මේ සංශෝධන කෙටුම්පත් පණත ඉදිරිපත් කර ඇත්තේ අපේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තු මැතිවරණ පැවැත්වීම අවශ්‍ය නිසයි. පාර්ලිමේන්තු ආණ්ඩු ව්‍යවස්ථා පණතේ 11 වැනි වගන්තිය යටතේ, මැතිවරණයකට පසු පළමුවැනි සභා රැස්වීමෙන් අවුරුදු පහක් ඉක්ම ගියාට පසු පාර්ලිමේන්තුව ඉබේම අහෝසි වෙනවා. ඊට ප්‍රථම අග්‍රාණ්ඩුකාරතුමාට පුළුවනි පාර්ලිමේන්තුව විසුරුවා හරින්න. එසේ අග්‍රාණ්ඩුකාරතුමා පාර්ලිමේන්තුව විසුරුවා නොහැරියොත් මා පළමුවෙන් කීවා වාගේ, පළමුවැනි රැස්වීමේ සිට අවුරුදු පහක් ගතවුණාම පාර්ලිමේන්තුව ඉබේම අහෝසි වෙනවා. ඒ නිසා අපේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා යටතේ මහා මන්ත්‍රී තරඟ තිබිය යුතුමයි. ඒ විධියට අවුගණනේ අවුරුදු පහකට වතාවක් මහා මන්ත්‍රී තරඟ තිබුණේ නැත්නම් ආණ්ඩුව නැත්නම් කැබිනට් මණ්ඩලය නැත්නම් රට පාලනය කරන පිරිස නීතියට විරුද්ධ පිරිසක් වෙනවා. එවැනි අවස්ථාවකදී ආඥාදායක ආණ්ඩුවක් නැත්නම් Dictatorship එකක් පවතිනවාය කියන්ට පුළුවනි.

යම් රටක ප්‍රජාතන්ත්‍රවාදය පවතින්නේ මහා මන්ත්‍රී තරඟ නැත්නම් ඡන්දය පාවිච්චි කිරීම තිබෙන නිසාය කියා අප කල්පනා කරනවා. ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික පදනම, අත්‍යවශ්‍යම, මහජන ඡන්දය පාවිච්චි කිරීමයි. මහජනයාගේ සර්වජන ඡන්දයෙන් හා වෙන විධියේ ඡන්දවලින් නියෝජිතයන් පාර්ලිමේන්තුවට පත් කිරීම තමයි ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික පදනම. යම් පිරිසක් ඡන්දය පාවිච්චි නොකර රටක් පාලනය කරනවා නම් ඒ පිරිස නැත්නම් ආණ්ඩුව ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවක් නොවෙයි. මහජනයාගේ බලයෙන්, මහජනයාගේ කැමැත්තෙන් නොවෙයි, ඒ ආණ්ඩුව පවතින්නේ. සියලුම ප්‍රජාතන්ත්‍රවාදී නිදහස් පවතින්නේත් ඡන්දය පාවිච්චි කිරීම නිසයි. නිදහසේ කථා කිරීමේ බලය, නිදහසේ රැස්වීම් පැවැත්වීමේ බලය, නිදහසේ ප්‍රවෘත්ති පත්‍ර මුද්‍රණය කිරීමේ බලය, නිදහස් මධ්‍යස්ථ විනිශ්චය මණ්ඩල තිබීමේ බලය, නිදහසේ මේ පාර්ලිමේන්තුව වැනි ආයතනවලට රැස්වී රජය—පාලන මණ්ඩලය—විවේචනය කිරීමට තිබෙන බලය, කොටින්ම කියනවා නම් යම් මනුෂ්‍ය නිදහසක් තිබෙනවා නම් ඒ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජේ. ආර්. ජයවර්ධන මයා.]

නිදහස, ඇති වන්නේ ඡන්ද බලය පාවිච්චි කිරීමෙන් ඒ බලයෙන් පමණක් රටක් පාලනය කරන පිරිස තෝරීම නිසයි.

ගරු කථානායකතුමනි, රටේ අද භයක් තිබෙනව, මේ පාර්ලිමේන්තුව අවුරුදු පහ අවසන් වුණාම මහා මන්ත්‍රී තරඟයක් නොතබා නැවතත් පාලනය අතට අර ගෙන රට පාලනය කරාවිද නැද්ද කියා.

**ගරු ද සොයිසා සිරිවර්ධන**
*(கௌரவ டி சொய்சா சிறிவர்தன)*
(The Hon. de Zoysa Siriwardena)

කව්ද කිව්වෙ ?

**ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා (මුදල් ඇමති)**
*(கௌரவ கலாநிதி என். எம். பெரேரா—நிதி அமைச்சர்)*
(The Hon. Dr. N. M. Perera—Minister of Finance)

This has nothing to do with the Bill, Sir.

**ජේ. ආර්. ජයවර්ධන මයා.**
*(திரு. ஜே. ஆர். ஜயவர்தன)*
(Mr. J. R. Jayewardene)

තව ටිකක් දුරට මගේ කථාව කරන විට, මා ප්‍රකාශ කරන්නෙ මේකට අදාළ වන අදහස් බව පෙනෙයි.

**ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கௌரவ கலாநிதி என். எம். பெரேரா)*
(The Hon. Dr. N. M. Perera)

This is a purely political discussion and has nothing to do with the Bill. —[*Interruption*]. This is a political issue that was raised during the Throne Speech Debate and has nothing to do with this Bill which presumes that there are going to be elections.

**ජේ. ආර්. ජයවර්ධන මයා.**
*(திரு. ஜே. ஆர். ஜயவர்தன)*
(Mr. J. R. Jayewardene)

අන්න ඒකයි, මා දැන් කියන්ට හැදුවෙ.

**ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கௌரவ கலாநிதி என். எம். பெரேரா)*
(The Hon. Dr. N. M. Perera)

Otherwise, what is the purpose of this Bill ?

The hon. First Member for Colombo South surely understands that there is no relevance between that question and this. It is utterly irrelevant, Sir.

**ජේ. ආර්. ජයවර්ධන මයා.**
*(திரு. ஜே. ஆர். ஜயவர்தன)*
(Mr. J. R. Jayewardene)

මා කියන්ට අදහස් කළ වචන මාලාව දැන් මුදල් ඇමතිතුමාගේ කටින්ම ප්‍රකාශ වුණා.

**ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கௌரவ கலாநிதி என். எம். பெரேரா)*
(The Hon. Dr. N. M. Perera)

Why is the hon. Member starting on this doubt ?

**ජේ. ආර්. ජයවර්ධන මයා.**
*(திரு. ஜே. ஆர். ஜயவர்தன)*
(Mr. J. R. Jayewardene)

මා කියන්ට හැදුවෙ, පාර්ලිමේන්තු මැතිවරණ සංශෝධන පනත ගෙන ඒමෙන්, ලබන අවුරුද්දේ මැතිවරණයක් පවත්වන්ට බලාපොරොත්තු වන බව අපට පෙනී යනවාය කියායි.

**ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கௌரவ கலாநிதி என். எம். பெரேரா)*
(The Hon. Dr. N. M. Perera)

ඇයි කවුරුවත් සැකයක් ඇති කළාද ? එයාලම මවල, එයාලම උත්තර දෙනව.

**ජී. ඩබ්ලිව්. සමරසිංහ මයා. (කම්කරු හා නිවාස කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)**
*(திரு. ஜீ. டப்ளியூ. சமரசிங்ஹ—தொழில், வீடமைப்பு அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*
(Mr. G. W. Samarasinghe—Parliamentary Secretary to the Minister of Labour and Housing)

බයක් ඇති කරගෙන.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ජේ. ආර්. ජයවර්ධන මයා.**
*(திரு. ஜே. ஆர். ஜயவர்தன)*
(Mr. J. R. Jayewardene)

දැන් මට කථා කරන්ට අවසර දෙනවද? මැතිවරණයක් පවත්වනවා නම් මෙවැනි නීති අවශ්‍යයි.

**ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கௌரவ கலாநிதி என். எம். பெரேரா)*
(The Hon. Dr. N. M. Perera)

ඒක කියන්න තරම් දෙයක් නොවෙයි.

**ජේ. ආර්. ජයවර්ධන මයා.**
*(திரு. ஜே. ஆர். ஜயவர்தன)*
(Mr. J. R. Jayewardene)

එහෙත්, මෙවැනි නීති තිබුණත් පුළුවන්, මන්ත්‍රී තරඟයක් වළක්වන්න.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

නැවතත් ඒකටයි, ආවෙ.

**ජේ. ආර්. ජයවර්ධන මයා.**
*(திரு. ஜே. ஆர். ஜயவர்தன)*
(Mr. J. R. Jayewardene)

මා බියක් ප්‍රකාශ කරනවා නොවෙයි. මගේ කථාව අහගෙන හිටියොත්, මගේ අදහස හොඳින් පැහැදිලි වෙයි. අපි ඡන්දය පාවිච්චි කරන්ට පටන් ගෙන දැන් අවුරුදු 53ක් වෙනව. 1911 දී තමයි, ලංකාවේ මහ ජනයා තමන්ට ලැබුණු ඡන්ද බලය ප්‍රථම යෙන්ම පාවිච්චි කරන්ට පටන් ගත්තෙ. එවිට, එනම් 1911 දී ඡන්දය පාවිච්චි කළේ ඉංග්‍රීසි භාෂාව උගෙන කේම්බ්‍රිජ් ජූනියර් විභාගයෙන් සමත් වූ පුද්ගලයන් පමණයි. එකල මුළු ලංකාවම එක මන්ත්‍රී කොට්ඨාශ යක් වශයෙන් සලකා එක් මන්ත්‍රීවරයෙකු ව්‍යවස්ථාදායක සභාවට යැව්ව. ඒ අවස්ථා වෙදී ශ්‍රීමත් පොන්නම්බලම් රාමනාදන් මහත්මයා පළමුවෙනි ලාංකික මන්ත්‍රීවරයා හැටියට ව්‍යවස්ථාදායක සභාවේ වාඩි වුණා. උන්නැහේ අප දැනට සිටින මේ ගරු සභා වේත් කීප විටක්ම කථා කර තිබෙනව. ඊට පසු 1920 දිත්, 1924 දිත් ඒ ඡන්දය පාවිච්චි කිරීම ක්‍රමයෙන් පළල් වී 1931 දී අපට සර්වජන ඡන්ද බලය ලැබුණා. එංග ලන්තයේ වැසියන්ට ප්‍රථමයෙන්ම සර්ව ජන ඡන්ද බලය ලැබුණේ 1924 දියි. ස්විට්සර්ලන්තයේ වැසියන්ට තවමත් සර්වජන ඡන්ද බලය ලැබී නැහැ. ඒ රටේ ස්ත්‍රී පක්ෂයට තවම ඡන්ද බලය ලැබී නැහැ. ඒ රටේ තමයි, දැන් අගමැතිනිය සිටින්නෙ. ස්ත්‍රී පක්ෂයටත් ඡන්ද බලය දිය යුතුයයි ඒ රටේ මහජනයාට කෙසේ හෝ අවබෝධ කරවන්ට පුළුවන් නම්, එය ස්විට්සර්ලන්ත ස්ත්‍රී පක්ෂයට බොහොම ප්‍රයෝජනවත් වෙයි. අපේ රට අවුරුදු 53ක් ඡන්ද බලය පාවිච්චි කළ රටක්. මුළු ආසියාවේම ප්‍රථමවරට සර්වජන ඡන්දය පාවිච්චි කළ රට ලංකාවයි. වෙන කිසිම ආසියාතික රටක් සර්වජන ඡන්දය මෙ පමණ කලක් පාවිච්චි කර නැහැ. ඒ අනුව බලන විට සර්වජන ඡන්දයෙන් නිදහස් රටක ප්‍රථමවරට අගමැතිතුමකු හැටියට පත් වුණේ ගරු ඩී. එස්. සේනානායක මහත්ම යායි. නිදහස් පාර්ලිමේන්තුවක ඡන්ද යෙන් තෝරුතුමා අගමැති පදවියට පත් වුණේ ඊට පසුවයි. ඒ නිසා ප්‍රජාතන්ත්‍ර වාදය සම්බන්ධව අපේ රටට ආඩම්බරවන්ට කරුණු කීපයක් තිබෙනව. ආසියාතික රට වලින්, සීමාසහිතව වුණත් ප්‍රථමයෙන් ඡන්දය පාවිච්චි කළේ අපේ රටයි; ප්‍රථම යෙන්ම සර්වජන ඡන්දය පාවිච්චි කළේ අපේ රටයි; ප්‍රථමයෙන්ම මහජනයා විසින් තෝරන ලද අගමැතිවරයෙක් සිටියේ ලංකා වෙයි. ඒ නිසා අපට ප්‍රජාතන්ත්‍රවාදය සම් බන්ධයෙන් නොයෙක් අයුරින් ආඩම්බර වන්ට කරුණු කීපයක් තිබෙනව. ඒ නිසා අප පක්ෂයත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ— දැන් හවුල් ආණ්ඩුවේ—වැඩි දෙනෙකුත්, ළඟදී මැතිවරණයක් තබනවා ඇතැයි බලා පොරොත්තු වෙනව. ඡන්දයෙන් දිනන්නට පුළුවන් වේය කියා දෙපැත්තටම විශ්වාස යක් තියෙනව. ඒ අතර ඡන්දයක් වුවමනා නැත කියා ඇතැම් අය ප්‍රචාරයක් ගෙන යනව. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට බොහොම ලැදිව ක්‍රියා කරන එක්තරා හාමුදුරු නමක්—හේන්පිටගෙදර ඤානසීහ හාමුදුරුවො—ආඥාදායක බලයක් වුවමනාය කියා ප්‍රචාරයක් ගෙන යනව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**විවියන් ගුණවර්ධන මිය. (පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)**

*(திருமதி விவியன் குணவர்தன—உள்ளூராட்சி, உள்நாட்டு விவகார அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mrs. Vivienne Goonewardene—Parliamentary Secretary to the Minister of Local Government and Home Affairs)

පරණ කථාවක් නේ.

**ජේ. ආර්. ජයවර්ධන මයා.**

*(திரு. ஜே. ஆர். ஜயவர்தன)*

(Mr. J. R. Jayewardene)

ඊයෙත් කීව. ඒ විධියෙ ඒකාධිපති ආණ්ඩුවක් ඇති වෙනව නම් මේ සංශෝධන නීති වවුමනා කරන්නෙ නැහැ. මා හිතන විධියට ගරු මුදල් ඇමතිතුමත් එය පිළිගන්නව ඇති. ඒ විධියෙ ඒකාධිපති ආණ්ඩුවක් ඇති වෙනව නම්, මේ පණත අවශ්‍ය නැත කියා ඉරා දමන්න පුළුවනි. සමහර විට ඒ හාමුදුරුවන් දන්නෙ නැතිව ඇති, ආඥාදායක ආණ්ඩුවක් කියන්නේ කුමක්ද කියා. ආඥාදායක ආණ්ඩුවක් තියෙනව නම් ඡන්ද බලයක් වුවමනා කරන්නෙ නැහැ; පාර්ලිමේන්තුවක් වුවමනා කරන්නෙ නැහැ; ඇමතිවරු වුවමනා කරන්නෙ නැහැ. ආඥාදායක ක්‍රමයක් අනුව මුළු රටම පාලනය කිරීමේ බලය එක පුද්ගලයකුට ලැබෙනව.

මේ ගරු සභාවේ සියලුම පක්ෂවලට අයිති අයගෙන් වැඩි දෙනෙක්, මේ රටේ ඡන්දදායකයන්ගෙන් වැඩි දෙනෙක්, ඒකාධිපති ආණ්ඩුවක් කියන්නේ කුමක්ද කියා හරි හැටි දන්නව නම් ඊට විරුද්ධ වෙයි; එවැනි ක්‍රමයක් සුදුසුද කියා ඡන්දයක් විමසුවොත් එයට සම්පූර්ණයෙන්ම විරුද්ධව ඡන්දය දෙයි. එසේ නම්, ඡන්ද විමසීමක් අවශ්‍යය කියා අප ස්ථිර වශයෙන්ම පිළිගෙන තිබෙනව නම්, ඡන්දය පාවිච්චි කරන අවස්ථාවලදී අප ඡන්දදායකයන්ට පුළුවන් සෑම ආධාරයක්ම දෙන්නට ඕනෑ, තමන්ගේ ඡන්දය නිදහසේ පාවිච්චි කිරීමට. කිසිම බලයක් පාවිච්චි කරන්නෙ නැතිව, කිසිම අල්ලසක් දෙන්නෙ නැතිව, කිසිම හිරිහැරයක් කරන්නෙ නැතිව, නිදහස් පුරවැසියන් හැටියට තමන් කැමති අපේක්ෂකයකුට, තමන් කැමති පක්ෂයකට ඡන්දය දීමට අප ඒ අයට ඉඩ සලසන්න ඕනෑ. ක්‍රමක්‍රමයෙන් ඒ ඉඩ, ඒ නිදහස, මේ සභාවේ නීති අනුව ලබා දී තිබෙනව. අවසාන වශයෙන් පත් කරන ලද කාරක සභාවේ අදහස් අනුවයි, මේ සංශෝධන පණත ඉදිරිපත් කර තියෙන්නෙ. මෙවැනි කාරක සභා කීපයකම සභිකයකු හැටියට මා ක්‍රියා කර තිබෙනව. මේ කාරක සභාවෙ සභිකයකු හැටියටත් මම ක්‍රියා කළා. අප උත්සාහ කළේ, ඡන්දදායකයන්ට ඔවුන්ගේ කැමැත්ත ප්‍රකාශ කිරීම පුළුවන් තරම් පහසු කිරීමටයි. පුළුවන් නම් හැතැප්ම දෙක තුන ඇවිදින්නෙ නැතිව, පොහොසත් අයගෙන්, වතු අයිතිකාරයන්ගෙන්, හාම්පුතාලගෙන්, ආණ්ඩුවේ සේවකයන්ගෙන් තර්ජනයක් ලබන්නෙ නැතිව ඡන්දය පාවිච්චි කිරීමට අවස්ථාව දෙන්නයි, මේ සංශෝධන නීති ඉදිරිපත් කර තිබෙන්නෙ.

ගරු කථානායකතුමනි, තවත් අවහිර ඇති. ඡන්දය පාවිච්චි කිරීම අනිවාර්ය වන පිළිවෙළටත් නීති සංශෝධනය කළ යුතුය කියා සමහරු කියනව. ඒ ගැනත් අපේ කාරක සභාව කල්පනා කළා. නමුත් ඒ නීතිය බලපවත්වන රටවල් දෙක තුනක ඒ නීතිය හරියාකාර ක්‍රියාත්මක වන්නෙ නැති බව අපට පෙනුණා. සියයට දහයක් හෝ පහළොවක් ඡන්දය දුන්නෙ නැත්නම් ඒ සියයට දහයට හෝ පහළොවට විරුද්ධව නඩු දමන්නද? අපේ ලංකාවෙ ඡන්දදායකයො 40,00,000 ක් ඉන්නව. එයින් 2,00,000 ක් ඡන්දය දුන්නෙ නැත්නම් ඒ 2,00,000 ට විරුද්ධව නඩු දමන්නද? ලෙඩින් සිටියද, වෙන කාරණාවක් නිසා එන්න බැරි වුණාද, කියා අපි දන්නෙ නැහැ. ඒ නීතිය තියෙන රටවල එය හරියාකාර ක්‍රියාත්මක වන්නෙ නැති නිසා අපි ඒ නීතිය අත්හැර දැම්ම.

ඡන්දදායකයන්ට ඡන්ද පොළවලට එන්න බැරි පළාත්වලට—කැළෑ පළාත්වලට—ඡන්ද පොළවල් රථයෙන් ගෙන යන්න ඕනෑය කියා තවත් යෝජනාවක් ගෙනාව. ඒ විධියට කරන්න පුළුවන් නම් හොඳයි. ආණ්ඩුවට ඒ අදහස ක්‍රියාත්මක කිරීමට ක්‍රම තියෙනවද දන්නෙ නැහැ. අපේ අදහස වී තිබුණේ, ඡන්දදායකයන්ට කරදරයක් නැතිව ඡන්දය පාවිච්චි කිරීමට ඉඩ ලබා දීමයි. ඒ නිසා අපි කල්පනා කළා, දැනට කෙරෙන යම් යම් දේ නතර කිරීම යුතුය කියා. ඒ මොනවාද

Digitized by Noolaham Foundation. noolaham.org | aavanaham.org

කියා මන්ත්‍රීවරුන් දැන ගත යුතුයි. මෝටර් රථයකින් ගොස් ශබ්ද විකාශන යන්ත්‍රයක් පාවිච්චි කිරීම මේ නීතිවලින් තහනම් කරල තියෙනව. ඒක බොහොම හොඳ සංශෝධනයක්. අපේක්ෂකයන් නොවෙයි, ඔවුන් වෙනුවෙන් වෙනත් අය මෝටර් රථවලට නැගී නොයෙක් නොයෙක් පළාත්වල සංචාරය කරනව. අපේක්ෂකයන්ගෙ උදව්කාරයො විරුද්ධකාරයන්ගේ ගෙවල් ළඟට ගොස් නරක නපුරු වචන පාවිච්චි කරමින් කෑ කෝ ගහනව. මැතිවරණයට අදාළ දේ නොවෙයි, පෞද්ගලික තරහ පිරිමසා ගැනීමට නොයෙක් දේ කියනව. ඒ නිසා රැස්වීමක් පවත්වන ස්ථානයක හැර වෙනත් ස්ථානයක මෝටර් රථවලින් ගොස් ශබ්ද විකාශන යන්ත්‍ර පාවිච්චි කිරීම මේ නීතිවලින් තහනම් කරල තියෙනව. එතකොට චිත්‍රපටි පෙන්වීම සහ මැතිවරණයට බාධා වන විධියට මැතිවරණ ශාලාවේදී චිත්‍රපටි පෙන්වීම තහනම් කර තිබෙනවා. ඡන්දය දීම සඳහා පාවිච්චි කරනු ලබන ගොඩනැගිලිවල දේශපාලනාත්මක හැඟීම් ඇති කරන පිංතූර යනාදිය ඇලවීම තහනම් කළ යුතු බව මැතිවරණ නීති පිළිබඳ කාරක සභා වාර්තාවේ 18 වැනි වගන්තියේ සඳහන් වෙනවා. රජයේ චිපත්‍රටි පාවිච්චි කිරීම ගැන අදහස් කීපයක්ද එම වාර්තාවේ 19 වැනි වගන්තියේ සඳහන් වෙනවා. මෝටර් රථයක ශබ්ද විකාශන යන්ත්‍රයක් සවි කරගෙන එය පාවිච්චි කිරීම තහනම් කිරීම ගැනත් එම වාර්තාවේ සඳහන් වෙනවා. තම දේශපාලන පක්ෂයේ පාට හෝ කොඩි හෝ තමන්ගේ ගෙදර පවා ඇලවීම තහනම් කිරීම ගැනත් එම වාර්තාවේ සඳහන් වෙනවා. තම තමන්ගේ දේශපාලන පක්ෂවල පාට පාවිච්චියට ඉඩ දීම සුදුසු බව මඩකලපුවේ දෙවන ගරු මන්ත්‍රීතුමා (ඒ. එච්. මාකන්මාකර් මයා.) විසින් කියන ලද නමුත් එය නුසුදුසු බව අප පිළිගන්නවා. තමන්ගේ ගෙදර වත් තම දේශපාලන පක්ෂයේ පාට හෝ තමන්ගේ ලකුණ හෝ මැතිවරණ සමයක දී පාවිච්චි කිරීම තහනම් කර තිබෙනවා. ඒ වගේම පෞද්ගලික වශයෙන් ඡන්දාපේක්ෂකයන් විසින් ඡන්දදායකයන්ට කාඩ් පත් යවනු ලැබීමද තහනම් කර තිබෙනවා. රජය මගින් කාඩ් පත් යවනවා හැර පෞද්ගලික වශයෙන් ඡන්දදායකයන්ට කාඩ් පත් යවන්නට බැහැ. මැතිවරණය පැවැත්වෙන දිනයේ ඡන්ද පොළවල් ළඟ කාර්යාල සෑදීම තහනම් කර තිබෙනවා. මැතිවරණ සමයේදී දේශපාලන පක්ෂ කාර්යාල නොතිබිය යුතු බව ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා විසින් කියන්නට යෙදුණා. නමුත් එවැනි කාර්යාල තහනම් කළ හැකි දැයි මා දන්නේ නැහැ. මැතිවරණය එන්නටත් පෙර සිටම දේශපාලන පක්ෂ විසින් පවත්වා ගෙන එනු ලබන කාර්යාල තහනම් කරන්නට හැකි දැයි මා දන්නෙ නැහැ. කෙසේ වුවත් මැතිවරණය පැමිණියාට පසුව බිහි වන කාර්යාල, මන්ත්‍රී තරඟ කාර්යාල. නැති කරන්නට පුළුවන් නම් හොඳයි.

මැතිවරණය දිනේදී තමන්ගේ මෝටර් රථයවත් පාවිච්චි කරන්න බැහැ. මේ කාරක සභාව මේ විධියට නීති සකස් කිරීමෙන් ධනපතියන්ට කොතරම් දුරට පහර ගසා තිබෙනවාද ? ඡන්දාපෙක්ෂකයන්ට නම් තමන්ගේ මෝටර් රථයේ නැඟී ඡන්ද පොළවල් කරා යන්න පුළුවනි. නමුත් වෙන කිසිවකුට එහෙම යන්න බැහැ. තමන් සතුව "රෝල්ස් රොයිස්" රථයක් තිබුණත් එම රථයේ නැඟී ඡන්ද පොළ කරා යන්නට සාමාන්‍ය ඡන්දදායකයකුට බැහැ. ඒ අනුව දකුණු කොළඹ කොට්ඨාශයේ මන්ත්‍රීවරයා තෝරීමේ තරඟයේදී අපේ අගමැතිනියටත් ඡන්ද පොළ කරා යන්නට සිදු වන්නේ පයින් මිස වාහනයකින් නොවෙයි. එහෙම නැත්නම් බස් එකකින් යන්නට පුළුවනි. ඇයටවත් පෞද්ගලික මෝටර් රථයක නැඟී යන්න බැහැ. ටැක්සි රථයක යන්නත් බැහැ. රෝගීව සිටින ඡන්දදායකයකු ගැන සලකාබලා ක්‍රියා කිරීමේ අයිතිය ඡන්ද නිලධාරීන්ට භාරයි. රෝගී පුද්ගලයාට පයින් ගමන් කළ නොහැකි බව ඡන්ද නිලධාරියා කල්පනා කරනවා නම් ඒ රෝගියා සඳහා මෝටර් රථයක් පාවිච්චි කිරීමට ඉඩ සලසා දෙන්න ඔහුට පුළුවනි. ඇත්තෙන් ම වෙන කිසිම තරඟයකදී මෙහෙම නීතියක් තිබෙනවා දැයි මා දන්නේ නැහැ. තමන්ගේ මෝටර් රථය පාවිච්චි කිරීමට ඉඩක් නැහැ. අහස් යාත්‍රාවේ, දුම්රියේ, බස් රියේ ගමන් කොට ඡන්ද පොළ කරා යා හැකි වුවත් තමන්ගේ මෝටර් රථයේ යන්නට ඉඩක් නැහැ. ක්‍රම ක්‍රමයෙන්, අප මේ අවුරුදු තිහක කාලයක් තිස්සේ. ව්‍යවස්ථාදායක සභාවේදී, රාජ්‍ය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයවර්ධන මයා.]

මන්ත්‍රන සභාවෙදි, පාර්ලිමේන්තුවෙදි, නොයෙකුත් පක්ෂවලට අයත් නොයෙකුත් ආණ්ඩු විසින් මේ මොහොත දක්වාම උත්සාහ කර තිබ්බෙන්නෙ—ඡන්ද දීමේදී ඡන්දදායක සුළු මනුෂ්‍යයාටත්—කිසිම මුදලක් නැති, ඉඩම් නැති, රථ වාහන නැති සුළු මනුෂ්‍යයාටත්—ඡන්දය පාවිච්චි කරන දිනයේදී ලොකුම මනුෂ්‍යයා සමග එක සමාන තත්ත්වයක් දෙන්නටයි. අද මේ සභාවෙහි ඉදිරිපත් කර ඇති—මෙම ආණ්ඩුව ගෙන ආ—නීතිය හැරෙන්නට, මැතිවරණ සම්බන්ධ වෙනත් ප්‍රගතිශීලි නීතියක් මේ ලෝකයේ කොතැනක වත් නැති බව මට කියන්නට පුළුවනි.

ගරු කථානායකතුමනි, තවත් එක් කාරණයක් ගැන මතක් කරන්නට සතුටුයි. අප බලාපොරොත්තු වෙනවා මහා මැතිවරණය සම්බන්ධ වූ මෙම නීති පළාත් පාලන මැතිවරණවලටත් බලපැවැත්වෙන සේ සකස් කරනවා ඇත කියා. පාර්ලිමේන්තු මැතිවරණයට පමණක් මේ නීති ක්‍රියාවේ යෙදවීම ප්‍රමාණවත් මදි. පළාත් පාලන මැතිවරණවලටත් බලපැවැත්වෙන අන්දමින් ඉක්මනින් කටයුතු කිරීම වැදගත්. එම නිසා මම හිතන්නෙ පළාත් පාලන ආයතන සම්බන්ධයෙනුත් මෙබඳු නීති ගෙන ඒමට සභානායකතුමා කල්පනා කරනවා ඇති. නමුත් ගරු කථානායකතුමනි. මම පුදුම වෙනවා, ඡන්දය වුවමනා නැතැයි කියන මනුෂ්‍යයන් අදත් මේ රටේ සිටීම ගැන. ඒ අය අපේ පක්ෂයේ නම් නොවෙයි, නමුත් නාන් සෙලාගෙ පක්ෂයේ වෙන්න පුළුවනි, ඉන්නෙ.

**පී. ආර්. රත්නායක මයා.**

*(திரு. பீ. ஆர். ரத்நாயக்க)*

(Mr. P. R. Ratnayake)

ඉස්සර ඔය පැත්තෙ හිටිය.

**ජේ. ආර්. ජයවර්ධන මයා.**

*(திரு. ஜே. ஆர். ஜயவர்தன)*

(Mr. J. R. Jayewardene)

ආඥාදායක බලය යොදන්නට ඕනැ වෙලා; එක පුද්ගලයකුට රට පාලනය කරන්නට ඕනැ වෙලා. එක පක්ෂයකට වත් නොවෙයි, එක පුද්ගලයකුට. (බාධා කිරීමක්) ඔව්, හේන්පිටගෙදර ඥානසීහට ඕනැ වෙලා තියෙනව.

ගරු කථානායකතුමනි, 40ස් ලක්ෂයකට මෙවැනි නීති අනුව තමන්ගේ පළාත් පාලනය කරන ගම් සභාවලට, නගර සභාවලට සුළු නගර සභාවලට, රට පාලනය කරන පාර්ලිමේන්තුවට, මන්ත්‍රීවරුන් වශයෙන්, ඇමතිවරුන් වශයෙන් අගමැති වශයෙන්, පක්ෂ නායකයන් වශයෙන්, විරුද්ධ පාර්ශ්වයේ නායකයා වශයෙන්, පත් කරන්නට සුළුම මනුෂ්‍යයාට වුණත් මෙපණ නිදහසක් තිබෙන රටක, මුළු ආසියාවේම පමණක් නොවෙයි මුළු ලෝකයේ ම නිදහස් රටවලින් වඩාත්ම නිදහසක් තිබෙන රටක, ඡන්ද බලය වුවමනා කරන්නෙ නැත, ආඥාදායක බලය යටතට රට පත්කරන්ට ඕනෑය කියන පුද්ගලයන් සිටිනවා නම්, ඒ පුද්ගලයන් දමන්න ඕනැ කරන්නෙ හිර ගෙවලයි. නමුන්නාන්සෙලාගෙ පක්ෂවල නායකයන් හෝ වේවා, එවැනි පුද්ගලයන් හිරකර තැබීම නමුන්නාන්සෙලාගේ වැදගත් යුතුකමක්. මේ වාගේ ප්‍රජාතන්ත්‍රවාදී රටක එවැනි පුද්ගලයන්ට නියම ස්ථානය කොතැනද කියා පෙන්වා දෙන්නට ඕනැ. මේක මගේ ප්‍රයෝජනයට හෝ මගේ පක්ෂයේ ප්‍රයෝජනයට හෝ නොවෙයි කියන්නෙ, එහෙම නැතිනම් නමුන්නාන්සෙලාගේ පක්ෂයේ ප්‍රයෝජනයටත් නොවෙයි කියන්නෙ, මේ රටේ සිටින ඡන්දදායකයන්ගේ ප්‍රයෝජනය පිණිසයි කියන්නෙ. මැතිවරණය කල් දැමිය යුතුය කියන, මැතිවරණයක් ඕනැ නැහැයි කියන උදවිය, ආඥාදායක බලය වුවමනාය කියන උදවිය, දැනට කූඩුවේ ඉන්න විසි එක් දෙනා අතරට මේ පුද්ගලයන්ද දමනවා නම් ඒ ගැන නමුන්නාන්සේට ප්‍රශංසා කරනවාය කියමින් මගේ කථාව අවසන් කරනව.

අ. භා. 3.47

**කේ. එම්. පී. රාජරත්න මයා.**

*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*

(Mr. K. M. P. Rajaratna)

ගරු කථානායකතුමනි, මැතිවරණ සංශෝධන පණත සම්බන්ධයෙන් මගේ අදහස් සභාවට ඉදිරිපත් කිරීමට කැමතියි. අද දින මෙම ගරු සභාවට ඉදිරිපත් කර තිබෙනවා, මැතිවරණ සංශෝධන පණතක් මෙම සංශෝධන, ගරු සභාවේ හැම පක්ෂයකම නියෝජිතයන්ගෙන් සමන්විත කාරක සභාවට ඉදිරිපත් කරනලද අදහස්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කාරක සභාවේ අදහස් සම්පිණ්ඩනය කර තමයි, අද දින ඉදිරිපත් කර තිබෙන්නෙ. මෙම සංශෝධන අනුව මින් ඉදිරියට පැවැත්වෙන මැතිවරණ ඉතා පිරිසිදු තත්වයකින් පැවැත්වෙනවා ඇත කියා මම කල්පනාකරනව.

මුදල් නැති දුප්පත්, ධනහීන, පිරිසටත් මැතිවරණයට මුහුණ පාන්නට ලොකු පහසුකමක් ඉදිරිපත් කර තිබෙන සංශෝධිත කෙටුම්පත් පණතින් ඇති වන බව පළමුවෙන්ම සඳහන් කරන්නට කැමතියි. මේ සමගම මැතිවරණ කොමසාරිස්වරයාගේ දැනගැනීම පිණිසත්, තමුන්නාන්සෙගෙ දැනගැනීම පිණිසත්, කරුණක් දෙකක් මේ අවස්ථාවේදී මතක් කරන්නට සතුටුයි. මුලින්ම මා ඉදිරිපත් කළ රීති ප්‍රශ්නයට ඔබතුමා දුන් තීන්දුව සම්පූර්ණයෙන් පිළිගන්නව. එහෙත් ඔබතුමා මා කෙරේ සමාධිය භජනය කරනු ඇතැයි අපේක්ෂා කරමින් එක් කරුණක් පමණක් සඳහන් කරන්න කැමතියි. පක්ෂ නායකසින්ගෙ රැස්වීමකදී එබඳු තීරණයක් ගත් බව ඔබතුමා කිව්වා. එහෙත් එවැනි තීරණයක් ගැන මා මීට පෙර දැනගෙන හිටියෙ නැහැ. සමහර විට මා නොපැමිණි රැස්වීමකදී එවැනි තීරණයක් ගන්න ඇති එපමණයි ඒ ගැන මට කියන්න තියෙන්නෙ. එවැනි තීරණයක් ඇති කර ගත් පක්ෂ නායකයින්ගෙ රැස්වීමක මා හිටියෙ නැතුවා වෙන්න පුළුවනි. යම් විධියකින් එවැනි තීරණයක් ගැනීම සම්බන්ධයෙන් සාකච්ඡාවක් පැවති අවස්ථාවක මාත් හිටියා නම් නොවරදවාම මගේ මතය එතැනදී ඉදිරිපත් කරන බව පමණයි කියන්නෙ. මා ඒ රීති ප්‍රශ්නය මතු කළේ මෙන්න මේ කාරණය නිසයි. අපේ රටේ තිබෙන්නෙ පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක්. පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයට අප ගරු කරනව. ඒ ක්‍රමය සඳහටම තබා ගන්න අපට වුවමනාවක් තිබෙනව නම්, එසේම පිරිසිදු මැතිවරණයක් පවත්වන්න අපට වුවමනා නම්, ධනපතියට පමණක් සීමා වී තිබෙන වරප්‍රසාද දුප්පතාටත් වැඩ කරන සාමාන්‍ය ජනතාවටත් ලබා දෙන්න අපට වුවමනා නම්, ඒ වගේම තමන්ගේ මන්ත්‍රීවරුන් තෝරා ගෙන, තමන්ගෙ අයිතිවාසිකම් ලබා දෙන තමන්ට පහසුව ලබා දෙන තමන්ගෙ ප්‍රශ්න මනාව විසඳන ආණ්ඩුවක් ඇති කිරීDigitized by Noolaham Foundation. noolaham.org | aavanaham.orgගන් වුවමනා නම්, ඒ සඳහා ඉතාමත් වැදගත් වනනෙ මැතිවරණ නීතියයි. මැතිවරණ නීතිය අනුව මහජනතාවට තමන්ගෙ අදහස්වලට අනුකූලව ආණ්ඩුවක් ඇති කිරීම පිළිබඳව හිමි විය යුතු මූලික අයිතිවාසිකම් ක්‍රියාවට පත් කිරීමට බලය පවරා දෙන්නේ යම් සේ ද, ඒ අනුව මැතිවරණ නීතිය වැදගත් තැනක් ගන්නව. ඒ නිසාම මැතිවරණ නීතිය අපේ රටේ නීති පද්ධතියෙ තිබෙන ඉතාමත් වැදගත් නීතිය හැටියට අප සලකනව. අපේ නීති පද්ධතියේ ඉතාමත් වැදගත් කොටස මැතිවරණ නීතිය හැටියට ඔබතුමත් සලකනව ඇත කියා මාහිතනව. එහෙම නම් අපේ නීති පද්ධතියෙ ඉතාමත් වැදගත් කොටස මැතිවරණ නීතිය හැටියට අපත් සලකනව. ඒ සැලකීම උඩයි අප ක්‍රියා කරන්නෙ. හැමදෙනාටම පොදුවෙ සාධාරණ අන්දමටයි එය ක්‍රියාත්මක විය යුතු වන්නෙ. බලවතාට පමණක් සීමා වී තිබුණු බලය, මැතිවරණ සම්බන්ධයෙන් මෙතෙක් කල් ඒ ආකාරයට සීමා වී තිබුණු බලය, කඩා බිඳ දමා දුප්පතාටත් සාමන්‍ය ජනතාවටත් එයින් නියම ප්‍රයෝජනය ලබ ගන්නට අවස්ථාව ලබා දෙනොත් එය ඉතා වැදගත් දෙයක් බව සලගන්න ඕනැ. කොහොමද ඒ නීතියෙන් නියම ප්‍රයෝජනය ගන්නෙ ? නියම ප්‍රයෝජනය ගන්න නම් ඒ නීතිය මේ රටේ සාමාන්‍ය ජනතාව දැනගත යුතුයි. සාමාන්‍ය ජනතාවට තෙරෙන්නෙ නැත් නම් අප මෙතැන ඉතාමත් උනන්දු වී නීති හැදුවට වැඩක් නැහැ.

මගේ තර්කය මෙයයි. අද තිබෙන මැතිවරණ නීතිය මේ රටේ සාමාන්‍ය ජනතාවට තේරෙන්නේ නැහැ. ඇයි තේරෙන්නෙ නැත්තෙ? සාමාන්‍ය ජනතාවට තේරෙන භාෂාවෙන් නොවෙයි මැතිවරණ නීතිය තියෙන්නෙ. මැතිවරණ නීතිය තියෙන්නෙ ඉංග්‍රීසියෙන්. කවුද ආණ්ඩුව පත් කරන්නෙ ? ආණ්ඩුවක් පත් කරන්න ඡන්දය දෙන්නෙත්, ආණ්ඩුවක් පිහිටුවන්නෙත් ඉංග්‍රීසි භාෂාව නොදන්න සියේට අනූවක් පමණ වූ සාමාන්‍ය පොදු මහජනතාවයි. ඉංග්‍රීසි භාෂාව දන්නෙ මේ රටේ මුළු ජනගහනයෙන් සියේට හයක් පමණ වූ සුළු පිරිසක් පමණයි. එතකොට මෙතෙක් කල් අත්‍යවශ්‍ය කාරණයක්ව තිබුණු මැතිවරණ නීතිය සිංහල භාෂාවට පරිවර්තනය කිරීම පමා වුණා. ඒ ප්‍රමාද

[කේ. එම්. පී. රාජරත්න මයා.]

දේශීය බරපතළ එකක්. අදත් අපි නීති හදන්නෙ සිංහලෙන් නොවෙයි. අදත් නීති හදන්නෙ ඉංග්‍රීසියෙන්. නීතිය කෙටුම්පත් කළාට පස්සෙ මේ ගරු සභාවට ඉදිරිපත් කරන්නෙ සිංහලෙන් නොවෙයි. දෙවැනි වර කියවා අවසන් වී කාරක සභා අවස්ථාවත් අවසන් කර තුන්වැනි වර කියවා අවසන් වුණාම සෙනෙට් මන්ත්‍රි මණ්ඩලයට යවන්නෙත් එතැන විවාදය අවසන් කර අග්‍රාණ්ඩුකාරතුමා අත්සන් කර අනුඥාව දී නීතියක් හැටියට පත් කරන්නෙත් සිංහලෙන් නොවෙයි, ඉංග්‍රීසි භාෂාවෙනුයි. එතකොට අප මොන තරම් පහසුකම් දුන්නත් ඉදිරිපත් කරන කරුණු මොන තරම් වැදගත් ඒවා වුණත්, ප්‍රගතිශීලි ඒවා වුණත්, සාමාන්‍ය ජනතාවට හෙවත් දුප්පත් ජනයාට සෙත සලසන්නක් වුණත්, එයින් නියම ප්‍රයෝජනය ගන්න බැහැ සාමාන්‍ය ජනතාවට. තේරෙන්නෙ නැතුව කොහොමද නියම ප්‍රයෝජනය ලබා ගන්නෙ? මේ ගැන මා විශේෂයෙන්ම සඳහන් කරන්නෙ මෙන්න මේ කාරණය නිසයි. අපේ අත්දැකීම් අනුව නොයෙක් අවස්ථාවල අහිංසක ජනයා නීතිය පිළිබඳ නොදැනුවත්කම නිසා වැරදි කරන බව පෙනී ගොස් තිබෙනවා. සිංහලෙන් තිබෙන නීතියක් නම් සිංහල දන්න අයට තේරුම් ගන්න පුළුවනි. ඉංග්‍රීසියෙන් තිබෙන දේ තේරුම් ගන්න බැහැ. තවත් කාරණයක් තියෙනවා. ඉංග්‍රීසියෙන් නීතිය තිබෙන නිසා තවත් කෙනෙකුගෙන්—ඉංග්‍රීසි දන්න කෙනෙකුගෙන්—අහලා තමයි තේරුම් ගන්න වෙන්නෙ. ඉංග්‍රීසි දන්න කෙනෙකු විස්තර කර දෙන ආකාරයටයි තේරුම් ගන්න වෙලා තියෙන්නෙ. එහෙම අවස්ථාවල නොයෙකුත් දේවල් කරන්න සිදු වෙනවා. ඒ මගින් පොලිසියෙනුත්, වෙනත් ආයතනයන්ගෙනුත් පමුණුවනු ලබන කරදර වලට සහ හිරිහැරවලට අනේක අප්‍රමාණ වාරයක් මුහුණ පාන්න සිද්ධවෙලා තියෙනවා. ඒ නිසා ප්‍රථමයෙන්ම ඉල්ලීමක් කරන්න කැමතියි. මේ නීතිය සම්මත වුණාට පසුව, මූලික අවශ්‍යතාවලින් ඉතාමත්ම සුළු එකක් හැටියට, මේ නීතිය සිංහලයට පරිවර්තනය කරන්නය කියා මා ඉල්ලනවා. මේ රටේ පිරිසිදු මැතිවරණයක් ඇති කිරීම පිණිස, ආණ්ඩුවක් පත් කිරීමේ, මන්ත්‍රිවරුන් තේරීමේ, වරප්‍රසාදය මහජනතාවට ලබා දීම පිණිස, එය නියමාකාරයෙන් ක්‍රියාවේ යෙදවීම පිණිස, මූලික දේවලින් සුළු එකක් හැටියට, මේ නීතිය සිංහලයට හරවන්න ඕනෑ. ඉංග්‍රීසි නොදන්නා, සිංහල පමණක් දන්නා ඕනෑම ඡන්දදායකයකුට ආණ්ඩුවේ ප්‍රකාශන අංශයෙන් මේ නීතිය අරගෙන, තවත් කෙනෙකුගෙන් අහන්නේ නැතිව, එය තේරුම් ගන්න අවස්ථාව තිබෙන්න ඕනෑ. මේ නීතිය මොකක්ද? මැතිවරණයක් සකස් කිරීමේ නීති, කරුණු, යනාදිය මොන වාද කියන එක දැනගන්නට අවස්ථාව තිබෙන්න ඕනෑ. එම නිසා මා සභානායකතුමාගෙනුත්, මැතිවරණ කොමසාරිස්තුමාගෙනුත් මේ ඉල්ලීම කරනවා. මැතිවරණ කොමසාරිස්තුමාට මෙය අයිති නැති වුණත් ඔහුගේ සැලකිල්ලත් යොමු කරනවා. මෙය ආණ්ඩුවට අයිති කාර්යයක්. මෙය කරන්න ඕනෑ ආණ්ඩුවයි. මේ රටේ නීති මෙපමණ කලක් සිංහලයට පරිවර්තනය කර නොතිබීම මේ ආණ්ඩුව කර තිබෙන ලොකුම වරදක්, ලොකුම අපරාධයක්. මහජනයාට කර තිබෙන ලොකුම ද්‍රෝහිකමක්. ඒ නිසා ප්‍රමාද වුණත්, දැන්වත් වැඩි දවසක් යන්නට පෙර මේ කර්තව්‍යය ඉටු කරන්නට ඕනෑ. මෙය ඉක්මනින්ම ඉටු කළ යුතු දෙයක්. එම නිසා මේ කාර්යය ඉක්මනින්ම ඉටු කරන හැටියට ඉල්ලනවා.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

Order, please! The Sitting is suspended till 4.30 p.m. On resumption the hon. Deputy Chairman of Committees will take the Chair.

**රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්සිටුවන ලදින් අ.භා. 4.30 ට කාරක සභා නියෝජ්‍ය සභාපති තැන්පත් අයි. ඒ. කාදර් මහතාගේ සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.**

**මන්ත්‍රි මණ්ඩලය ගණන් කොට ගණපූරණයක් නොමැති බව පෙනී ගියෙන්, බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදී.**

**පසුව ගණපූරණයක් තුබූයෙන්—**

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට ප්‍රථම යෙන් කථා කළ ගරු මන්ත්‍රීවරුන් වැදගත් යෝජනා කීපයක් ඉදිපත් කළා, මේ මේ කරුණු සංශෝධනයට ඇතුළත් කළ යුතුයි කියා. විශේෂයෙන්ම ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය ඩබ්ලිව්. දහනායක) මැතිවරණ කාර්යාල ගැන ඉදිරිපත් කළ යෝජනාව ගැන සඳහන් කරන්න මා කැමතියි.

දැන් තිබෙන සංශෝධන අනුව මැතිවරණ කාර්යාල පවත්වන්නට බැරි ඡන්දය පවත්වන දිනයේදීයි. එදාට, ගෙදර හැර වෙන තැනක කාර්යාලයක් පවත්වන්නට බැහැ. නමුත් ඡන්දය ආරම්භ කළ දින සිට, ඒ කියන්නේ නාම යෝජනා පත්‍ර බාර දුන් දින සිට මැතිවරණ යට කලින් දින් දක්වා ඡන්ද කොට්ඨාශයේ ඕනෑම තැනක කාර්යාල ඇති ක්රන්නට දැනට පුළුවන්. මෙය නොයෙක් කරදරවලට, අල්ලස්වලට, මැරවරකම් වලට, දූෂණවලට හේතුවන කාරණයක්. අවුරුදු ගණනාවක් තිස්සේ අපේ ජනතාව ඡන්දය දීම ගැන හොඳ අවබෝධයක් ලබා ගෙන තිබෙනවා. ඒ නිසා මේ රටේ ජනතාවට තවත් අමුතු ආටෝපයක් ඕනෑ නැහැ. තමන්ට වවමනා පක්ෂය, තමන්ට වවමනා මන්ත්‍රීවරයා, තෝරා ගැනීම පිණිස මේ ඡන්ද ගංඩු අමුතු ආටෝප මේ රටේ ජනතාවට ඕනෑ නැහැ. අද ඡන්දයෙන් තේරී එන මන්තීවරුන්ටත් වඩා, කමන ආකාරයට තම ඡන්දය පාවිච්චි කළ යතද කියන එක මේ රටේ මහජනතාව දන්නවා. මදල් වියදම් කරන්න ඕනෑ නැහැ; බලය යොදන්න ඕනෑ නැහැ. බෝම්බ ගහන්න ඕනෑ නැහැ; අල්ලස් ඕනෑ නැහැ; දූෂණ ඕනෑ නැහැ. අපේ රටේ ජනතාව හොඳ අවබෝධයක් ඇති බද්ධිමත් කොටසක්. ඡන්දය දෙන්න ඕනෑ කොහොමද කියා ඔවුන් දන්නවා. ඡන්දයට ඉදිරිපත් වන්නෙ කවද, එහිදී මුහුණ පාන්න වන ප්‍රශ්න මොනවාද, තමන්ගෙ විසඳම කුමක්ද යනාදි කරුණු ජනතාව හොඳටම දන්නව. කලින් තිබුණු පක්ෂ කායභිාල හැම එකකටම කුමක්ද වෙන්නේ කියන ප්‍රශ්නය දකුණු කොළඹ පළමුවන ගරු

මන්ත්‍රීතුමා (ජේ. ආර්. ජයවර්ධන මයා.) ඇසුව. ගාල්ලෙ ගරු මන්ත්‍රීතුමාගෙ (ආචායභී ඩබ්ලිව්. දහනායක) අදහස පිළිගන්නව නම් මෙම කාරණයෙහිදී කිසි ප්‍රශ්නයක් ඇති වන්නෙ නැහැ. මැතිවරණ කාල සීමාව තුළදි මොනම කායභිාලයක් වුණත් එය අපි වසා දමමු. සමහරවිට එම කායභිාලය අපි දිනපතා වැඩකරන පක්ෂ කායභිාලය වෙන්න පුළුවනි. එම කායභිාලය වුණත් අපි වසා දමමු. මොනම පක්ෂයකට වුණත්, වෙනත් දිනවලදි වැඩ කටයුතු කරන තම පක්ෂ කායභිාලය වසා දමන්න පුළුවනි. එවැන්නක් විවෘත කර තිබුණොත්, එදාට එයත් මැතිවරණ කායභිාලයක් හැටියට එබේම පරිවර්තනය වෙනව. මෙම අතුරු සංශෝධනයෙන් බලාපොරොත්තු වන්නෙ බලපෑම්වලින් තොර පිරිසිදු මැතිවරණයක් ඇති කිරීමයි. මේ ක්‍රමය නිසා කාටවත් හිරිහැර නොවන විධියට, තමන් කැමති මන්ත්‍රීවරයාට පක්ෂව ඡන්දය දෙන්න පුළුවන් වන විධියට, බලපෑම්වලින් තොර මැතිවරණ යක් පවත්වන්න පුළුවන්කම ලැබෙනව. එම නිසා ගාල්ලෙ ගරු මන්ත්‍රීතුමාගෙ යෝජනාව ඉතා වැදගත්වූත්, අවශ්‍යවූත් එකක් බව මා කියන්නෙ අත්දැකීම් අනුවයි. දැන්, මැතිවරණ කායභිාලවල සීමාවක් නැහැ. ගමක් ගමක් ගානෙත්, වීදියක් වීදියක් ගානෙත් සල්ලි තියෙන පක්ෂ මගින් මැතිවරණ කායභිාල ඇති කරනව. එම නිසා සල්ලි නැති පක්ෂවලට නොයෙකුත් හිරිහැරවලට මුහුණ පාන්න සිදු වෙනව. එයින් නොයෙකුත් දේ පැන නගිනව. මුදල් නැති අය තමන්ට මහජන කැමැත්ත තිබුණත්, සල්ලි තියෙන අය කායභිාල දමන නිසා, ණයට හරි මුදල් සොයාගෙන මොන විධියකින් හෝ කායභිාලයක් තබා ගන්නව. නමුත් වැඩක් නැහැ. මා කියන්නෙ මෙවැනි සිද්ධින් හැම තැනම සිදු වෙනවාය කියා නොවෙයි. මා නම් කවදාවත් එවැනි කායභිාලයක් පිහිටුවා ගත්තෙ නැහැ. මා ඉදිරිපත් වුණු එකම මැතිවරණයකටවත් එවැනි කායභිාල යක් පිහිටුවා ගන්න මට වුවමනා වුණේ නැහැ. ඒව නොවෙයි අපට වුවමනා කරන්නෙ; මහජන හිතයි අපට වුවමනා කරන්නෙ. අපට වුවමනා කරන්නෙ. මහජනයා අපේ ප්‍රතිපත්ති පිළිගන්න

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කේ. එම්. පී. රාජරත්න මයා.]

තත්ත්වයට පත් වීමයි. එම නිසා මා ඉල්ලා සිටිනව ගාල්ලෙ ගරු මන්ත්‍රීතුමාගෙ යෝජනාව පිළිගන්නා ලෙස. මේ හොඳ අදහසකින් හැදූ නීතිය, බලපෑමෙන් තොරව මැතිවරණ පැවැත්වීමට ඇති කළ නීතිය, තව දුරටත් සර්ව සම්පූර්ණ කර ගැනීමට ගාල්ලෙ ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ අතුරු යෝජනාවක් කාරක සභා අවස්ථාවෙදි මෙම මැතිවරණ සංශෝධන කෙටුම්පත් පණතට ඇතුළත් කරවා ගැනීමට උදව් දෙන ලෙස මා දකුණු කොළඹ පළමුවන ගරු මන්ත්‍රීතුමාගෙ පක්ෂයෙනුත් ඉල්ලා සිටිනව. මා, මගෙ කථාව කරගෙන යන්නෙ ඉංග්‍රීසි කෙටුම්පත අනුවයි. ඊට හේතුව, සිංහල කෙටුම්පත වැඩක් නැති එකක් වී තිබෙන නිසයි. මේ සිංහල එක, නීතියෙන් බලපෑමක් තියෙන එකක් නොවෙයි. කතානායකතුමාගෙ නියෝගය අනුව ඒ බව පේනව. මුල් කෙටුම් පත් පණතෙ 22—ඒ වගන්තිය අළුත් එකේ 14 වන වගන්තියෙන් සංශෝධනය කර තිබෙනව. ඉංග්‍රීසි කෙටුම්පත් පණතෙ 17 වන පිටුවෙ 14 වන වගන්තියෙ 'බී" කොටසෙ සඳහන් වන කොටසක් දැන් මා කියවනව:

"Until the prescribed date, the register of electors for each electoral district and the lists prepared for the purpose of revising such register shall be in the English language."

නියමිත දිනය එන තුරු මැතිවරණ කාර්‍යාලයෙ තියෙන මැතිවරණ ලේඛන ඉංග්‍රීසි භාෂාවෙන් තබා ගත යුතු බවයි, ඒ අනුව පෙනෙන්නෙ. මෙය අංක 33 දරණ රාජ්‍ය භාෂා පණතට සම්පූර්ණයෙන්ම පටහැණියි. ඒ මන්ද? දැනට 6 මාසෙකට ඉඩදී ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කරමින් සම්මත කළා. මැතිවරණ කොමසාරිස් කාර්‍යාලය කිසිම ඇමති කෙනකුට යටත් නැති ස්වාධීන ආයතන යක් වශයෙන් ක්‍රියා කළ යුතු කියා. ස්වාධීනව ක්‍රියා කිරීමේ බලය මැතිවරණ කොමසාරිස්වරයාට දෙන්න ඕනෑය කියා වටහාගෙන අපි එතුමාට ඒ බලය දුන්නා. ඒ අනුව කිසිම ඇමතිවරයකුට බැහැ, මැති වරණ කොමසාරිස් කෙරෙහි කිසිම බල පෑමක් කරන්න, එහි වැඩ කටයුතු සම්බන්ධයෙන් කිසිම නියෝගයක් කරන්න බැහැ. මේ සභාවේදී වුණත් ඒ දෙපාර්තමේන්තුව ගැන විවේචන කරනවා නම්, ඒ ගැන අඩුපාඩු කියනවා නම්, එය කළ යුත්තේ අනික් දෙපාර්තමේන්තු සම්බන්ධයෙන් වාගේ නොවෙයි, විශේෂ ක්‍රමයටයි; අමුතු වැඩ පිළිවෙළක් අනුවයි. ඒ නිසයි මා කියන්නෙ නියමිත දිනය එන තුරු—නියමිත දිනය කියන්නෙ ඡන්දය පවත්වන්න නියමිත දිනයයි—ඉංග්‍රීසියෙන් පමණක් මැතිවරණ ලේඛන තබා ගැනීම අංක 33 දරණ සිංහල පමණක් භාෂා පණතට විරුද්ධයි කියා. වෙනත් විධියකින් කියතොත්, මෙම වගන්තිය යටතේ මැති වරණ කොමසාරිස් කාර්‍යාලයේ සියලුම වැඩ කටයුතු ඉංග්‍රීසියෙන් කරන්න පුළුවන්. මේ වගන්තිය විග්‍රහය අනුව රාජ්‍ය භාෂාව සිංහල කියන පණත එතැනදී බල පාන්නෙ නැහැ.

වැදගත්ම දේ මැතිවරණ ලේඛනයි. මැතිවරණ ලේඛන ඉංග්‍රීසියෙන් තබා ගන්නවා නම්, මැතිවරණ කොමසාරිස් කාර්‍යාලයේ වැඩ කටයුතු සිංහල පණතේ බලපෑමක් නැතිව ඉංග්‍රීසියෙන් තබා ගැනී මට අවස්ථාවක් සැලසෙනව. අපි ඊට අවස්ථාව දීමයි මේ වගන්තියෙන් කරන්නෙ. එවැනි අවස්ථාවක් දීම ගැන අපේ පක්ෂය සම්පූර්ණයෙන්ම විරුද්ධයි. එම නිසා මැතිවරණ ලේඛන සිංහලෙන් තබා ගත යුතුය කියා අපි සංශෝධනයක් ඉදිරිපත් කරනවා. මා හිතනවා ගරු නියෝජ්‍ය කාරකසභා සභාපතිතුමති, ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරු එම සංශෝධනයට පක්ෂවී මේ වගන්තිය සංශෝධනය කර මැතිවරණ කොමසාරිස් කාර්‍යාලයේ වැඩ කටයුතු සිංහලෙන් කිරීමට රුකුලක් වෙනවා ඇත කියා. එම නිසා ඒ සඳහා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රී වරුන්ගේ සම්පූර්ණ අනුග්‍රහය හා ඡන්දය ලැබෙනවා ඇත කියා මම බලාපොරොත්තු වෙනව. එසේ නැතිව මෙය තමුන්නාන් සේලා ඉදිරිපත් කළත් අපට කමක් නැහැ. අපේ සම්පූර්ණ සහයෝගය දෙනව. වැඩ කෙරෙන්නයි අපට වුවමනා කරන්නෙ මෙය කාරකසභා අවස්ථාවේදී එක්කෝ ආණ්ඩු පක්ෂයෙන් ගේන්න; එසේ නැත්නම් අපි ගේනව. අපේ ප්‍රාර්ථනය මැති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වරණ ලේඛන සිංහලෙන් තබා ගත යුතුය යන්නයි. මෙම පණත සම්පූර්ණයෙන් සම්මත වෙන්න කලින් ඒ ලේඛන සිංහලෙන් තබා ගත යුතුය කියා සංශෝධන විය යුතුය කියන එකයි අපේ ඉල්ලීම.

මැතිවරණ ලේඛන සම්බන්ධයෙන් තවත් එක් කාරණයක් තිබෙනවා. මේ කරුණ අපේ අත්දැකීම් අනුව ඉදිරිපත් කිරීමට අපට පුළුවන්කම තිබෙනව. කොයි තරම් පිරිසිදු ප්‍රජාතන්ත්‍ර ක්‍රමයක් තිබුණත්, ඡන්ද ලේඛනයට නම ඇතුළත් වී තිබුණොත් පමණයි. ඡන්ද පත්‍රිකාව අතට ලැබෙන්නෙ. කොතරම් දුරට පුරවැසියෙක් වුණත්, වයස 18ට වැඩි වී තිබුණත්, ඡන්දය දීමට සුදුසුකම තිබුණත්, මැතිවරණ ලේඛනයේ නම නොතිබුණොත් ඡන්ද පත්‍රිකාව ලැබෙන්නෙ නැහැ. ඒ පැත්තෙ හොඳ මැතිවරණ නීති තිබුනත් මේ පැත්තෙ සිටින ගරු මන්ත්‍රීවරු දන්නව, මැතිවරණ ලේඛනවලට නම් ඇතුළත් කිරීමේදී ඒ වැඩ පිළිවෙළ පටන්ගන්නෙ කොතැනින්ද කියා. මැතිවරණ කොමසාරිස් තුමා ගැන නම් අපේ සම්පූර්ණ විශ්වාසය තිබෙනව. එතුමා ගැන කිසි කෙනෙකුගෙන් අපට චෝදනාවක් ලැබී නැහැ. නමුත් කොමසාරිස් තුමා කොපමණ අපක්ෂපාත වුණත්, මැතිවරණ වැඩ කටයුතු සම්බන්ධයෙන් අවංක වැඩ කිරීමට ඉදිරිපත් වුණත්, ඒ වාගේම අවංකව වැඩ කළ යුතු යයි එතුමාගේ උප කොමසාරිස්වරුන්ටත් නිලධාරීන්ටත් දැනුම් දී තිබුණත්—නිලධාරීන්ට එසේ දැනුම් දී තිබීම ගැන අපේ සතුට ප්‍රකාශ කරනවා—මැතිවරණ ලේඛන පිළියෙළ කිරීමේ මුල් අවස්ථාව තමයි පටන්ගන්න තැන තමයි, ග්‍රාම සේවක තැන.

ග්‍රාම සේවක ගමේ සිටින ඡන්දය දීමට සුදුසු අයගේ නම් ලැයිස්තුවක් ඉදිරිපත් කළාට පසු ප්‍රාදේශීය මැතිවරණ කාර්යාලය එය මැතිවරණ ලැයිස්තුවක් වශයෙන් සකස් කරනවා. පැරණි ගම් මුලාදෑනීන් දේශපාලන මත භේද උඩ හා නොයෙකුත් පළිගැනීම් උඩ ඡන්දය දීමට සුදුසු විශාල ගණනකගේ නම් එම ලැයිස්තුවට ඇතුළත් නොකළ බව අපේ අත්දැකීමයි. පරණ ගම්මුලාදෑනීන් හිතාමතාම එය කළා. එය ඒ පැත්තේ මේ පැත්තේත් සිටින හැම ගරු මන්ත්‍රීවරයකුම දන්නා කාරණයක්. හැබැයි, ග්‍රාම සේවකයින් පත් කළාට පසු ඒ තරම් පළිගැනීම්, හිතුවක්කාරකම් නොකෙරෙන බව ඇත්තයි. පැරණි ගම් මුලාදෑනීන් තරම් හණමිටි අදහස් දරන්න වුන් නොවෙයි, ඒ අය. ඒ වුණත් ඔවුන් ටත් වැඩ කරන්නට සිදු වී තිබෙන්නේ පැරණි ක්‍රමයටමයි. දැන් වුවත් මැතිවරණ ලැයිස්තු සියයට සියයක්ම හරි විදියට සකස් කෙරෙනවායයි කියන්න අමාරුයි. සමහර ග්‍රාම සේවකයින් ඒ කටයුත්ත ඒ තරම් හොඳින් කරන්නේ නැහැ. මට සිඩ වුණා, ග්‍රාම සේවකයින් එක්කෙනෙක් දෙන්නෙක් පිළිබඳව පැමිණිලි කරන්න. ඇතැම් ගම්වල ඡන්දය දීමට සුදුසුකම් ඇති අයගේ නම් සමහර ග්‍රාම සේවකයින් පවා ඇතුළත් කරන්නේ නැහැ.

පැරණි නීතියෙත්, මේ සංශෝධනයෙත් ඉඩ ප්‍රස්තා තිබෙනවා එවැනි අතහැරුනු නම් ඇතුළත් කරගැනීමට. එවැනි නමක් ඇතුළත් කරවා ගැනීම සඳහා ඉල්ලූ විට එය ප්‍රාදේශීය මැතිවරණ කාර්යාලය මඟින් විභාග කර බලා සුදුසු අයගේ නම් ඇතුළත් කරනවා. නමුත් සාමාන්‍ය ජනතාවට—එදිනෙදා වැඩ කරන කම්කරු ජනතාවටත්, ගොවි ජනතාවටත්, අනිකුත් සාමාන්‍ය ජනතාවටත්—ඔවුන්ගේ දෛනික ප්‍රශ්න තිබෙනවා, විසඳාගැනීමට. ඒ නිසා මෙවැනි කරුණු ගැන හිත යෙදවීමට අවස්ථාවක් නොලැබෙන්න පුළුවනි.

මැතිවරණ ලේඛන සකස් කළාට පසු ඒවා සෝදිසි කර බැලීමට සති දෙකක් තුනක් කල් දෙනවා. ඒ බව දැන්වීම් මාර්ගයෙන් මහජනයාට දන්වනවා. එවැනි දැන්වීම් නොයෙක් තැන්වල අලවනවා. විශේෂයෙන්ම ප්‍රසිඩ ස්ථානවලයි, අලවන්නේ. ආණ්ඩුවේ කාර්යාලවල, ග්‍රාම සේවක කාර්යාලවල, තැපැල් කන්තෝරුවල, උප තැපැල් කන්තෝරුවල, ප්‍රාදේශීය නිලධාරි කාර්යාලවල යනාදී ප්‍රසිඩ ස්ථානවලයි, අලවන්නේ. නමුත් සෑම ගමකම එවැනි ප්‍රසිඩ ස්ථාන ඇත්තේ නැහැ. එවැනි ගම්වල මිනිසුන් ඒ පිළිබඳව දැනගන්නේ කොහොමද? ඇතැම් ප්‍රදේශවල සිටින අයට සැතැපුම් හත අට කැලේ යන්න වෙනවා පාරකට එන්න. ඒවායේ කිසිම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කේ. එම්. පී. රාජරත්න මයා.]
ආණ්ඩුවේ කාර්යාලයක් ඇත්තේ නැහැ. ඒ අයත් මේ රටේ පුරවැසියන්. සමහර එවැනි ප්‍රදේශවල සිටින අය ආණ්ඩුවේ කාර්යාලයකට තබා මහපාරටවත් එන්නේ හත් අට මාසයකට වරක් පමණයි. ඒ නිසා එවැනි අයගේත්, පොදුමේ කාගේත් පහසුව සඳහා අණබෙරයක් යැවිය යුතුය කියා මම යෝජනා කරනවා. ඒ පිළිබඳව මීම සංශෝධනයක් ගෙනෙනවා. අඩ බෙර ගැසීම අපේ පුරාණ සිංහල චාරිත්‍රයක්. සෑම දෙනෙකුටම ආණ්ඩුවේ නිවේදනයක් දැනුම් දෙන ආකාරයක්. ඒ සුලු වියදමක් දරන්න සිදු වුණත් එය ඉතා වැදගත් ක්‍රමයක්. "මෙන්න ඡන්ද ලැයිස්තු සකස් කරන වාය, ඡන්ද ලැයිස්තු සංශෝධනය කර-තිබෙනවා"ය, යනාදි අඩ බෙර ගැසීමෙන් තමාගේ නමත් ඡන්ද ලැයිස්තුවේ තිබෙන වාද නැද්ද ආදී කරුණු දැනගැනීමට සෑම ඡන්දදායකුටම අවස්ථාව ලැබෙනවා. එම නිසා එවැනි ක්‍රමයක් ඇති කළ යුතුයි.

දැන්, යම්, ඡන්දදායකයකුට තමන්ගේ නම ඡන්ද ලැයිස්තුවට ඇතුළත් කර ගන්න වුවමනා නම්, එක්කෝ දිස්ත්‍රික් කයේ තිබෙන මැතිවරණ උප කොමසාරිස් තුමාගේ කාර්යාලයට නැත්නම් සංශෝධ නය කළ මැතිවරණ ලේඛනය තිබෙන ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි තැනගේ කාර්යාලයට ඔහු යන්නට ඕනෑ. වෙන තැනක ඒ ලියවිලි නැහැ. ඒ වගේම ගම් වැසියකුටත් තමන්ගේ නම ඡන්ද ලැයිස් තුවේ තිබෙනවාද නැද්ද කියා දැනගන්ට වුවමනා නම් තමන්ගේ දිස්ත්‍රික්කයේ තිබෙන ඉහත සඳහන් ප්‍රධාන කාර්යාල දෙකින් එකකට යා යුතුව තිබෙනවා. ගම් වැසියන්ට මේකත් මහ ලොකු කරදරයක්.

**ගරු ද සොයිසා සිරිවර්ධන**
*(கௌரவ டி சொய்சா சிறிவர்தன)*
(Hon. de Zoysa Siriwardena)
මොකක්ද කරන්ට ඕනෑ ?

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)
හැම ගමකටම මැතිවරණ ලේඛන යැවී මේ මාගී ඇති කළ යුතුයි. දැන් හැම ගම කමවාගෙ සංවර්ධන සමිති තිබෙනවා. ඒ ග්‍රාම සංවර්ධන සමිතිවලට මැතිවරණ නම් ලැයිස්තුව යවන්න ඕනෑ. ඒ වගේම ගම් කාර්ය සභා තිබෙනවා. ඒවාටත් මැතිවරණ ලේඛන යැවිය යුතුයි. ඒ වාගේම ප්‍රජා මණ්ඩලත් ග්‍රාම සේවක කාර්යාලත් හැම ගමකම තිබෙනවා. මැතිවරණ නම් ලැයිස් ලැයිස්තු සම්බන්ධයෙන් මේ හැම ආයතන යකම සහයෝගය ලබා ගත්තොත් ගමේ පුරවැසියාට ඡන්දය හිමි සුදුස්සාට ඒ කාලසීමාව තුළදී තමන්ගේ නම මැතිවරණ නම් ලැයිස්තුවේ තිබෙනවාද නැද්ද කියා දැනගැනීමට පුළුවන් වෙනව. වැඩි කරදර යක් නැතිව ගම්වැසියන්ට තමන් සිටින ස්ථානයන්ට කිට්ටු, ග්‍රාම සංවර්ධන කාර්යා ලයට, ප්‍රජා මණ්ඩලයට එහෙම නැත්නම් ග්‍රාම සේවක කාර්යාලයට ගොස් තමන්ගේ නම මැතිවරණ නම් ලැයිස්තුවේ තිබෙන වාද නැද්ද කියා දැනගෙන එසේ නම් නැති නම් පසුව එය මැතිවරණ කොමසාරිස්තුමා ට දැනුම් දෙන්න අවස්ථාව සැලසෙනව. මේ ඒ තරම් ලොකු දෙයක් හෝ කරන්නට අපහසු දෙයක් නොවෙයි. ගමේ හැම දෙනා ටම තම තමාගේ නම් ඡන්ද ලැයිස්තුවේ තිබෙනවාද නැද්ද කියා දැන ගැනීම පිණිස සලස්වා තිබෙන විධි විධාන ප්‍රමාණවත් මදි. ඒ නිසා සෑම ගම් වැසියෙකුටම තම තමන්ගේ නම් මැතිවරණ නම් ලැයිස්තුවේ තිබෙනවද නැද්ද කියා දැනගැනීම පිණිස මීට වඩා පළල් වශයෙන් වැඩ කටයුතු යොදන මෙන් මා ඉල්ලා සිටිනවා.

අවසාන වශයෙන් මේ සංශෝධනයෙන් පහසුවෙන්, වැඩි වියදමක් නැතිව, පිරිසිදු අන්දමින් මැතිවරණ පවත්වාගෙන යෑමට ඉඩප්‍රස්ථාව ඇති වන බව සඳහන් කරනවා. නමුත් මේ විධියේ නීතිරීති කොපමණ තිබුණත් ඒවා ක්‍රියාවේ යොදවන විටයි තවත් අඩුපාඩු පෙනෙන්නෙ. වරින්වර කරන මෙවැනි සෑම සංශෝධනයකට අර මුණ වන්නේ වඩාත් පිරිසිදු අන්දමින් මැතිවරණ පැවැත්වීමයි. ඒ නිසා සෑම අවස්ථාවකදීම පිරිසිදු මැතිවරණයක් පැවැත්වීමටත් දූෂ්පතාටත් මන්ත්‍රී ධුරා පේක්ෂකයකු වෙන්න පුළුවන් වන ආකා රයටත් මැතිවරණ නීති සම්පූර්ණයෙන්ම සකස් වේවායි ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒ. රත්නායක මයා.

(திரு. எ. ரத்னாயக்க)

(Mr. A. Ratnayake)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා දීර්ඝ කථාවක් කරන්නෙ නැහැ. මේ 36 වැනි වගන්තිය සම්බන්ධයෙන් පමණක් වචන ස්වල්පයක් කථා කරන්ට බලාපො රොත්තු වෙනව. ඒ වගන්තියේ අයුතු බලපෑම් ගැනයි සඳහන් කර තිබෙන්නෙ. දෙපක්ෂයකට අයුතු බලපෑම් සීමා කර තිබෙනව. පූජ්‍ය ස්ථානවල අධිපතීන්, විහාරාධිපතීන් අනික් ආගම්වල අධිපතීන් හා කම්කරුවන්ගේ වැඩ ගන්නා අය ඒ දෙපක්ෂයයි. ඒ දෙපක්ෂයට පමණක් අයුතු බලපෑම් සීමා කිරීම ප්‍රමාණවත් නොවන බව මගේ වැටහීමයි. මක්නිසාද ? මේ සංශෝධන ඇති කරන්නෙ පිරිසිදු මැතිවරණයක් පැවැත් පැවැත්වීමටයි. මේ ගරු සභාවට පත්වන මන්ත්‍රීන් ජන සම්මතයෙන් පත්වුණු මන්ත්‍රීන් හැටියට ලෝකවාසීන් තුළ පිළිගැනීමක් ඇතිවන්ට නම් ඔවුන් පත් වන ක්‍රමය පුළුවන් තරම් පිරිසිදු කිරීම අපේ යුතුකමක්. දකුණු කොළඹ ගරු පළමුවෙනි මන්ත්‍රීතුමා (ජේ. ආර්. ජයවර්ධන මයා.) ප්‍රකාශ කළා වගේ, ලංකාවේ පළමුවරට ඡන්දයෙන් තේරී පත්වුණු මන්ත්‍රීවරයෙක් සිටියේ 1911 දියි. එතැන් පටන් විටින් විට මන්ත්‍රීන් තේරීම පිළිබඳ ව්‍යවස්ථා වෙනස් වෙමින් ඇවිත් අවසාන වශයෙන් දැන් ඉදිරිපත් වී තිබෙන මේ වාර්තාව අනුවයි, ඉදිරි මැතිවරණය අපි පවත්වන්ට බලාපො රොත්තු වෙන්නෙ. ඡන්දදායකයකුට තම ඡන්දය ස්වාධීනව පාවිච්චි කරන්ට අවස්ථාව ලබා දිය යුතුය කියා විශ්වාස කරනවා නම්, පිරිසිදු මැතිවරණයක් පවත්වන්ට නම්, මේ කොටස් දෙක පමණක් නොව අයුතු බලපෑම්වල යෙදෙන්ට ඉඩකඩ තිබෙන සෑම කෙනකුම 36 වැනි වගන්තියට ඇතුළත් කරන්ට ඕනෑ. වැලිමඩ ගරු මන්ත්‍රීවරයා (කේ. එම්. පී. රාජරත්න මයා.) දැන් ප්‍රකාශ කළා, ගම්මුලාදෑනීන් මැතිවරණවලදී නොයෙක් විධියේ, අයුතු බලපෑම්වල යෙදුණාය කියා. එම නිසා මේ දෙපක්ෂයට පමණක් නොව තවත් බොහෝ දෙනකුට පුළුවන්—විශේෂ යෙන්ම ආණ්ඩුවේ උසස් නිලධාරීන්ට පුළුවන්—අයුතු බලපෑම් කරන්ට. එබඳු නොයෙක් ආයතනවලටත් පුළුවන් මෙවැනි බලපෑම් කරන්න. ඒ නිසා ඒ වගන්තිය තවත් පුළුල් කළ යුතුයි. මේ අවස්ථාවේ සභානායකතුමා මේ ස්ථානයේ නොමැතිවීම ගැන මා කනගාටු වෙනව. එහෙත් අධ්‍යාපන ඇමතිතුමා දකින්න මා බොහොම සන්තෝෂයි. සභානායකතුමා පැමිණෙන නිසා මා නැවතත් ඒ කාරණය මතක් කරනව. සභානායකතුමා සභාවේ නොමැතිවීම ගැන මා දැන් කනගාටුව පළ කළා. තමුන්නාන්සේගේ පැමිණීම සභාව පිළිගන්නව. මේ පනත සම්බන්ධයෙන් එක්තරා අදහසක් මා දැන් ඉදිරිපත් කරන්ට බලාපොරොත්තු වෙනව. ඒ අදහස ඉදිරිපත් කරන්ට බැහැ; අපේ ලේකම් මහත්මයා ඇවිත් ඊට හරස් කැපුව. ඒකත් අයුතු බලපෑමක්.

අපේ සභානායකතුමාට මා කියා සිටින්න බලාපොරොත්තු වෙන්නෙ මෙයයි. මේ පනතේ 36 වැනි වගන්තියේ අයුතු බල පෑම් සම්බන්ධව, දෙපක්ෂයක් ගැන සඳහන් කර තිබෙනව. ඒ අනුව අයුතු බල පෑම් තහනම් වන්නෙ ආගමික ප්‍රධානීන්ට හා කම්කරුවන්ගේ ස්වාමි පක්ෂයටත් පමණයි. සභානායකතුමනි, ඒ අයුතු බල පෑම් තවත් බොහෝ දෙනකුට නොයෙක් ආකාරයෙන් කරන්න පුළුවනි. වැලිමඩ ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා, පුරාණයේදී ගම්මුලාදෑනීන් මැතිවරණවලදී අයුතු බල පෑම්වල යෙදුනාය කියා. ඒ වගේම ආණ්ඩුවේ නිලධාරීන්ට නොයෙක් අයුරින් අයුතු බලපෑම් කරන්ට ඉඩ තිබෙන බව අප දන්නවා. එවැනි උදවියත් මීට ඇතුළත් වන අන්දමට සංශෝධනයක් ඉදිරිපත් කරනවා නම් එය සභානායකතුමා පිළිගන් නවා ඇතැයි මා විශ්වාස කරනව. අප කාගේත් අනුමතිය ඇතිව වගේ මේ පනත ඉදිරිපත් කරන්නෙ, මැතිවරණ ඉතා පිරිසිදුව පැවැත්වීමට අප කවුරුත් බලාපො රොත්තු වන නිසයි. 36 වැනි වගන්තියේ සඳහන් වන මේ කොටස් දෙකට පමණක් නොවෙයි, ආණ්ඩුවේ උසස් නිලධාරීන් ටත් පුළුවන්කම තිබෙනව, අයුතු බලපෑම් වල යෙදෙන්ට. ඒ අයත් මේ සංඛ්‍යාවට ඇතුළත් කළ යුතුය යන්න මගේ වැටහී මයි. තව කරුණු දෙකක් මතක් කරන්න සතුටුයි. මැතිවරණය සම්බන්ධව සලකා බැලීමේදී ආණ්ඩු පක්ෂය කල්පනා කරන්න ඕනෑ, විරුද්ධ පාර්ශ්වයට ආධාර

Digitized by Noolaham Foundation. noolaham.org | aavanaham.org

[ඒ. රත්නායක මයා.]

කළ යුතු බව. එය ප්‍රජාතන්ත්‍රවාදයේ වැදගත් අංගයක්. විරුද්ධ පාර්ශ්වයක් නැති සමහර රටවල විරුද්ධ පාර්ශ්වයක් ඇති කිරීමට ආණ්ඩු මුදල් වෙන් කර තිබෙන බව අපි දන්නව. විරුද්ධ පාර්ශ්වයට වුවමනා උපකරණ සපයා දී ආණ්ඩුව විවේචනය කිරීමට සෑම පහසුකමක් ම විරුද්ධ පාර්ශ්වයට සපයා දුන් රටවල් තියෙනව. 1936, 1937 පමණ කාලයේදී තුර්කියේ විරුද්ධ පාර්ශ්වයක් පෙනෙන්න නොතිබුණු නිසා ඒ ආණ්ඩුව විරුද්ධ පාර්ශ්වය සඳහා විශාල මුදලක් වෙන් කළා. විරුද්ධ පාර්ශ්වයට පුළුවන් තරම් ආධාර කිරීම ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවක වැදගත් ලක්ෂණයක්. තමුන්නාන්සෙලගෙ ආණ්ඩුව සර්ව සාධාරණ ලෙස කටයුතු කරන ආණ්ඩුවක් බව අප කව්රුත් පිළිගන්න නම්, මැතිවරණයේදී විරුද්ධ පාර්ශ්වයට ආධාර දෙමින් තමුන්නාන්සෙල සාධාරණ ලෙස කටයුතු කළ යුතුයි. (බාධා කිරීමක්) අතීතය ගැන දැන් කියන්න එපා. දැන් මේ රට ධර්මද්වීපයක් වෙලා තියෙන්නෙ. මේ ධර්මද්වීපයේ තිබෙන වර්තමාන ආණ්ඩුව මැතිවරණ නීතිය පිරිසුදු නීතියක් කරන්න ඕනෑ.

මැතිවරණ කාලයේදී නොයෙක් විධියේ අසාධාරණ වැඩ කෙරෙනව. ගුවන් විදුලිය පාවිච්චි කිරීම සාධාරණ විධියට කරන්න ඕනෑ. එය ආණ්ඩු පක්ෂයේ ආයතනයක් හැටියට කල්පනා කරන්න එපා. සෑම පක්ෂයකටම එය පාවිච්චි කිරීමට ඉඩ දෙමින් එය සාධාරණ විධියට පාවිච්චි කළ යුතුයි. ඡන්දදායකයන්ට දැන් තමන්ගේ වාහනයන් පාවිච්චි කරන්න බැරි නිසා දැන් ඡන්දය දෙන්න යන්න පුළුවන් වන්නේ බස් රියෙන් හෝ දුම්රියෙන් පමණයි. එම නිසා මැතිවරණයේදී ගමන් පහසුව සාධාරණ විධියට ඇති කරන ලෙස මම ගරු ගමනාගමන ඇමතිතුමාගෙන් විශේෂයෙන් ඉල්ලා සිටිනව. බස් ධාවනය තමුන්නාන්සෙලාට වුවමනා පිළිවෙළට යොදවා තමුන්නාන්සෙලාට දිනන්න පුළුවන්. අසවල් පැත්ත එක්සත් ජාතික පක්ෂයට ඡන්දය දෙනවය, අසවල් පැත්ත ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ඡන්දය දෙනවය, අසවල් පැත්ත විප්ලවකාරී සමසමාජ පක්ෂයට ඡන්දය දෙනවය, කියා දන්නව නම් විප්ලවකාරී සමසමාජ පක්ෂයට ඡන්දය දෙන ඡන්දදායකයන් ඉන්න පැත්තට බස් යවන්නෙ නැතිව ඉන්න තමුන්නාන්සෙලාට පුළුවනි. එහෙම කළොත් ඒ අයට ඡන්දය ලබා ගන්න බැරි වෙනව. ඒ නිසා එහෙම කරන්න එපා. තමුන්නාන්සෙලා සෑම ගමකම—සෑම ප්‍රදේශයකම—ඡන්දදායකයන්ට ඡන්දය දෙන්න යන්න පුළුවන් වන විධියට ගමනාගමන පහසුව ඇති කරන්න ඕනෑ.

මේ කාරක සභාවේ මා හිටිය නම් මා පිළිවෙළක් ඉදිරිපත් කරන්නෙ ඡන්දදායකයන්ට තමන්ගේ ගෙදර ඉඳලම ඡන්දය දෙන්න පුළුවන් විධියටයි. ඡන්දය විමසන නිලධාරීන් සෑම ගෙදරකටම ඡන්ද පෙට්ටි අරගෙන ගිහින් ඡන්දය ලබා ගැනීමේ ක්‍රමයක් අනුගමනය කරනව නම් ඉතාමත්ම හොඳයි. ඒ ක්‍රමය ඉතාමත්ම සාධාරණයි. වාහනයක් ගෙන යන්න බැරි නම් ඡන්ද පෙට්ටි ගෙන ගොස් ඡන්දය ලබා ගන්න පුළුවන්. ඒක කරන්න බැරි නම් ඡන්දදායකයන්ට තිබෙන ගමනාගමන පහසුකම් සාධාරණ ලෙස ඇති කරන්න ඕනෑ. ඒ නිසා මැතිවරණය සඳහා බස් ගමනාගමනය පිළියෙල කිරීම සඳහා සාධාරණ මණ්ඩලයක් ඇති කරන්න ඕනෑ. ඡන්දය විමසන දිනය නිවාඩු දිනයක් නිසා, සෑම දෙනාම ඡන්දය දිය යුතුය කියා තමුන්නාන්සෙලා විශ්වාස කරනව නම්, එදා බස් ගමනාගමනය සාධාරණ ලෙස සංවිධානය කළ යුතුයි. ජන සම්මත ආණ්ඩුවක් පත් කිරීම අපේ යුතුකමයි. උඩරට අල්ලා දෙන්නදැයි ඇහැලේපොල අදිකාරම් නෝර්ත් ආණ්ඩුකාරයාට මතක් කළ වේලේ, "එහෙම බෑ. මහජන සම්මතයෙන් තමයි, අපට බලයට එන්නට පුළුවන් වන්නේ"යි නෝර්ත් ආණ්ඩුකාරතුමා පැවසූ බව ජෝන් ද සිල්වා මහතාගේ "ශ්‍රී වික්‍රම රාජසිංහ" නමැති නාට්‍යයෙහිත් සඳහන් වී තිබෙන බව ඒ නාට්‍යය බැලූ අයට මතක ඇති. ඒ වගේම රජකම සඳහා එවකට කන්දසාමි නමින් සිටි ශ්‍රී වික්‍රම රාජසිංහ තුමාගේ නම ඇහැළේපොල අදිකාරම් විසින් යෝජනා කරනු ලැබ පසුව ඒ සඳහා මහජන සම්මතයක් ඉල්ලුවා. ඒ කාලයේ මේ විධියට රෙගුලාසි, අණ පණත් තිබුණේ නැහැ. නමුත් එදත් සම්මතයට මුල් තැන ලැබුණා. "මහා සම්මත" නමින් රජ කෙනකු සිටි බව තමුන්නාන්සේලා අහලා ඇති. ඔහු ලෝකයේ ප්‍රථම රජතුමායි. ශ්‍රී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වික්‍රම රාජසිංහ රජතුමාගේ කාලය දක්වා මේ රටේත් ජන සම්මතය පැවතුණා. හැබැයි ඒ ජන සම්මතය විමසීමේ ක්‍රම වෙනස් වුණා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ රජය විසින් අදත් හොඳ නීතියක් ඉදිරිපත් කර තිබෙනවා. එම නීතිය ඉදිරිපත් කිරීම ගැන අප මේ ආණ්ඩුවට ප්‍රශංසා කරනවා. මේ නීතිය ගැන මේ පාර්ලිමේන්තුවේ හැම දේශපාලන පක්ෂයකම කැමැත්ත ලැබී ඒක ඡන්දයෙන් සම්මත වන්නට පුළුවනි. නමුත් මේ නීතියේ අඩංගු අදහස් ක්‍රියාවේ යොදවන්නේ නැත්නම් එය බරපතළ අඩුපාඩුවක් බව මතක් කරන්නට කැමතියි. අයුතු බලපෑම් පිළිබඳ නීතිය සම්පූර්ණ කිරීම හා පුළුවන් තරමින් ගමනාගමන පහසුකම් ඇති කිරීම ගැන විශේෂයෙන් උනන්දු විය යුතුයි. කුමන දේශපාලන පක්ෂයකට අයත් අය වුණත් තමන්ට විරුද්ධ දේශපාලන පක්ෂයේ අය සමඟ තරහ වන්නට හොඳ නැහැ. විරුද්ධකාරයා මිත්‍රයකු ලෙස සැලකීම සත්පුරුෂයන්ගේ යුතුකමක් එසේ කිරීම උත්තම ගතියක්. එම නිසා සාධාරණ පරිදි නීති ක්‍රියාත්මක කිරීමෙන් සර්ව සාධාරණ ජන සම්මත රාජ සභාවක් පිහිටුවීමට අප සියලු දෙනාම ඉටා ගත යුතු කියා මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා.

අ. භා. 5.7

**එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.** (බුලත්සිංහල)

*(திரு. எட்மன் சமரக்கொடி—புளத்சிங்ஹளை)*

(Mr. Edmund Samarakkody—Bulathsinhala)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙවැනි මැතිවරණ සංශෝධන නීතියකින් අප බලාපොරොත්තු වන්නේ කුමක්ද? පිරිසිදු මැතිවරණයක් බලාපොරොත්තු වන බව මීට පෙර කථා කළ ගරු මන්ත්‍රීවරුන් විසින් කියන්නට යෙදුණා. නමුත් අපේ පරමාර්ථය විය යුත්තේ එපමණක් නොවෙයි. මෙහි තවත් ඉතා වැදගත් පැත්තක් තිබෙනවා. අප ජනතා බලයක් ගැන කථා කරනවා නම් ඒ ජනතා බලය මේ නීති මගින් ආරක්ෂා විය යුතුයි. තවම මෙම නියෝජිත මන්ත්‍රී මණ්ඩලය, එහෙම නැත්නම් පාර්ලිමේන්තුව නියම ජනතා මණ්ඩලයක් ලෙස අප නොපිළිගත්තත්, ජනතාවගේ බලය මේ ස්ථානයෙන් ආරක්ෂා වන පිළිවෙළට මෙම නීතිය සකස් කළ යුතුයි. ඇත්තෙන්ම මෙවැනි ධනපති ක්‍රමයක් ගැන අපේ නම් කිසිම බලාපොරොත්තුවක් නැහැ. ධනපති රටක තිබෙන පාර්ලිමේන්තුවක් කොයි ලෙසකින් හෝ ජනතා මණ්ඩලයක් ලෙස පරිවර්තනය වේයයි අප සිතන්නේ නැහැ. ධනපති රටක තිබෙන පාර්ලිමේන්තුව ධනපති පංක්තියේ බලය තහවුරු වන ස්ථානයක් හැටියට තමයි සලකන්නෙ. තමුන්නාන්සෙට මතක ඇති මෙම පාර්ලිමේන්තු ක්‍රමය, මන්ත්‍රණ සභා ක්‍රමය මේ රටේ පටන් ගන්න කාලයේදී, වැඩ කරන ජනතාවට, කම්කරු ජනතාවට, ගොවි ජනතාවට මේ රටේ කොයි විධියේ තැනක්ද තිබුණේ කියා. අද කථා කරන, එක්සත් ජාතික පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්, එද 'සිලෝන් නැෂනල් කොන්ග්‍රස්' නොහොත් ලංකා ජාතික සංගමයේ මාර්ගයෙන් ක්‍රියා කරන අවස්ථාවේදී මේ රටේ වැදගත් ප්‍රශ්නයක් මතු වුණා. එනම්, එදා තිබුණු ව්‍යවස්ථාදායක මන්ත්‍රණ සභාව ජනතාවගේ බලය වඩාත් තහවුරු වන සභාවක් හැටියට සකස් කරන්නට ඕනෑය කියා. ඒ වාගේම වැඩ කරන ජනතාවට, කම්කරු ජනතාවට, ගොවිජනතාවට සර්වජන ඡන්ද බලය දෙන්නට ඕනෑය කියා සාමාන්‍ය දුප්පත් ජනතාව එදා ලොකු සටනක් ගෙන ගියා. ධනපති පංක්තියේ අයගෙන් සමන්විත වූ ඒ ලංකා ජාතික සංගමයේ නායකත්වය දැරුවෙ හිටපු ඩී. එස්. සේනානායක මැතිතුමා වන අතර, ගරු බණ්ඩාරනායක මැතිතුමාද එදා එම සංගමයේ සිටි බව මේ අවස්ථාවේදී තමුන්නාන්සේට මතක් කර දෙනව. එදා, ඩී. එස්. සේනානායක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් වූ එම සංගමය තදින්ම කියා සිටියේ, මේ නූගත් ජනතාවට, කිසිම දෙයක් තේරෙන්නෙ නැති ජනතාවට, මොන ඡන්ද බලයක්ද කියායි.

**ජේ. ආර්. ජයවර්ධන මයා.**

*(திரு. ஜே. ஆர். ஜயவர்தன)*

(Mr. J. R. Jayewardene)

එහෙම දෙයක් කීවෙ නැහැ.

**එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.**

*(திரு. எட்மன் சமரக்கொடி)*

(Mr. Edmund Samarakkody)

You opposed universal franchise.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ජේ. ආර්. ජයවර්ධන මයා.**
*(திரு. ஜே. ஆர். ஜயவர்தன)*
(Mr. J. R. Jayewardene)

Who ? I ?

**එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.**
*(திரு. எட்மன் சமரக்கொடி)*
(Mr. Edmund Samarakkody)

Mr. D. S. Senanayake, Sir D. B. Jayatillake, and S. W. R. D. Bandaranaike.

**ජේ. ආර්. ජයවර්ධන මයා.**
*(திரு. ஜே. ஆர். ஜயவர்தன)*
(Mr. J. R. Jayewardene)

That was the National Congress.

**එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.**
*(திரு. எட்மன் சமரக்கொடி)*
(Mr. Edmund Samarakkody)

එක්සත් ජාතික පක්ෂයේ මූල එතැන නමයි.

**ජේ. ආර්. ජයවර්ධන මයා.**
*(திரு. ஜே. ஆர். ஜயவர்தன)*
(Mr. J. R. Jayewardene)

Before our time.

**එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.**
*(திரு. எட்மன் சமரக்கொடி)*
(Mr. Edmund Samarakkody)

ඩී. එස්. සේනානායක මහත්මයගෙ කාලයෙදි, එක්සත් ජාතික පක්ෂයෙ පටන් ගැන්මෙදි.

**ජේ. ආර්. ජයවර්ධන මයා.**
*(திரு. ஜே. ஆர். ஜயவர்தன)*
(Mr. J. R. Jayewardene)

I would like to explain, because this has been taken up so often. Universal franchise was supported by the Europeans, because they wanted all the Indians to get the vote ; and the reason why Sir D. B. Jayatillake, Mr. D. S. Senanayake and the Congress opposed it was because the Indians were getting the vote.

**එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.**
*(திரு. எட்மன் சமரக்கொடி)*
(Mr. Edmund Samarakkody)

ගරු සභාපතිතුමනි, මම ගරු මන්ත්‍රීතුමාට ඉඩ දුන්නා ඒ ගැන යමක් තියෙනවා නම් කියන්නට. මම උත්සාහ කළේ ඒ කාලයේදි, මුන්නැහැල නොවෙයි, මුන්නැහැලගෙ නායකයන් ක්‍රියා කළ අන්දම පෙන්නා දෙන්නටයි. අප දන්නා මේ රටේ සාමාන්‍ය ජනතාව හොඳින් දන්න කරුණක් නමයි, සර්වජන ඡන්ද බලය දීමේ ප්‍රශ්නය මතුවුණු අවස්ථාවේදී මේ රටේ සිටි ධනපති පංක්තිය කෙළින්ම ඒ අදහසට විරුඩව ක්‍රියා කළ බව. එතැනින් නමයි මේ ප්‍රශ්නය විසඳන්නට බලාපොරොත්තු වෙන්නෙ. ගරු සභාපතිතුමනි, සාමාන්‍ය ජනතාවගෙන්, කම්කරු ජනතාවගෙන් තෝරා පත්වුණු මන්ත්‍රීවරුන් එක් කෙනෙකු, දෙන්නකු, තුන් දෙනකු නැතිනම් හතර දෙනකුගේ මාර්ගයෙන් ධනපති පංක්තියේ ක්‍රියා කලා පය අපට අහන්නට ලැබුණා. මේ අන්දමට ක්‍රමානුකූලව අවුරුදු දහයක් දොළහක් තිස්සේ ඊට වඩා වැඩිපුර කාරණා අපට අහන්නට ලැබුණා. අප සන්තෝෂ වෙනවා, ඊට වඩා වෙනස් තත්ත්වයකින් තරමක් දුරටවත් ඒ ජනතාවගේ හඬ අපට ඇසෙනවා නම්. නමුත් දුප්පත් ජනතාව ගැන කෑ ගහන මන්ත්‍රීවරුන්, අපේ පරණ මිත්‍රයන්, සමාජවාදය කරා ගමන් කරනවාය කියමින් මේ පැත්තේ සිට ඒ පැත්තට ගමන් කරන මන්ත්‍රීවරුන්, මගේ කථාව අහගෙන සිටිනවා නම් හොඳයි. ඒ අය දුප්පත් ජනතාව වෙනුවෙන් කී වචන මතක් කර දෙන්නට කැමතියි. උන්නැහැලා එදා කීවා, මේ රටේ වැඩ කරන ජනතාවට, කම්කරු ජනතාවට, ගොවි ජනතාවට, ඒ එක්කම මතක් කළා මේ රටේ කැලලක් වශයෙන් සලකන, දකුණු අප්‍රිකාවේ මෙන් අමානුෂිකව සලකන කොටසකට, මේ රටේ සමාන අයිතිවාසිකම් දෙන්නේ නැතිනම්, මේ රටේ ඡන්ද බලය දිය යුතු අයට ඡන්ද බලය දෙන්නේ නැතිනම්, සාමාන්‍ය ජනතාවගේ අයිතිවාසිකම් ගැන කථා කරන්නට පුළුවන් කමක් ලැබෙන්නේ නැත කියා. මේ රටේ කම්කරු පංක්තියෙ සෑහෙන කොටසක් කාලයක් තිස්සෙ සර්වජන ඡන්ද බලය නැතිව සිටීම මේ රටට කැලලක් හැටියට සලකන්න පුළුවන්නේද ? මා මේ කාරණය මතක් කරන්නෙ මේ පැත්තෙ ඉන්න කාලෙ ලංකා සමසමාජ පක්ෂය වෙනුවෙන් කම්කරුවන් ගැන අවුරුදු තිස්පහක් තිස්සෙ කථා කළ, දැනටත් වතුකරයෙ වතු නායකයා හැටියට ඉන්න ගරු මුදල් ඇමතිතුමා ඇතුළු කොටසටයි. මේ විධියෙ කම්කරුවන් පිරිසක් වහලුන් හැටියට මේ රටේ සිටීම කැලලක් නිසා ඒ කැලල ඉවත් කරන්න බඩගින්න නිසා උන්නැහෙලා කිව්වා. ඉඩක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලැබුණු ප්‍රථම අවස්ථාවෙම උන්නැහෙල ඒ සම්බන්ධව කටයුතු කරනවා ඇත කියා අපි හිතුවා. මෙවැනි වැදගත් සංශෝධනයක් ඇති කරන අවස්ථාවෙ මේ රටේ වැඩ කරන ජනතාවගෙ, කම්කරුවන්ගෙ, බලය තහවුරු කිරීම සහ ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් කැබිනට් මණ්ඩලයට යම් යම් යෝජනා ඉදිරිපත් කළාද කියා මම අහනව, ගරු මුදල් ඇමතිතුමාගෙන්.

බොහෝම ඝෝෂා කරන අපේ දෙහිවල-ගල්කිස්ස කොට්ඨාශයේ ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා) මොනවද ඉදිරිපත් කළ යෝජනා ? එතුමා අදත් කම්කරු සභාවල ඉන්නව. ජේ. සී. ටී. යූ. ඕ. Joint Council of Trade Union Organizations නැමති කම්කරු සමිති ව්‍යාපාර සංවිධානයේ නායකයෙකු හැටියට වැඩ කරනව. එතැන ඉන්නෙ එක් කොටසක් නොවෙයි. සියලුම කොටස් ඒකාබද්ධ කිරීමෙන් සකස් කර ගත් සංවිධානයක් තමයි, ජේ. සී. ටී. යූ. ඕ. නමින් හඳුන්වන්නෙ. සී. ඩබ්ලිව්. සී., ඩී. ඩබ්ලිව්. සී., ලංකා කම්කරු සංගමය, ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සංගමය, තොන්ඩමන් මහත්මයගෙ නායකත්වයෙන් තිබෙන සංගමය, අසීස් මහත්මයගෙ නායකත්වය උඩ පවතින සංගමය, ආදී සංගම් සියල්ලක්ම එකතු කරලයි ජේ. සී. ටී. යූ. ඕ. ඇති කර තිබෙන්නෙ. එහි නායකයෙක් තමයි දෙහිවල-ගල්කිස්ස කොට්ඨාශයෙ ගරු මන්ත්‍රීවරයා.

**ජේ. ආර්. ජයවර්ධන මයා.**
*(திரு. ஜே. ஆர். ஜயவர்தன)*
(Mr. J. R. Jayewardene)
නායකයා ?

**එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.**
*(திரு. எட்மன் சமரக்கொடி)*
(Mr. Edmund Samarakkody)
නැහැ, නායකයෙක්, කම්කරුවන් ගැන කථා කරන උන්නැහෙලාගෙන්, මොකක්ද ගෙ විහිළුව, ද්‍රෝහිකම, කියල අහන්න අපට බලයක් නැද්ද ? [බාධා කිරීමක්] ආණ්ඩු පක්ෂයේ පසුපස අසුන්වල ඉන්න ගරු මන්ත්‍රීවරුන් එක්ක කරන රණ්ඩුවක් නොවෙයි මේ. එතුමන්ලගෙ තත්ත්වය මා දන්නව. මේ ප්‍රශ්න අහන්නේ ඒ ගරු මන්ත්‍රීතුමන්ලගෙන් නොවෙයි. කම්කරු ජනතාව පාවා දුන් ආකාරයට අපේ කටවල් වහන්න වෙන්න ඇති හදන් ... මේ කරුණු නිසයි උන්නැහෙල දැන් මෙතන නැත්තෙ. උන්නැහෙල මෙතන ඉන්නෙ නැහැ, පැනල යනව. පරන කතන්දර ගැන මතක් කරන නිසයි මෙතන නැත්තෙ. මේ රටේ කෙරෙන මේ වැරදි හරිගස්සන්නෙ නැතුව දකුණු අප්‍රිකාවෙ කෙරෙන වැරදි ගැන කියන්න බැහැ මුන්නැහෙලට.

**එම්. ඩී. බණ්ඩා මයා.** (හඟුරන්කෙත)
*(திரு. எம். டீ. பண்டா—ஹங்குரன்கெத்த)*
(Mr. M. D. Banda—Hanguranketa)
තමුන්නාන්සෙ ඉන්නෙ 1917 ද, නේද ? උන්නැහෙල ඉන්නෙ ?

**එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.**
*(திரு. எட்மன் சமரக்கொடி)*
(Mr. Edmund Samarakkody)
ඔව්, ඒක එහෙම නම් ඊට වඩා දේවල් සිංහලේ රජකාලෙ සිද්ධවෙලා තියෙනවලු. ඒ කාලෙ උල තියන්නත් ලෑස්ති වුණාය කියන්නෙ. මේ කැලල පුළුවන් තරම් ඉක්මනින් මකා දාන්න ඕනෑ. එහෙම නොකර ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරන්න බැහැ. ඒවා නිකම් පුහු වචන හැටියටයි සලකන්න වෙන්නෙ. මේ රටේ වැඩ කරන ජනතාවගෙන් විශාල කොටසක් වහලුන් හැටියට තබාගෙන මොනවද මේ කම්කරු මණ්ඩල Workers Councils, Workers' power, ගැන කථා කරන්නෙ ? මොන බොරුවක්ද මේ කරන්න යන්නෙ ? මොන බොරුද කියන්නෙ ? ධනපති රටක් හැටියට ගෙන යන්න ලෑස්ති වුණත්, ධනපති ක්‍රමය ගෙන යන්න ලෑස්ති වුණත්, මේ කැලල හරි ගස්සන්න ඕනෑ.

පිරිසිදුකම ගැන කථා කරනව. ඒක අහන්නත් සන්තෝෂයි. අත් කිලිටි කර ගන්නෙ නැතිව, පිරිසිදු කරගෙන ඡන්ද වැඩ කරමු. මෙන්න ඒකට හොඳ අවස්ථාව. කාටද ඡන්දය දෙන්නෙ ? කවුද ඡන්දය දෙන්නෙ ? කවුද මේ ගරු සභාවට එන්නෙ ? ඒක කොහොමද අපි විසඳන්නෙ අසුවලා වැරැද්දක් කළා, අසුවලා අතින් දූෂණකමක් වුණා, යනාදි වශයෙන් සොයන්න ඕනෑ. අලුතින් පත් වූ ගරු මන්ත්‍රීවරු උදේ පාන්දර දෙකට තුනට නැගිටලා හොයන්න යනවලු දූෂණ තියෙන තැන්. එච්චර දුරට යන්න ඕනෑ නැහැ. තමුන්නාන්සෙලාගේ පක්ෂය නැත්නම් තමුන්නාන්සේලා අත්වැල් බැඳගත්



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**පී. බී. බාලසූරිය මයා.** (ගලිගොමුව)
*(திரு. பீ. பி. பாலசூரிய—கலிகொமுவ)*
(Mr. P. B. Balasuriya—Galigomuwa)
කියන්න කියන්න, ඔහේ ලාම කියන්න.

**එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.**
*(திரு. எட்மன் சமரக்கொடி)*
(Mr. Edmund Samarakkody)

ඔව්, කියන්නම්. මේ ගරු සභාවෙන් අත් කිලිටි කර ගෙන නැත්නම් අත් කිලිටි කර ගෙන මේ ගරු සභාවට ආවා කියා නැසීගිය බණ්ඩාරනායක අගමැතිතුමාගේ කටින්ම නියමයෙන්ම පත් කළ කොමිසමෙන් දුන් තීන්දුවක් අනුව වැරදිකාරයන් වූ අය මේ ගරු සභාවෙන් නෙරපා දමන්න සිදු වුණා. කෝ මේ පුද්ගලයෝ ? මේ අය තවම සමාජ වාදීය කියන අයත් සමග පසුවෙනවා.

**සිරිසේන මයා.**
*(திரு. சிரிசேன)*
(Mr. Sirisena)

ප්‍රශ්නයක් නිරාකරණය කර ගන්න ඉඩ දෙනවද ? තමුන්නාන්සේලා කරන්නෙ උගුරට හොරා බෙහෙත් කනවා වගේ වැඩ. පුරවැසිකම් නැති ඉන්දියානු වතු කම්කරු වන්ට ඡන්ද බලය දෙන්නද කියන්නෙ ?

**එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.**
*(திரு. எட்மன் சமரக்கொடி)*
(Mr. Edmund Samarakkody)

නැහැ. මම ඉඩ දෙන්නෙ නැහැ. කැක්කුම නැතිව මේවා කරන්න බැහැ. සුද්ධ ඉලෙක්ෂන් එකක් කරන්න නම්, මෙන්න ගරු මුදල් ඇමතිතුමාට හොඳ අවස්ථාව. එහෙනම් සුද්ධ ඉලෙක්ෂන් එකක් කරන්න මේ සංශෝධනය ගෙනෙන් නට තිබුණා. මා ළඟ මෙහි මුල් නීතිය තිබෙනවා. මා එහි එක කොටසක් කිය වන්නම් :

Part II Chapter 381.

මෙයින් කියා තිබෙනවා ඡන්දය ලැබිය යුත්තේ කාටද කියා. නොයෙක් නොයෙක් අයට ඡන්දය නොලැබිය යුතුයි කියනවා.

"4. (1) No person shall be qualified to have his name entered or retained in any register of electors in any year if such person—"

It goes on to (a), (b), (c), (d), (e), (f) and (g) which reads :—

අන්තිම කොටසේ කියනවා, මේ අයටත් ඡන්දය දෙන්න බැරිලු.

"(g) would have been incapable of being registered as a voter by reason of his conviction of a corrupt or illegal practice if the Ceylon (State Council Elections) Order in Council, 1931, had remained in force."

මෙන්න අවස්ථාව. මේ කොටස සංශෝධනය කර මේ අය පමණක් නොවෙයි, මීට පෙරත් තල්ගොඩපිටිය කොමිෂන් සභාව වැනි රජයෙන් පත් කළ මණ්ඩල වලින් යම් යම් අය කිලිටි අත් ඇතිව, කිලිටි පිළිවෙළට කටයුතු කර සිටිනවා කියා මේ ගරු සභාවෙන් නෙරපා දැම්මා නම්, අන්න ඒ අයටත් මේ ගරු සභාවට එන්න බැහැ කියා නීතිය සකස් කරන්න. කෝ තමුන්නාන්සේලාගේ පිරිසිදු අදහස් ? කියන දෙයක් ජනතාවට තේරෙන වචනවලින් කියන්න ඕනෑය කියා මා ඉල්ලා සිටිනවා.

තවත් කාරණයක් තිබෙනවා. මේ සංශෝධනයෙන් කියා තිබෙනවා ගරු කොට්ටාවේ මන්ත්‍රීතුමාත් (ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.) කිව්වා—දේශපාලන පක්ෂ ගැන. දේශපාලන පක්ෂයක් වශයෙන් ඡන්දයකට ඉදිරිපත් වන විට ඒ දේශපාලන පක්ෂයට විශේෂ සැලකිල්ලක් දී, කලබලකාරී තත්ත්වය අඩු වීමට එක එක දේශපාලන පක්ෂයට එක එක ලකුණ දී ක්‍රියා කිරීම ගැන ඇත්ත වශයෙන්ම අපි සතුටු වෙනවා. එය මේ ගරු සභාව ගත් තීන්දුවක්. එය හරි කියා මා පිළිගන්නවා. එවැනි ප්‍රශ්නයක් ගැන බලන විට, පසුගිය කාලයේ තිබුණු පක්ෂ මොනවාද ඉදිරියට ඇති වන පක්ෂ මොනවාද, කියන ප්‍රශ්න මතු වෙනවා. ඕනෑ කෙනෙක් ඕනෑ කොට්ඨාශයක් හදිසියේම අපෙත් දේශපාලන පක්ෂයක් තිබෙනවා යයි කී විට, එම කියමන පිළිගත හැකි නම් ඒ අයත් දේශපාලන පක්ෂයක්ය කියා අපි සලකන්න ඕනෑ. එහෙම හිතුවක්කාර අන්දමට තේරුමක් නැතිව ඕනෑම කෙනෙක් ඉල්ලු විට එය දේශපාලන පක්ෂයක් හැටියට පිළිගන්න කියා මා කියන්නේ නැහැ.

ඒ වගේම තවත් එකක් කියන්න සතුටුයි. අපි රෙගුලාසි පනවනවා නම් ඒ රෙගුලාසි අනුව ඉතාමත්ම සාධාරණ අන්දමින් කටයුතු කළ යුතුයි.

මෙම සංශෝධන පණතෙ කියා තිබෙනව, පැරණි දේශපාලන පක්ෂ හැටියට පිළිගන්නා පක්ෂ ගැන. අඩු වශයෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

1960 න් පසු ඇති වෙච්ච පක්ෂ, දේශපාලන පක්ෂ හැටියට නැවතත් අපි පිළිගත යුතුය කියා කියනව. අසුවල් කරුණ නිසා අසුවල් දේශපාලන පක්ෂය සමඟ මා විරුද්ධය කියා කියන්නෙ නැහැ. ඒ පිළිවෙළට ක්‍රියා කිරීම වැරදි බවයි, මා කියන්නෙ. යම් පක්ෂයක් 1960 දී තිබුණට දැන් එය තිබෙනවද, නැද්ද දන්නෙ නැහැ. එය පරීක්ෂා කර බලන්න ඕනැ. 1960 තිබුණු එක දැන් නිකම් බෝඩ් ලෑල්ලක් හැටියට තියෙන්න පුළුවනි. එය, ක්‍රියාත්මක භාවය අතින් පක්ෂයක් හැටියට පිළිගන්න පුළුවන්ද කියන එක සොයා බලන්න ඕනැ. ඒ පිළිබඳව මෙහි තියෙන සංශෝධනය මදි. මා මේ කියන්නෙ පරණ පක්ෂ ගැනයි. එවැනි පක්ෂයකින් ඉදිරිපත් කළ අපේක්ෂකයන්ගෙන් යටත් පිරිසෙයින් දෙන්නෙක්වත් තෝරා පත් කෙරුණු බවට සෑහීමට පත් විය යුතු බව මෙහි කියනව. එය එසේ නූනොත් පක්ෂයක් නොවෙයි. එසේ වුණොත් පමණයි, නැවත වරක් පරණ පක්ෂයක් හැටියට පිළිගන්න පුළුවන් වන්නෙ.

මෙහි තේරුම කුමක්ද කියා අපි කල්පනා කර බලමු. පාර්ලිමේන්තු ක්‍රමය තියෙන ධනපති රටවල වැඩ කරන ජනතාවගෙ පැත්තෙන් හැදෙන දේශපාලන පක්ෂ, කම්කරුවන්ගෙ පැත්තෙන් හැදෙන දේශපාලන පක්ෂ, විප්ලවකාරී දේශපාලන පක්ෂ යනාදි නීති විරෝධි නැති, නීතියෙන් ඉදිරිපත් වන්න ඉඩ දුන් පක්ෂවලටත් පාර්ලිමේන්තුවෙ තැනක් ලබා ගැනීම ලෙහෙසි පහසු ප්‍රශ්නයක් වුණේ නැහැ. එංගලන්ත පාර්ලිමේන්තුවෙ අවුරුදු ගණනාවක් තිස්සෙ තිබුණු කොමියුනිස්ට් පක්ෂයෙ හිටියෙ, එක්කෙනයි නැතිනම් දෙන්නයි; බොහෝ විට එක්කෙනයි. නමුත්, කවුද කියන්නෙ එංගලන්තයෙ කොමියුනිස්ට් පක්ෂය, කොමියුනිස්ට් පක්ෂයක් නොවේය කියා. විප්ලවකාරී දේශපාලන පක්ෂ බලවත් පක්ෂ වුණත්, ඔය විධියයි ධනපති රටවල ඉලෙක්ෂන් වැඩ පිළිවෙළ හේතුකොටගෙන ක්‍රියාවට නැංවුණේ. පොඩි මිනිසුන්ගෙ, දුප්පතුන්ගේ හඬ දරණ නියම අය පාර්ලිමේන්තුවට යවන්න අපහසු වුණේ ඒ නිසයි. එය අපට තේරී තිබෙනව. අපි කවුරුත් සමග මේ ගැන රණ්ඩු වන්න වුවමනා නැහැ. පාර්ලිමේන්තුවෙ ඒ ඒ පක්ෂවල අය දෙන්නෙක්, තුන්දෙනෙක් හෝ එක්කෙනෙක්වත් ඉන්න ඕනැය යන ප්‍රශ්නය උඩ මෙම ප්‍රශ්නය තීන්දු කරන්න බැහැ.

අළුත් පක්ෂයක් වශයෙන් යම්කිසි පක්ෂයක් පිළිගත යුත්තෙ කිනම් ආකාරයකටද යන්නත් ප්‍රශ්නයක් තමා. ඒකත් සකස් කරගත යුතු ප්‍රශ්නයක්. නමුත් මෙහි සකස් කර තිබෙන ආකාරයට නම් කිසිසේත් පිළිගන්න බැහැ. මට නම් කිසි ප්‍රශ්නයක් නැහැ, මෙතනදී. මගෙ පක්ෂය 1935 සිට ක්‍රියා කරගෙන එන පක්ෂයක්. තමුන්නාන්සෙ දන්නව, මෙම නීතිය තිබුණ නම් නැසීගිය ගරු බණ්ඩාරනායක මැතිතුමාගෙ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට එදා පක්ෂයක් වශයෙන් පෙනී සිටින්න අමාරු වන බව. එතුමා 1951 දියි, එක්සත් ජාතික පක්ෂයෙන් ඉවත් වී විරුද්ධ පාර්ශ්වයට ගියෙ. ඉලෙක්ෂන් එක තිබ්බෙ 1952 දියි. එම වර්ෂයෙදියි, ඒ පක්ෂය ප්‍රථම වරට පක්ෂයක් හැටියට ඉදිරිපත් වුණේ. ඒ අවස්ථාවේදි 7 දෙනෙක් පත් වුණා. නමුත් එදා මෙම නීතිය තිබුණ නම් තමුන්නාන්සෙල ගරු කරන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට පක්ෂයක් හැටියට ඉදිරිපත් වන්න ඉඩක් නැහැ. තමුන්නාන්සෙලට පේනව ඇති, දැන් මෙහි තියෙන වරද. එය අපි හරිගස්සා ගනිමු. මෙම වරද හරිගස්සා ගැනීම පිණිස, මා අතුරු යෝජනාවක් සකස් කර තියෙනව. යම් දේශපාලන පක්ෂයක් ඇත්ත වශයෙන්ම ක්‍රියාත්මක වෙනවද, ජීවත්ව සිටිනවද කියන එක හෝ එය සීමා වන්නෙ බෝඩ් ලෑල්ලට පමණක්ද කියන එක පරීක්ෂා කරන්න කරුණු තියෙනව. කොමසාරිස්තුමා, ඉදිරිපිට, එම කරුණු සාක්ෂි හැටියට ඉදිරිපත් කරන්න පුළුවන් වන අන්දමට මෙය සකස් කරන ලෙස අපි ඉල්ලනව. දේශපාලන පක්ෂයක් නම් රහස් පක්ෂයක් වෙන්නෙ නැහැ. රහස් පක්ෂයක් නම් ඒ ගැන කථා කරන්න ඕනැ නැහැ. රහසින් පක්ෂ පවත්වාගෙන ගිය කාලයකුත් තිබුණා. එවැනි කාලයකදී අපි පාර්ලිමේන්තුවක් බලාපොරොත්තු වෙන්නෙ නැහැ. යුද්ධ කාලයේදී ලංකා සමසමාජ පක්ෂය නීති විරෝධි පක්ෂයක් වශයෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.]

නම් කර තිබුණා. එතකොට ඉලක්ෂන් තිබුණෙත් නැහැ. අපි කවුරුත් ඒ ගැන රණ්ඩු වුණෙත් නැහැ. ඒ යුද්ධ කාලයේදීයි. නමුත් සාම කාලයේදී මේ ප්‍රශ්නය පැන නඟිනව. පක්ෂය පවත්වාගෙන යාම පිළිබඳ තත්ත්වය සාක්ෂි අනුව පැහැදිලි කරගන්න පුළුවන්. ජනතාවගේ අදහස් අනුව පවතින පක්ෂයක්ද, පක්ෂය ප්‍රසිද්ධ වශයෙන් කරන වැඩ කටයුතු කෝසේද, බල මණ්ඩල ඇතිව කටයුතු කරන පක්ෂයක්ද, ඒ බල මණ්ඩල පත් කරන්නෙ කොහොමද, සම්මේලන පවත්වනවාද ආදි වශයෙන් කරුණු සොයා බලා ඒ සාක්ෂි අනුව පක්ෂ පිළිගැනීමට පුළුවන්. පක්ෂයේ යම් යම් රහස් තිබෙන්නත් පුළුවන්. නමුත් ප්‍රසිද්ධ වශයෙන් ප්‍රකාශයට පත් කර තිබෙන දේ අනුව බලා ගන්න පුළුවන් ඒ පක්ෂය පිළිබඳ තත්ත්වය. රහස් වශයෙන් තිබෙන දේත් වරින් වර පත්‍ර වාර්තාකරුවන්ට දැන ගන්නට ලැබෙනව. ඊළඟට පක්ෂයක් වුණොත් පක්ෂයේ පත්‍රයක් තිබෙනවද, ඒ පත්‍රය නොකඩවා පවත්වාගෙන යනවාද ආදි සාක්ෂිත් සැලකිල්ලට ගන්න පුළුවන්. අන්න ඒ විධියේ සාක්ෂි අනුව මෙ පක්ෂ පිළිගන්නවාද නැද්ද කියන ප්‍රශ්නය නිරාකරණය කර ගැනීමට අවස්ථාව සලසන්න ඕනැ.

අ. භා. 5.30

**කාරකසභා නියෝජ්‍ය සභාපති**
*(குழுக்களின் பிரதி அக்கிராசனர்)*
(Mr. Deputy Chairman of Committees)

Order, please! The Speaker will now take the Chair.

ඊට අනුකූලව කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, කථානායකතුමා මූලාසනාරූඪ විය.

**එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.**
*(திரு. எட்மன் சமரக்கொடி)*
(Mr. Edmund Samarakkody)

ගරු කථානායකතුමනි, තමුන්නාන්සේ පැමිණියේ මා කථාව අවසාන කිරීමට අදහස කරන අවස්ථාවේදියි. මීට වඩා දීර්ඝ වශයෙන් කථා කිරීමට මම බලාපොරොත්තු වෙන්නෙ නැහැ. දෙවැනි වර කියවීම පිළිබඳ විවාදයේදී පුළුල් වශයෙන් කී මේ කරුණු අඩංගු කර කාරක සභා අවස්ථාවේදී අතුරු යෝජනා දෙකක් ඉදිරිපත් කිරීමට මම බලාපොරොත්තු වෙනව.

We have two amendments to move. One is to new Section 28A, sub-section (2) in Clause 16, which reads as follows:—

"(2) Every political party which, at the general election held in the month of July, 1960, was treated as a recognized political party under this Order for the purpose of the provisions of section 29 relating to the deposit to be made by candidates shall, subject to the other provisions of this Order, be entitled to be treated as a recognized political party for the purpose of elections, if . . ."

Delete all the words from "elections if," and add the following words—

**කථානායකතුමා.**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

The hon. Member can take it up at the Committee stage.

**එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.**
*(திரு. எட்மன் சமரக்கொடி)*
(Mr. Edmund Samarakkody)

Sir, my amendment is this. Delete all the words from "elections if" in line 18 and substitute the words, "the Commissioner is satisfied that every such party conforms to the requirements of section 28 (5) (*a*)". It is there that I seek to change the words.

The other amendment I seek to bring in is something like this. Delete Sub-clause (*a*) of new Section 28A (5) up to line 32 and insert the following:

"If he is satisfied that such party has engaged and is engaging in political activity and has an independent official headquarters, and further that such party has its duly elected bodies!

[*Interruption*]. You can cut off anything you like. That is my view.

අ. භා. 5.32

**ටී. විලියම් ප්‍රනාන්දු මයා.** (නුවරඑළිය)
*(திரு. ரி. விலியம் பெர்ணண்டோ—நுவரெலியா)*
(Mr. T. William Fernando—Nuwara Eliya)

ගරු කථානායකතුමනි—

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)
කරුණා කර—

**විලියම් ප්‍රනාන්දු මයා.**
*(திரு. வில்லியம் பெர்ணாண்டோ)*
(Mr. William Fernando)

මට මේ අවස්ථාව විශෙෂයෙන් දෙන්න ඕනෑ ගරු කථානායකතුමනි, වතු ඉන්දියානුවන් රාශියක් සිටින ප්‍රදේශයකින් පෙනී සිටින මා මේ ගැන කථා කළ යුතුමයි. බුලත්සිංහල ගරු මන්ත්‍රීතුමා (එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.) "වහෙන් ඔරෝ" නොකියා—කෙළින්ම නොකියා—එක්තරා විධියකින් කියා සිටියේ වතුකරයේ සම්පූර්ණ ජනතාවටම ඡන්ද බලය දෙන්නය කියන එකයි. එහෙම නම් කන්ද උඩ රට සම්පූර්ණයෙන් විනාශ වන බව මම මේ අවස්ථාවෙදි සඳහන් කරන්න කැමතියි. ජාතියත් රටත් මක බෑ වී ගියත් බලය අල්ලා ගැනීමේ කෑදරකම නිසා, තමන්ගේ බලය තහවුරු කර ගැනීමට තිබෙන වුවමනාව නිසා, එවැනි කූට උපක්‍රම යොදා ගැනීම එතුමාගේ බලාපොරොත්තුව වෙන්න පුළුවන්. ඉන්දියානු වතු කම්කරුවන් ලවා මේ රටේ විප්ලවයක් මෙහෙය වීමට ඒ මන්ත්‍රීතුමා අදහස් කරනවාද කියා මම දන්නේ නැහැ. එවැනි අදහසක් උඩ කී කියමන් රාශියක් දැන් අපට අසන්න ලැබුණා. කවදත් විප්ලව සෝසාවක් කරන ඒ මන්ත්‍රීතුමාට මම පිළිතුරු දෙන්න යන්නේ නැහැ. ඒ මන්ත්‍රීතුමා වඩාත්ම පහර ගැසුවේ තම සගයන්ව සිටි අයටයි. එතුමන්ලා ඊට පිළිතුරු දෙනවා ඇති.

නගරබදවත්, ගම්බදවත්, ඡන්ද ලැයිස්තු සකස් කිරීම සඳහා රජයේ නිලධාරීන් ගෙයක් ගෙයක් පාසා යනවා. නමුත් වතුකරයේ ඒ කටයුත්ත ස්වාධීන බල මණ්ඩලයකට පැවරී තිබෙනවා. වෙනම ලැයිස්තුවක් වත්තේ පාලකතුමාට යවනවා. නමුත් එය සකස් කරන්නේ ඒ පාලකතුමා නොවෙයි. කිසිම වගකීමක් නැති වත්තේ සිටින කංගානි හෝ කනකපුල්ලේ හෝ එසේත් නැති නම් ලිපිකාර මහතායි. ලිපිකාර මහතාත් ඉන්දියානුකාරයෙක්. මොකක්ද, ඔවුන් කරන්නේ? කරුපය්යාගේත්, සුප්පය්යාගේත් නම් ද ගන්නවා. සියාතුගේත් පුංචිරාලගේත් නම් ඇතුළත් කරන්නේ නැහැ. ඒවා අස් කරනවා. එසේ පිළියෙළ කරන ලැයිස්තුව නිවැරදි එකක් හැටියට වත්තේ පාලකතුමා අත්සන් කරනවා. එවැනි ලැයිස්තුවලින්ද, තීරණාත්මක ඡන්දයක් ගැනෙන්නේ? ස්වාධීන ජාතියකට දෙන තීරණයකට වඩා හාත්පසින්ම වෙනස් විදියේ ඡන්ද බලයක් වතුකරයේ සිටින කංගානිලාටත් කනකපුල්ලේලාටත් ලිපිකරුවන්ටත් දෙනවා නම් එය ලක්ෂ සංඛ්‍යාත ස්වාධීන ජනතාවට කරන බලවත් වරදක් නොවේද? ඒ නිසා වතුකරයේ ඡන්ද ලැයිස්තු සකස් කිරීමත් අනිකුත් ප්‍රදේශවල මෙන්ම රජයේ නිලධාරීන් ලවා ගෙයක් ගෙයක් පාසා ගොස් ලියාපදිංචි කිරීමෙන් කරන මෙන් මම ඉල්ලා සිටිනවා. තව දුරටත් වතුකරයේ සිටින කංගානිලාටත් කනකපුල්ලේලාටත් ලිපිකරු මහත්වරුන්ටත් මේ ලැයිස්තු සකස් කරන්නට ඉඩ දී ඒවා වත්තේ සිටින සුදු සුපිරින්ටෙන්ඩන්ට් මහතුන් ලවා සහතික කිරීමට ඉඩ නොදෙන මෙන් මම ඉල්ලා සිටිනවා.

අද වතුකරයට වෙනම ස්වාධීනත්වයක් තිබෙනවා. එය ඔවුන්ගේම සමූහාණ්ඩුවක්. අපට වෙනම ආණ්ඩුවක්. වතුකරයේ සම්පූර්ණ පාලනය වත්තේ පාලකතුමා සතු වෙනවා. ඡන්ද ලැයිස්තු සකස් කිරීම මෙන්ම උප්පැන්න මරණ ලියාපදිංචි කිරීමත් කෙරෙන්නේ ඔහුගේ මාර්ගයෙනුයි. සාමාන්‍ය ජනතාවට එවැනි දේ සඳහා කරදර වී ඒ ඒ ස්ථානවලට යන්නට සිඩ වෙතත් වතුකරයේ ඉන්දියානුවන්ට ඒ සඳහා විශේෂ පහසුකම් ලැබෙනවා. එපමණක් නොවෙයි; හාල් සලාකය පිළිබඳවත්, වෙනත් සලාක පිළිබඳවත් අනිකුත් සාමාන්‍ය ජනතාවට නැති පහසුකම් හා සැනසිලි වතුකරයට ලැබෙනවා. ඡන්ද බලය ලබාගැනීම අතිනුත්, සලාක ලබා ගැනීම අතිනුත්, වෙනත් ආහාර ද්‍රව්‍ය ලබා ගැනීම අතිනුත්, සෞඛ්‍ය පහසුකම් අතිනුත්, ගර්භණී පහසුකම් අතිනුත් වතුකරයේ සිටින අයට අනික් ජනතාවට වඩා ලැබෙන පහසුකම් අපමණයි. අපේ ගම්බද සිංහල බෞද්ධ අහිංසක දුප්පත් වැසියන්ට එවැනි කිසිත් පහසුකම් නැතිව සිටියදී වතුකරයේ සිටින ඒ අයට ඒ තරම් පහසුකම් හා සැනසිලි ලැබෙද්දී ඔවුන්ට තවත් පහසුකම් දෙන්නටයි සෝසා කරන්නේ ඒ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විලියම් ප්‍රනාන්දු මයා.]

(Mr. D. B. R. Gunawardena)

අපොයි තමුන්නාන්සෙට විතරයි තේරෙන්නෙ.

**ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கௌரவ கலாநிதி என். எம். பெரேரா)*
(The Hon. Dr. N. M. Perera)

තේරෙනවා නම් ඔය විධියට කථා කරන්නෙ නැහැ නෙ. මේ වගන්තිවලින් කිසිම දේශපාලන පක්ෂයක් තහනම් කර නැහැ.

**එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.**
*(திரு. எட்மன் சமரக்கொடி)*
(Mr. Edmund Samarakkody)

තහනම් කරන්නත් බැහැ, කරන්න දෙන්නෙත් නැහැ.

**ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கௌரவ கலாநிதி என். எம். பெரேரா)*
(The Hon. Dr. N. M. Perera)

ඒ මන්ත්‍රීවරයාටත් තේරෙන්නෙ නැහැ. පෙරකදෝරු මහත්මයෙක් වෙලත් මේක තේරුම් ගන්න බැහැ. [බාධා කිරීම්] මම ඒ ගරු මන්ත්‍රීවරුන්ට මේ වගන්ති පැහැදිලි කර දෙන්නම්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கௌரவ கலாநிதி என். எம். பெரேரா)*
(The Hon. Dr. N. M. Perera)

මේ වගන්තිවලින් දේශපාලන පක්ෂවලට කිසිම බාධාවක් වෙන්නෙ නැහැ. ඒ පක්ෂවලට සහනයක් තිබෙනව.

**එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.**
*(திரு. எட்மன் சமரக்கொடி)*
(Mr. Edmund Samarakkody)

ඇයි හැම දේශපාලන පක්ෂයකටම අයිතිවාසිකම් දෙන්නෙ නැත්තෙ? සහනයත් දෙන්නෙ නැත්තෙ?

**ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கௌரவ கலாநிதி என். எம். பெரேரா)*
(The Hon. Dr. N. M. Perera)

මම හිතුවා මේ උදවිය, පාර්ලිමේන්තුව එපා කියන උදවිය, ඉලෙක්ෂන්ස් ඕනෑ කරන්නෙ නැහැයි කියන උදවිය මේවා ගැන කථා කරන එකක් නැහැයි කියලා. නමුත් අද අයිතිවාසිකම් ගැන කථා කරනව.

**එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.**
*(திரு. எட்மன் சமரக்கொடி)*
(Mr. Edmund Samarakkody)

මම කථා කරන්නෙ මගේ පක්ෂය ගැනම පමණක් නොවෙයි, අනිකුත් පක්ෂ වෙනුවෙන්; ඒ අයගේ අයිතිවාසිකම් වෙනුවෙන්.

**ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கௌரவ கலாநிதி என். எம். பெரேரா)*
(The Hon. Dr. N. M. Perera)

දැන් ඉලෙක්ෂන් එපාය කියන උදවිය අපටත් වඩා මේවා ගැන කරදර වෙනව, කථා කරනවා, අයිතිවාසිකම් ඉල්ලනව.

ගරු සභාපතිතුමනි, මෙම වගන්ති අනුව, මේ රටේ පිළිගත් දේශපාලන පක්ෂවලට යම් යම් වරප්‍රසාද ලැබෙනව. දැනට ක්‍රියා කරන පක්ෂ පිළිගත් දේශපාලන පක්ෂ වශයෙන් හැඳින්වෙනව. එම පක්ෂවලට කිසිම බාධාවක් ඇති කර නැහැ මැතිවරණයකට ඉදිරිපත් වෙන්නට. ඕනෑම දේශපාලන පක්ෂයකට මැතිවරණයකට ඉදිරිපත් වෙන්නට පුළුවනි. නමුත් ඒ පක්ෂ ගෙ නියෝජිතයන් ඉදිරිපත් කරන්නට පුළුවනි. ඒ අයට මෙම වගන්තිවලින් සහනය සැලසෙනව. නමුත් අද තිබෙන තත්ත්වය මෙන්න මේකයි. තමුන්නාන්සෙ දන්නව, ගරු සභාපතිතුමනි, ගිය මැතිවරණයට ඉස්සෙල්ල පක්ෂ 27 කින් අපේක්ෂකයන් ඉදිරිපත් කළ බව. නොයෙක් නොයෙක් වෛවාරන්‍ය පක්ෂ, හතු පිපෙන්නා වාගේ මතු වුණා. මෙයින් සෑහෙන කරදරයක් ජනතාවටත් ඇති වුනා. මැතිවරණ දෙපාර්තමේන්තුවටත් ඇති වුනා. අන්න ඒ නිසා තමයි කාරක සභාවක් පත් කර, මේවා ගැන සාකච්ඡා කර, ඒකච්ඡන්දයෙන් තීරණය කළේ, මේ මේ විධියේ කොන්දේසි දමීමෙන් මැතිවරණයක් පැවැත්වීම වඩාත් පහසුවෙන්, කරන්නට හැකිය කියා. එම කාරක සභා වේදී බැස ගන්නා තීරණ, ඇති කර ගන්නා කොන්දේසි මැතිවරණ කොමසාරිස් වරයාට ඉදිරිපත් කරන්නට ඕනෑ. එසේ කොන්දේසි ඉදිරිපත් කළේ නැතිනම් ඒ අයට නීත්‍යානුකූලව කටයුතු කිරීම අපහසුයි. ඒ අයට කුමන දේශපාලන පක්ෂ පිළිගන්නවාද, කොයි අන්දමට කටයුතු කරනවද කියා විනිශ්චයට බැසිම කළ නොහැකි දෙයක් දෙයක්. එම නිසා නීති රීති, කොන්දේසි අවශ්‍යමයි. ඒ කොන්දේසි යටතේ තමයි ඒ ඒ දේශපාලන පක්ෂවලට වරප්‍රසාද සැලසිය හැක්කේ. අන්න ඒ නිසා තමයි මෙවැනි වගන්ති සකස් කර ඇත්තේ. ඉතින්, මෙවැනි වගන්ති සකස් කිරීම වැරදිද? මෙවැනි වගන්ති 1952 දී තිබුණා නම් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට අමාරුකම්වලට මුහුණ පාන්නට වෙනවාය කී අදහස අප පිළිගන්නව. නමුත් එදා ඒ තත්ත්වය වුණාට අද එදාට වඩා දේශපාලනමය අතින් අපේ දේශපාලන පක්ෂ, අපේ රට හුඟක් ඉදිරියට ගමන් කර තිබෙනව. එම නිසයි මෙවැනි වගන්ති වගන්ති ඇතුළත් කරන්නට සිදු වී ඇත්තෙ. මේ රටේ දේශපාලන බිමෙහි සෑහෙන පක්ෂ සංඛ්‍යාවක් ඇති වී තිබෙනවා වාගේම ඒ පක්ෂ මේ රටේ සෑහෙන ප්‍රමාණයක් වැඩ කර තිබෙනව. එම නිසා ඒ පක්ෂවලට වරප්‍රසාද දිය යුතුමයි. තවද එම පක්ෂ මාර්ගයෙන් රට පාලනය කිරීමට හැකි වන තත්ත්වයට ඒ පක්ෂ දියුණු වී තිබෙනව. ඒ පක්ෂ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා]

වලට මෙයින් කිසිදු තහනමක් ඇති වෙන්නෙ නැහැ. එහෙත් වරප්‍රසාද දීමෙහිදී යම්කිසි සීමාවක් තිබිය යුතු බව පිළිගන්න ඕනෑ. අන්න ඒ නිසා කුමන දේශපාලන පක්ෂවලට වරප්‍රසාද දිය යුතුද කියා නිගමනයකට බැසීමට මෙම වගන්තිවලින් පහසුවක් සැලසෙනව. එසේ නැතුව මෙයින් කිසිම බාධාවක් කිසිම දේශපාලන පක්ෂයකට ඇති වෙන්නෙ නැහැ.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

ගරු සභාපතිතුමනි, මේ අන්දමට අවුරුදු ගණන්වලට සීමාවන් ඇති කිරීමෙන් ඇතිවන දුෂ්කරතාවය පෙන්නා දෙන්න කැමතියි. සාමාන්‍යයෙන් මැතිවරණ පැවැත්වෙන්නෙ අවුරුදු පහෙන් පහටයි. නමුත් ඔය අවුරුදු පහ ඇතුළතදී මොන මොන අන්දමේ වෙනස්කම්—පක්ෂවල කැඩීම්, අළුතෙන් පක්ෂ බිහි වීම්—ඇති වෙන්නට පුළුවන්ද? මෙම වගන්තිවල හැටියට මැතිවරණයක් පැවැත්වූවායින් පසුව අතරමගදී යම් දේශපාලන පක්ෂයක් දෙකට කැඩුණොත් ඒ පක්ෂ දෙකට අනික් මැතිවරණයේදී ඉදිරිපත් වෙන්න බැහැ. තවත් අවුරුදු පහක් බලාගෙන සිටින්න වෙනව. එතකොට සමහර විට අවුරුදු 8 ක් 9 ක් බලාගෙන සිටින්න නොවෙද ඒ පක්ෂවලට වෙන්නෙ? මේ වගන්තියෙ මූලික අදහස රටේ දේශපාලන පක්ෂ වැඩි වීම වැළැක්වීමයි. මේ ගරු සභාවට වෙනත් පක්ෂවල මන්ත්‍රීන්ගේ පැමිණීම තහනම් කිරීමයි. ඒ ප්‍රතිපත්තියට ඉඩ දෙන්න බැහැ. දේශපාලන පක්ෂ දෙකට කැඩී යන විට එක කොටසකට ඉදිරියට එන්ට බැරි වන තත්ත්වයක් මෙයින් ඇති වෙනව. මේ වගන්තිය වෙනස් කරන්ට කියා මා විශේෂයෙන්ම ඉල්ලා සිටින්නෙ ඒ නිසායි.

**අන්හැරීමට යෝජනා කරන ලද වචන වගන්තියේ කොටසක් හැටියට තිබිය යුතුය, යන ප්‍රශ්නය විමසන ලදි.**

**කටහඬවල් අනුව "පක්ෂ" මන්ත්‍රීන්ට ජය බව සභාපති විසින් ප්‍රකාශ කරන ලදි.**

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

Divide, by name!

**කාරක සභාව 48 වන ස්ථාවර නියෝගය යටතේ පක්ෂව 32; විරුද්ධව 6; යනුවෙන්—බෙදුණේය.**

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

I wanted the Division by name. I said so at the start.

**සභාපතිතුමා**
*(அக்கிராசனர்)*
(The Chairman)

The vote has already been taken. It is too late now.

**17 වන වගන්තිය කෙටුම්පත් පනතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

CLAUSE 18.—(*Amendment of section 29 of the Order in Council.*)

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**
*(கலாநிதி டப்ளியு. தகநாயக்க)*
(Dr. W. Dahanayake)

I move,

In page 26, line 22, to leave out "one thousand rupees" and insert "five hunred rupees".

You have reduuced the deposit in respect of party candidates from Rs. 1,000 to Rs. 250. I ask you to reduce the deposit in respect of candidates who do not belong to any party from Rs. 1,000 to Rs. 500.

**අන් හැරීමට යෝජනා කරන ලද වචන, වගන්තියේ කොටසක් හැටියට තිබිය යුතුය, යන ප්‍රශ්නය විමසන ලදින් සභාසම්මත විය.**

**18 වන වගන්තිය කෙටුම්පත් පණතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

**19 වන වගන්තියේ සිට 49 වන වගන්තිය තෙක් කෙටුම්පත් පණතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී**

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**
*(கலாநிதி டப்ளியு. தகநாயக்க)*
(Dr. W. Dahanayake)

I want a new clause added:

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

"During the period from nomination day to election day a candidate for election shall not have more than two election offices and not more than two party offices in the electorate he contests."

අලුත් වගන්තිය කෙටුම්පත් පණතට එකතු කළ යුතුය, යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

ආචාර්ය ඩබ්ලිව්. දහනායක
*(கலாநிதி டப்ளியு. தகனாயக்க)*
(Dr. W. Dahanayake)

I move to add another new clause :

"Voting at parliamentary elections shall be compulsory."

අලුත් වගන්තිය කෙටුම්පත් පණතට එකතු කළ යුතුය, යන ප්‍රශ්නය විමසන ලදී. කටහඬවල් අනුව "විරුද්ධ" මන්ත්‍රීන්ට ජය බව සභාපති විසින් ප්‍රකාශ කරන ලදී.

ආචාර්ය ඩබ්ලිව්. දහනායක
*(கலாநிதி டப்ளியு. தகனாயக்க)*
(Dr. W. Dahanayake)

Divide!

මන්ත්‍රී මණ්ඩලය 48 වන ස්ථාවර නියෝගය යටතේ—පක්ෂව 7; විරුද්ධව 40; යනුවෙන්—බෙදුණේය.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය කෙටුම්පත් පණතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

කෙටුම්පත් පණත, සංශෝධන සහිතව, වාර්තා කරන ලදී.

ගරු මෛත්‍රීපාල සේනානායක (ග්‍රාම හා කර්මාන්ත සංවර්ධන ඇමති)
*(கௌரவ மைத்திரிபால சேனநாயக்க—கிராம, கைத்தொழில் அபிவிருத்தி அமைச்சர்)*
(The Hon. Maithripala Senanayeke—Minister of Rural and Industrial Development)

"කෙටුම්පත් පණත, සංශෝධිතාකාරයෙන්, දැන් තුන්වන වර කියවිය යුතුය"යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

කෙටුම්පත් පණත, සංශෝධිතාකාරයෙන්, ඊට අනුකූලව තුන්වන වර කියවා සම්මත කරන ලදී.

ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා
*(கௌரவ கலாநிதி என். எம். பெரேரா)*
(The Hon. Dr. N. M. Perera)

There are a number of items which we can finish in five minutes. If the House does not mind, I should like item 7 on the Order Paper taken up.

## ඊ. පී. බ්ලැක්සන් මහතාට ව්‍යවස්ථානුගත නොවූ විශ්‍රාම වැටුපක්

## திரு. ஈ. பீ. பிளாக்சனுக்கு விசேட இளைப்பாற்றுச் சம்பளம்

## NON-STATUTORY PENSION TO MR. E. P. BLACKSON

ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා
*(கௌரவ கலாநிதி என். எம். பெரேரா)*
(The Hon. Dr. N. M. Perera)

I move,

That the payment of a pension at the rate of Rupees Six Hundred and Seventy-Five and cents Twenty (Rs. 675.20) per annum, chargeable to Head 33, Vote 2, Sub-head 22—Non-statutory pension awards granted by Resolution of Parliament, be continued with effect from 9th July, 1963, up to and including 1st August, 1964,to ex-Stoker Mechanic, Mr. E. P. Blackson (Official No. B 304) of the Royal Ceylon Navy who was discharged from the Navy with effect from 14.4.1953, on being found physically unfit for Naval Service, the disability being aggravated to a material extent by such service; and that further the payment of the pension to Mr. E. P. Blackson beyond August 1, 1964, be continued in accordance with the provisions of the Navy Pensions and Gratuities Code, 1962.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා
*(கௌரவ கலாநிதி என். எம். பெரேரா)*
(The Hon. Dr. N. M. Perera)

I should like the House to take up some of the Regulations which are non-controversial. One is item 23 which is purely formal.

## ගම්සභා ව්‍යවස්ථා

## கிராமச் சபை விதிகள்

## VILLAGE COUNCIL RULES

විවියන් ගුණවර්ධන මිය.
*(திருமதி விவியன் குணவர்தன)*
(Mrs. Vivienne Goonewardene)

ගරු කථානායකතුමනි, මෙම යෝජනාව මම ඉදිරිපත් කරනව:

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

"1961 අංක 60 දරන පනතින් සංශෝධිත ගම් සභා ආඥාපනතේ (257 වැනි අධිකාරය) 52 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තිය යටතේ මෙම මන්ත්‍රී මණ්ඩලය, පළාත් පාලන හා සවදේශ කට යුතු පිළිබඳ ඇමති විසින් එකී ආඥාපනතේ 36 (බී) (ii) සහ 52 (i) වැනි උප වගන්ති යටතේ සම්පාදනය කරන ලදුව, 1963 නොවැම්බර් 14 වැනි දින අංක 13,818 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද 1964 ජූලි මස 14 වැනි දින ඉදිරිපත් කරනු ලැබූ ව්‍යවස්ථාව අනුමත කරයි."

රජයේ සේවකයන්ට ලැබෙන්නා වගේම වරප්‍රසාද ගම්කාර්ය සභාවල ඉන්න නිල නිලධාරින්ටත් ගෙවීම සඳහායි මෙය ඉදිරිපත් කරන්නෙ.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

**විවියන් ගුණවර්ධන මිය.**
(திருமதி விவியன் குணவர்தன)
(Mrs. Vivienne Goonewardene)

ගරු කථානායකතුමනි, මෙම යෝජනාව මම ඉදිරිපත් කරනව:

"1961 අංක 60 දරන පනතින් සංශෝධිත ගම් සභා ආඥාපනතේ (257 වැනි අධිකාරය වන) 52 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තිය යටතේ මෙම මන්ත්‍රී මණ්ඩලය, පළාත් පාලන හා සවදේශ කටයුතු පිළිබඳ ඇමති විසින් එකී ආඥාපනතේ 52 (1) ජී (iii) වැනි උප වගන්තිය යටතේ සම්පාදනය කරන ලදුව, 1964 අප්‍රේල් මස 30 වැනි දින අංක 14,021 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද 1964 ජූලි මස 14 වැනි දින ඉදිරිපත් කරනු ලැබූ ව්‍යවස්ථාව අනුමත කරයි."

මේ යෝජනාවෙනුත් බලාපොරොත්තු වන්නෙ ගම්කාර්ය සභාවල සේවය කරන සේවක පිරිසටත් රජයේ දෙපාර්තමේන්තු වල සේවය කරන සේවකයන්ට වගේම නිවාඩු ලබා ගැනීමටයි.

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**
(கலாநிதி டப்ளியு. தகநாயக்க)
(Dr. W. Dahanayake)

බොහොම හොඳයි.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

## නිවාස සහ නගර සංවර්ධන සම්මතිය

## வீடமைப்பு, நகர அபிவிருத்தித் தீர்மானம்

## HOUSING AND TOWN IMPROVEMENT RESOLUTIONS

මතු පළ වන යෝජනාව සභාසම්මත විය:

"යථෝක්ත ආඥාපනත 1965 ජනවාරි මස 1 වැනි දින සිට මෙයට යා කොට ඇති උපලේඛනයේ විස්තර කෙරෙන ප්‍රදේශය තුළ වලංගු විය යුතු යයි (268 වැනි අධිකාරය වන) නිවාස සහ නගර සංවර්ධන ආඥාපනතේ 3 (ආ) වැනි වගන්තියේ විධිවිධාන යටතේ මේ සභාව තීරණය කරයි:—

### උප ලේඛනය

රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට කෝරළේ දකුණු උඩ පත්තුවේ දේවාලෙගාව, කහන්ගම සහ හොලී පිටිය යන ග්‍රාමයන්හි පිහිටියාවූ සහ පහත දැක්වෙන පරිදි මායිම් වූ සියලු ප්‍රදේශය:

උතුරට:—රජයේ වැඩ දෙපාර්තමේන්තුවට අයත් පානදුර-රත්නපුර පාරේ මැදින් උතුරට අංක 39 දරන සැතපුම් කණුව අසළින් දම් වැල් 4ක ලක්ෂ්‍යයක සිට රත්නපුර නගර සභා ප්‍රදේශයේ බටහිර සීමාව හමුවන තුරු එකී පාරේ මධ්‍ය රේඛාවට සරල සමාන්තරව සහ දම්වැල් 4ක් දුරින් අඳිනලද රේඛාවක් ඔස්සේ නැගෙනහිර දෙසට අඳින ලද රේඛාවකින් ද,

නැගෙනහිරට:—අන්තිමට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට, එකී නගර සභා සීමාව ඔස්සේ රජයේ වැඩ දෙපාර්තමේන්තුවට අයත් පානදුර-රත්නපුර පාර හරහා කළු ගඟේ මධ්‍ය රේඛාවේ ලක්ෂ්‍යයක් දක්වා නිරිත දෙසට අඳින ලද රේඛාවකින්ද,

දකුණට:—අන්තිමට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට (සබරගමු) අංක 235 දරන අවසන් ගම් සැලැස්මේ අංක 19 දරන කට්ටිය හා කළු ගඟේ දකුණු ඉවුරද කැපී යන ලක්ෂ්‍යයෙන් දකුණු දෙසට අඳින ලද රේඛාවක් හමුවන තුරු කළු ගඟේ මධ්‍ය රේඛාවක් ඔස්සේ බටහිර දෙසට අඳින ලද රේඛාවකින් ද,

බටහිරට:—අන්තිමට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට ඍජු රේඛාවක් ඔස්සේ, ප්‍රදේශයේ උතුරු සීමාවේ ආරම්භක ලක්ෂ්‍යය දක්වා උතුරු දෙසට අඳින ලද රේඛාවකින් ද වේ."—[විවියන් ගුණවර්ධන මිය.]

මතු පළ වන යෝජනාව සභාසම්මත විය:

"යථෝක්ත ආඥාපනත 1965 ජනවාරි මස 1 වැනි දින සිට මෙයට යා කොට ඇති උපලේඛනයේ විස්තර කෙරෙන ප්‍රදේශ තුළ වලංගු විය යුතු යයි (268

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වැනි අධිකාරය වන) නිවාස සහ නගර සංවර්ධනය පිළිබඳ ආඥාපනතේ 3 (ආ) වැනි වගන්තියේ විධිවිධාන යටතේ මේ සභාව තීරණය කරයි :—

## උප ලේඛනය

සබරගමු පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට කෝරළේ දකුණු උඩ පත්තුවේ හිදෙල්ලන, අමුනාගොඩ සහ තෙපුලන්ගොඩ (කොටසක්) යන ග්‍රාමයන්හි පිහිටියාවූ සහ පහත දක්වෙන පරිදි මායිම් වූ සියලු ප්‍රදේශය :—

උතුරට :—කොළඹ-රත්නපුර පාරේ මධ්‍ය රේඛාවට සරල සමාන්තරව හා දම්වැල් 4ක් දුරින් අඳින ලද රේඛාවක් සබරගමුවේ අංක 229 දරන අවසන් ගම් සැලැස්මේ අංක 32 යනුවෙන් බෙදා වෙන් කොට ඇති මහා ඇලේ වම් ඉවුරෙන් කැපී යන ලක්ෂ්‍යයේ සිට එකී ඇලේ වම් ඉවුර ඔස්සේ එකී පාර හරහා යන තෙපුලන්ගොඩ දොළේ, (අංක 339ඒ දරන අවසන් ගම් සැලැස්මේ අංක 32 දරන කට්ටිය) වම් ඉවුර ඔස්සේ එකී පාරේ මධ්‍ය රේඛාවෙන් නැගෙනහිරට දම්වැල් 4ක ලක්ෂ්‍යයක් දක්වා නැගෙනහිර දෙසට අඳින ලද රේඛාවකින් ද,

නැගෙනහිරට : අන්තිමට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට දකුණු දෙසට රත්නපුර නගර සභා ප්‍රදේශයේ උතුරු සීමාව හමු වන තුරු කොළඹ-රත්නපුර පාරේ මධ්‍ය රේඛාවට සරල සමාන්තරව හා දම්වැල් 4 ක් දුරින් අඳින ලද රේඛාවකින් ද,

දකුණට : අන්තිමට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට කොළඹ-රත්නපුර පාර හරහා එකී පාරේ මධ්‍ය රේඛාවෙන් දම්වැල් 4 ක ලක්ෂ්‍යය දක්වා නගර සභාවේ උතුරු සීමාව ඔස්සේ බටහිර දෙසට හා නිරිත දෙසට අඳින ලද රේඛාවකින් සහ

බස්නාහිරට : අන්තිමට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට හිදෙල්ලන-කරපිංච පාරේ මධ්‍ය රේඛාවට සරල සමාන්තරව හා දම්වැල් 4ක් දුරින් අඳින ලද රේඛාවක් හමුවන තුරු කොළඹ-රත්නපුර පාරේ මධ්‍ය රේඛාවට සරල සමාන්තරව හා දම්වැල් 4ක් දුරින් උතුරු දෙසට ද, එතැන් සිට හිදෙල්ලන ග්‍රාමයේ බටහිර සීමාව හමුවන තුරු හිදල්ලන-කරපිංච පාරේ මධ්‍ය රේඛාවටද සරල සමාන්තරව සහ දම්වැල් 4 ක් දුරින් අඳින ලද රේඛාවක් ඔස්සේ බටහිර දෙසටද, එතැන් සිට එකී පාරේ මධ්‍ය රේඛාවෙන් දම්වැල් 4ක ලක්ෂ්‍යයකට ලඟාවන තුරු එකී ග්‍රාමයේ එකී සීමාව ඔස්සේ එකී පාර හරහා සහ අංක 342 දරණ අවසන් ගම් සැලැස්මේ අංක 1 දරන කට්ටියේ බටහිර මායිමේ උතුරු දෙසට දික් වීම ඔස්සේ ඊසාන දෙසට හා උතුරු දෙසටද, එතැන් සිට, කොළඹ-රත්නපුර පාරේ මධ්‍ය රේඛාවට සරල සමාන්තරව සහ දම්වැල් 4 ක් දුරින් අඳින ලද රේඛාවක් හමුවන තුරුද, එකී පාරේ මධ්‍ය රේඛාවට සරල සමාන්තරව හා දම්වැල් 4ක් දුරින් අඳින ලද රේඛාවක් ඔස්සේ නැගෙනහිර දෙසට ද, එතැන් සිට පසුව සඳහන් කළ සරල සමාන්තර රේඛාව ඔස්සේ ප්‍රදේශයේ උතුරු සීමාවේ ආරම්භක ලක්ෂ්‍යය දක්වා උතුරු දෙසටද අඳින ලද රේඛාවකින් වේ."—[විවියන් ගුණවර්ධන මිය.]

**මතු පළ වන යෝජනාව සභාසම්මත විය :**

"1965 ජනවාරි මස 1 වැනි දින සිට, මීට යා කොට ඇති උප ලේඛනය මගින් විස්තර කර ඇති ප්‍රදේශය තුළ (268 වැනි අධිකාරය වන) නිවාස සහ නගර සංවර්ධන ආඥාපනත බලංගු විය යුතු බවට ඉහතකී ආඥා පනතේ 3(ආ) දරන වගන්තියේ විධිවිධාන යටතේ මෙම මන්ත්‍රී මණ්ඩලය සම්මත කරයි.

## උප ලේඛනය

සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට කෝරළේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ මැද පත්තුවේ කිරිඇල්ල ග්‍රාමයේ පිහිටියාවූද, පහත සඳහන් පරිද් දෙන් මායිම්වූද ප්‍රදේශයේ සියළුම කොටස.

උතුරට : පානදුර රත්නපුර පාරේ මධ්‍යම රේඛාවට යාර 220 ක් දුරින් හා ඊට සරළ සමාන්තරව අඳින ලද රේඛාවක් එකී පාරේ අංක 31/1 දරන බෝක්කුවේ මැද සිට උතුරු දිසාවට අඳින ලද රේඛාවක් සමග කැපී යන ලක්ෂ්‍යයක සිට, එකී සරල සමාන්තර රේඛාව ඔස්සේ එය (182 සබර අ. ග. සී.) හල් දොළේ මධ්‍ය රේඛාව සමග කැපී යන තුරු ඊශාන දෙසට අඳින ලද රේඛාවකින් ද,

නැගෙනහිරට : අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට පානදුරේ-රත්නපුරේ පාරේ මැද සිට යාර 200ක් දුරින් හා ඊට සරල සමාන්තරව අඳින ලද රේඛාවක් ඔස්සේ, එය එකී පාරේ අංක 31/12 දරණ බෝක්කුවේ මැද සිට නැගෙනහිර දෙසට අඳින ලද රේඛවක් සමග කැපී යන ලක්ෂ්‍යය දක්වා ගිණි කොණ දෙසට ද, දකුණු දෙසටද,

දකුණට : අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට ඉහතින් සඳහන් කරන ලද බෝක්කුවේ මැද දක්වා බටහිර දෙසටද, එතැන් සිට පාරවල් සන්ධි වන ස්ථානයේ මැද සිට (සබර) 182 අ.ග.පි. 281 යන ඉඩම් කට්ටියේ ගිණිකොන කෙළවර දක්වා වූ සෘජු රේඛාවකින් ද, එතැන් සිට එකී පිඹුරේ 354 වැනි ඉඩම් කට්ටිය වශයෙන් පෙන්නුම් කර ඇති පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ, එය රදාඇලේ මධ්‍යම රේඛාව සමග කැපී යන ස්ථානය දක්වා නැගෙනහිර දෙසට අඳින ලද රේඛාවකින් ද,

බටහිරට : අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට, පානදුර-රත්නපුර පාරේ අංක 31/1 දරන බෝක්කුවේ මැද දක්වා ඊශාන දෙසටද, එතැන් සිට ප්‍රදේශයේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

උතුරු සීමාවේ ආරම්භක ලක්ෂ්‍යය දක්වා උතුරු දෙසටද, අඳින ලද ලද රේඛාවකින්ද වේ.—[විවියන් ගුණවර්ධන මිය.]

**මතු පළ වන යෝජනාව සභාසම්මත විය.**

"1955 ජනවාරි මස 1 වැනි දින සිට, යථෝක්ත ආඥාපණත මීට යාකොට ඇති උප ලේඛනයේ විස්තර කරනු ලබන ප්‍රදේශ ඇතුළත වලංගු විය යුතු යයි (268 වැනි අධිකාරය වන) නිවාස හා නගර සංවර්ධන ආඥාපණතේ 3 (ආ) වගන්තිය යටතේ, මෙම මන්ත්‍රී මණ්ඩලය සම්මත කරයි.

## උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කඩවත කෝරළේ තලාපිටිගම් පත්තුවේ, බෙලිහුල් ඔය, යක්දෙහිවල (කොටසක්) ගලරාම, පහළ ගලගම, බිබිලෙ හා බෝගහකුඹුරුවෙල ගම්වල පිහිටියා වූද,

පහත දැක්වෙන පරිදි මායිම් වූද සියළුම ප්‍රදේශය:—

බටහිරට: (සබරගමුවේ) අංක 646 දරණ අවසාන ගම් සැලැස්මේ අංක 26 දරණ කැබැල්ලේ ඊශාන දෙසින් නිරිත දෙසට දම්වැල් 4ක් දුරින් බෙලිහුල් ඔයේ වම් ඉවුරේ ලක්ෂ්‍යය සිට, උතුරු දෙසට හා ඊසාන දෙසට සරල සමාන්තරව හා බලංගොඩ-හපුතලෙ රජයේ වැඩ දෙපාර්තමේන්තුවට අයත් පාරේ මධ්‍ය රේඛාවෙන් දම්වැල් 4ක් දුරින්ද, එය, (සබරගමුව) අංක 647 දරණ අවසාන ගම් සැලැස්මේ 30 දරණ අංකයෙන් කැබලි කොට ඇති සුළු මාර්ගයෙන් බටහිර කෙළවර හමුවන තුරුද,

උතුරට: අවසන් වරට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට, ඊශාන දෙසටද, ගිණිකොණ දෙසටද බලංගොඩ-හපුතල පාරේ මධ්‍ය රේඛාවට දම්වැල් 4ක දුරකින් හා සරල සමාන්තරව ද, අඳින ලද රේඛාවක් ඔස්සේ, එය (සබර) අංක 643 දරණ අවසාන ගම් සැලැස්මේ 52 දරන අංකයෙන් කැබලි කොට ඇති, මාදම්පිටිය ඇලේ දකුණු ඉවුරු හමුවන තුරුද,

නැගෙනහිරට: අවසන් වරට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට දකුණු දෙසට, බලංගොඩ-හපුතලේ පාරේ මධ්‍ය රේඛාවට දම්වැල් 4ක දුරකින් හා සරල සමාන්තරවද, අඳින ලද රේඛාවක් ඔස්සේ, එය, ඇට්ලන්වා වතු පාරේ බටහිර කෙළවර හමුවන තුරුද,

දකුණට: අවසන් වරට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට, බලංගොඩ-හපුතල පාර හරහා බටහිර දෙසට වැටෙන ඍජු රේඛාවකින් එහි පාරේ මැද සිට දම්වැල් 4ක දුරකින් හා සරල සමාන්තරවද, එතැන් සිට, වයඹ දෙසට හා නිරිත දෙසට බලංගොඩ-හපුතල පාරේ මධ්‍ය රේඛාවට දම්වැල් 4ක දුරකින් හා සරල සමාන්තරව ද, අඳින ලද රේඛාවක් ඔස්සේ, එය (සබර) අංක 646 දරණ අවසන් ගම් සැලැස්මේ අංක 26 දරණ ඊශාන දිග කෙළවරින් නැගෙනහිර දෙසට වැටෙන සේ, අඳින ලද රේඛාවක් හමුවන තුරුද, එතැන් සිට බටහිර දෙසට වැටෙන ඍජු රේඛාවකින් එකී කැබැල්ලේ ඊශාන කෙළවරටද, එතැන් සිට, නිරිත දෙසට සහ බටහිර දෙසට බෙලිහුල් ඔයේ වම් ඉවුර ඔස්සේ ප්‍රදේශයේ බටහිර සීමාවේ ආරම්භක ලක්ෂ්‍යය දක්වාද අඳින ලද රේඛාවකින් වේ."—[විවියන් ගුණවර්ධන මිය.]

## කල් තැබීම

### ஒத்திவைப்பு

### ADJOURNMENT

**යෝජනාව ඉදිරිපත් කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදි: "මන්ත්‍රී මණ්ඩලය දැන් කල් තැබිය යුතුය."—[ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා.]**

අ. භා. 6.55

**කේ. එම්. පී. රාජරත්න මයා.**

*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*

(Mr. K. M. P. Rajaratna)

ගරු කථානායකතුමනි, ගරු අධ්‍යාපන ඇමතිතුමාගෙන් ප්‍රශ්නයක් අහන්නට තිබෙනවා. ගරු අධ්‍යාපන ඇමතිතුමා දන්නවා ඇති මේ වන තුරු ලංකා විශ්ව විද්‍යාල ප්‍රවේශ විභාගයට ඉදිරිපත්වන ශිෂ්‍යයින්ට එක වතාවක් පාසැලෙන් නොමිලේ ඉදිරිපත් වන්නට ඉඩ තිබුණ බව. දෙවෙනි වතාවට ඉදිරිපත් වන අයට මේ වන තුරු ගෙවන්නට තිබුණේ රුපියල් 60 යි. නමුත් මේ අවුරුද්දේ සිට කලා ශිෂ්‍යයින්ට ඒ රුපියල් හැට දෙගුණ කර රුපියල් 120 ක් ගෙවන්න නියම කර තිබෙනවා. විද්‍යා ශිෂ්‍යයින්ට රුපියල් 140 ක් ගෙවන්න නියම කර තිබෙනවා. මේ අවුරුද්දේ සිට විශ්ව විද්‍යාල ප්‍රවේශ විභාගය අහෝසි කර ජී. සී. ඊ. ඉහළ පෙළ විභාගය අනුව ඇතුළත් කර ගන්නවා. ඒ කියන්නේ ජී. සී. ඊ. ඇඩ්වාන්ස් ලෙවල් කියන විභාගයෙන්. එංගලන්තයේ ජී.සී.ඊ. ඉහළ පෙළ අනුව විශ්ව විද්‍යාලයට ඇතුළු වන විට රුපියල් 120 ක් ගන්නවා. ඒ අනුව මෙහිත් මුදල වැඩි කර තිබෙනවා. මෙක දුප්පත් ශිෂ්‍යයින්ට ලොකු අසාධාරණයක්. පහසුකම් නැති නිසා ගම්බද පාසැල්වල ළමයින්ට පළමු වරම විශ්ව

Digitized by Noolaham Foundation. noolaham.org | aavanaham.org

විද්‍යාලයට ඇතුළු වීමට පුළුවන් කමක් නැහැ. ඔවුන්ට විශ්ව විද්‍යාලයට ඇතුළු වීමට අවුරුද්දක් දෙකක් ගත වෙනවා. දුප්පත් දෙමව්පියන්ට මේ සඳහා රුපියල් 120ක් 140ක් ගෙවන්න අමාරුයි.

විද්‍යෝදය හා විද්‍යාලංකාර විශ්ව විද්‍යාල වලට ඇතුළුවීමේදීත් පළමු වැනි වතාව නොමිලයේයි. දෙවැනි තුන් වැනි වතාවලට අය කරන්නේ රුපියල් 10 යි. නමුත් ලංකා විශ්ව විද්‍යාලය මගින් රුපියල් 60ක් අය කළා. දැන් රුපියල් 120ක් අය කරන්න යනවා. විද්‍යාලංකාර හා විද්‍යෝදය විශ්ව විද්‍යාල දෙකෙත් ලංකා විශ්ව විද්‍යාලයෙත් වෙනසක් තිබෙන්නේ මොකක්ද? එකම වියදමයි යන්නේ. මේ හැම එකකම ඇතුළුවීමේ විභාගයට විෂය යන් 4 කට පෙනී සිටින්න ඕනෑ. මේ හැම විශ්ව විද්‍යාලයකම විභාග පරීක්ෂා කරන උදවිය සිටිනවා, විභාග උත්තර පත්තර බලන උදවිය සිටිනවා. එහෙම තිබියදීත් විද්‍යෝදය හා විද්‍යාලංකාර විශ්ව විද්‍යාලවල අය කරන්නේ රුපියල් 10 යි. එහෙම නම් ලංකා විශ්ව විද්‍යාලයේ පමණක් එම ගණන් රුපියල් 120 දක්වාත් රුපියල් 140 දක්වාත් වැඩි කර තිබෙන්නේ ඇයි? එම නිසා ඔබතුමාගේ බලය පාවිච්චි කර නැවත කලින් තිබුණු තත්ත්වයටම ගෙනෙන්න. නැත්නම් විද්‍යෝදය හා විද්‍යාලංකාර විශ්ව විද්‍යාලවල තත්ත්වයට ගෙනෙන්න. [බාධා කිරීමක්] ලංකා විශ්ව විද්‍යාලයේ පමණක් ප්‍රවේශ විභාගයට රුපියල් 120ක් හා 140ක් ගන්නේ මක් නිසාද? අනික් විශ්ව විද්‍යාලයත් එම විශ්ව විද්‍යාලයත් අතර තිබෙන අසමාන කම මොකක්ද? ඒ නිසා අනික් විශ්ව විද්‍යාල දෙකේ මෙන් රුපියල් 10 දක්වා අඩු කරන්නට බැරි නම් කලින් තිබුණු තත්ත්වයටවත් ගෙනෙන්නටය කියා මා තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා. ඔබතුමාගේ බලය පාවිච්චි කර මේ තත්ත්වය හරිගස්වන්නය කියා මා ඉල්ලා සිටිනවා.

**ජේ. ඩී. වීරසේකර මයා.** (කොත්මලේ)
*(திரு. ஜே. டீ. வீரசேக்கர—கொத்மலே)*
(Mr. J. D. Weerasekera—Kotmale)

ගරු කථානායකතුමනි, තමුන්නාන්සේගේ සැලකිල්ලට භාජන කිරීම සඳහා කරුණක් ඉදිරිපත් කරන්නට තිබෙනවා. මා කියන්නට යන්නේ අද "ලංකාදීප" පත්තරයේ තිබුණු කාරණයක් ගැනයි. විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා මේ අවස්ථාවේ සභාවේ නොසිටීම ගැන කනගාටුයි. එපමණක් නොවෙයි, එක්සත් ජාතික පක්ෂයේ එක ගරු මන්ත්‍රීවරයෙක්වත් නැහැ. මේ කාරණය ලංකාදීප පත්‍රයෙයි තිබෙන්නේ. "මැති ඇමතිවරුන් වැඩ කරන්නේ ඔවුන්ගේම සංවර්ධනයටයි' කියා තිබෙනවා මේ ප්‍රකාශය කර තිබෙන්නේ වැලිගම කොට්ඨාශයේ එක්සත් ජාතික පක්ෂයේ තරුණ පෙරමුණේ නව කාර්යාලයක් විවෘත කිරීමේ උත්සවයකදී ඩඩ්ලි සේනානායක මහත්මයායි.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

Are you raising it as a matter of Privilege?

**ජේ. ඩී. වීරසේකර මයා.**
*(திரு. ஜே. டீ. வீரசேக்கர)*
(Mr. J. D. Weerasekera)

Yes.

**වෛද්‍යාචාර්ය නාගනාදන්**
*(டொக்டர் நாகநாதன்)*
(Dr. Naganathan)

How can you?

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

The hon. Member should have informed me in my Chambers.

**ජේ. ඩී. වීරසේකර මයා.**
*(திரு. ஜே. டீ. வீரசேக்கர)*
(Mr. J. D. Weerasekera)

ගරු කථානායකතුමනි, එය මේ ගරු සභාවට දැනගැනීම සඳහා කියන්න කැමතියි.

**එකල්හි වේලාව අ.භා. 7 වූයෙන්, ප්‍රශ්නය නොවිමසන ලදුව මන්ත්‍රී මණ්ඩලය කල් තැබීමේ යෝජනාව අහෝසි විය.**

**යෝජනාව යළිත් ඉදිරිපත් කරන ලදින්, ප්‍රශ්නය සභානිමුඛ කරන ලදි: "මන්ත්‍රී මණ්ඩලය එක් කල් තැබිය යුතුය."**—[ගරු සී. පී. ද සිල්වා.]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ජේ. ඩී. වීරසේකර මයා.
(திரு. ஜே. டீ. வீரசேக்கர)
(Mr. J. D. Weerasekera)

එම ප්‍රවෘත්ති පත්‍ර වාර්තාවේ මෙහෙම සඳහන් වෙනව :

"......මේ රජයේ මැති ඇමතිවරු රටේ සංවර්ධනයට වැඩ නොකළත් ඔවුන්ගේ සංවර්ධනයට සියලු වැඩ කටයුතු කරගෙන ඇති බවද පැවසිය."

මෙම ප්‍රකාශය විග්‍රහ කරනව නම් මා ඊට කැමතියි. ඒකෙ තේරුම මොකක්ද? අපි අල්ලස් ගන්නවලු ; දූෂණ කරනවලු. [බාධා කිරීම්] එහෙම කියන්න කරුණු තියෙනව නම් එහෙම නරක වැඩ කරන කෙනෙක් සිටිනව නම්, කෙළින්ම නම් ගම් ඉදිරිපත් කර ප්‍රකාශ කරන්න. එසේ ක්‍රියා කරන මන්ත්‍රීවරය හරි ඇමතිවරය හරි නම් වශයෙන් ඉදිරිපත් කරන්න. එසේ නොකර ආණ්ඩු පක්ෂයෙ සැමදෙනාටම මෙවැනි චෝදනා එල්ල කිරීම විරුද්ධ පාර්ශ්වයෙ නායකතුමා වැනි උසස් පෙළේ දේශපාලනඥයකුගෙන් කෙරියයුතු වැඩක් හැටියට මා නම් පිළිගන්නෙ නැහැ. මෙවැනි කනගාටුදායක සිද්ධින් මින් මත්තටවත් සිදු නොවීමට [බාධා කිරීම්]——

කථානායකතුමා
(சபாநாயகர்)
(Mr. Speaker)

I do not think it is a matter of privilege. It is not a matter of privilege.

ජේ. ඩී. වීරසේකර මයා.
(திரு. ஜே. டீ. வீரசேக்கர)
(Mr. J. D. Weerasekera)

ගරු කථානායකතුමනි, මට මතකයි එක සැරයක් අපේ ගරු මුදල් ඇමතිතුමා "පුදුම සත්තු"ය කියා ප්‍රකාශ කළාම එය වරප්‍රසාද කඩ කිරීමක් හැටියට මේ ගරු සභාවෙ එදා ප්‍රකාශ කළ බව. 1952 මහ මැතිවරණයෙන් පසුවයි, එම සිද්ධිය වුණේ. එසේ නම් මෙවැනි ප්‍රකාශ අසාධාරණ අයුතු විධියට කිරීම සාධාරණද ?

ආචාර්ය ඩබ්ලිව්. දහනායක
(கலாநிதி டப்ளியு. தகனாயக்க)
(Dr. W. Dahanayake)

Mr. Speaker, there are two questions which I wish to raise with the Hon. Minister of Finance, very briefly.

The first one deals with the Saman Press at Maharagama. We learn that the Saman Press at Maharagama which is a modern press is about to be sold and we also learn that a private individual proposes to get a loan of about 7 lakhs of rupees from the People's Bank in order to purchase this Press. Instead of giving a loan of Rs. 7 lakhs to a private indidual, I would suggest to the Hon. Minister of Finance that the Government should acquire the Saman Press. I make this request because the Government has its scheme of printing various school books, text books and lesson books and various copybooks, so that, they may be given to schools at cost price or on a subsidized basis, and if they have the Saman Press it would help the Government Printing Press to do the work faster and better.

My second question deals with a quarrel that has arisen between the Controller of Exchange and the Principal Collector of Customs. From the 15th of May the export of precious stones from Ceylon to various countries like Japan and Germany has come to a ful stop.

වෛද්‍යාචාර්ය නාගනාතන්
(டொக்டர் நாகநாதன்)
(Dr. Naganathan)

Why ?

ආචාර්ය ඩබ්ලිව්. දහනායක
(கலாநிதி டப்ளியு. தகனாயக்க)
(Dr. W. Dahanayake)

There are appraisers attached to the Customs who are now refusing to do their work. These appraisers attached to the Customs Department, as a result of a quarrel, a point of difference, that arose, somewhere in May, are refusing to do the work which they had done during the last several years.

වෛද්‍යාචාර්ය නාගනාතන්
(டொக்டர் நாகநாதன்)
(Dr. Naganathan)

Why ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආචාර්ය ඩබ්ලිව්. දහනායක
*(கலாநிதி டப்ளியு. தகநாயக்க)*
(Dr. W. Dahanayake)

The Principal Collector of Customs says that the work of valuing the parcels of precious stones that are to be sent out should be done by the Department of the Controller of Exchange. The Controller of Exchange, on his side, says that that is not his work and that he has not got the men to do that work. While this dispute goes on between the two of them, those who want to export precious stones to countries like Japan and Germany are unable to do so. From the 15th of May to-date, I calculated the country has lost at least Rs. 2 million worth of exchange which the country would have got for itself if the parcels that were tendered to the Customs had been duly valued and despatched to such countries as Japan and West Germany.

Now, Mr. Speaker, this is a very serious matter. There are a large number of people involved, and I have given the the Hon. Minister of Finance the names of two people whose parcels have been held up in this way. I hope the Hon. Minister will look into this question at once and settle the difference between the two departments and see that these parcels are despatched because they bring in much needed exchange to the country.

There is one question which I wish to raise with the Hon. Minister of Education. There are disquieting rumours that the Education Department proposes to carry out what they call certain schemes of re-organization even before the White Paper is discussed in Parliament and before any laws are enacted. It must be clearly understood that the authority on the question of how the educational set-up in this country should be reorganized is the Parliament and not the Department of Education. First of all, we must have an opportunity of discussing the White Paper. Thereupon the Government can bring forward its proposals in the form of a Bill. I do hope that the Hon. Minister of Education will give us a guarantee that no so-called schemes of re-organization will be put into effect before such schemes are discussed by Parliament. I do not want to criticize any schemes but the public has a lot to say about the way in which the department officials are setting about their work and as a result there is great deal of discontent among the parents. I am sure that the Hon. Minister of Education will recognize this fact that before any re-organization schemes are put into effect Parliament would have its say on the matter.

අ. භා. 7.7

පර්සි වික්‍රමසිංහ මයා. (කඹුරුපිටිය)
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ—கம்புறுப்பிட்டிய)*
(Mr. Percy Wickremasinghe—Kamburupitiya)

ගරු මුදල් ඇමතිතුමාගෙ අවධානයට යොමුකිරීම සඳහා ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්න තියෙනව. මා පළමුවෙන්ම කියන්න කැමතියි, අද ලංකාවෙ තියෙන රබර් වතු වහන්න සිදු වී තිබෙන බව. අවුරුද්දක පමණ කාලයක සිට ශීට් රබර් රාත්තලක මිල ශත 80ත් 90ත් අතර ගණනකයි තියෙන්නෙ. මේ හේතුවෙන් අද මාතර දිස්ත්‍රික්කයෙ රබර් වතු බොහොමයක් වහන්නයි සිදු වී තියෙන්නෙ, කම්කරුවන්ට නියම වේතනය දෙන්න බැරිකම නිසා. මේ පිළිබඳව මීට ප්‍රථම මෙම සභාවෙ ප්‍රශ්න කළ අවස්ථාවෙදි එවකට සිටි කෘෂි කර්ම ඇමතිතුමා පිළිගන්න, අඩු වශයෙන් රබර් රාත්තලක මිල රුපියලක් වත් නූනොත් නියම වේතනය කම්කරුවන්ට ගෙවන්න තත්ත්වයක් ඇති වන්නෙ නැත කියා. මා මුදල් ඇමතිතුමාට දොස් කියනව නොවෙයි, මේ ලෝක වෙළඳ පොලේ මිල ගණන් අනුවයි, එම මිල අඩු වැඩි වීම රඳා පවතින්නෙ. කොතරම් දුෂ්කරතාවක් තිබුණත් තීරු ගාස්තු මගින් රබර් මිල අඩු වශයෙන් රුපියල් එකක ප්‍රමාණයෙන්වත් තබාගන්න පුළුවන් තත්ත්වයක් තියෙනව. එම නිසා මේ ගැන කල්පනා කර රබර් රාත්තලක මිල අඩු වශයෙන් රුපියලක තත්ත්වයටවත් තබා ගැනීමෙ වැඩ පිළිවෙළක් සලස්වනවද ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පර්සි වික්‍රමසිංහ මයා.]

ඊළඟට ඉඩම් ඇමතිතුමාගෙන් ප්‍රශ්න යක් අහන්න තියෙනව. එතුමාගෙ අමාත්‍යංශයෙ පාර්ලිමේන්තු ලේකම්තුමා පමණයි දැන් ඉන්නෙ. එතුමාට මා කියනව ගරු ඇමතිතුමා වෙත මෙම කාරණය ඉදිරි පත් කරන ලෙස. පසුගිය දිනවල මට ඉඩම් අමාත්‍යාංශයෙන් ලිපියක් ලැබුණා. උඩ වලවේ යෝජනා ක්‍රමයෙ ඉඩම් කොටස් වගයක් දැනටමත් බෙදා දෙන්න වෙන් කර තිබෙනව ; නමුත් මාතර දිස් ත්‍රික්කයට එහි අයිතියක් ලැබෙන්නෙ නැත කියන එකයි, එම ලිපියෙන් පෙනෙන්නෙ චන්ද්‍රිකා වැව ප්‍රදේශයෙ ඉඩම් කට්ටි 285 යි මාතර දිස්ත්‍රික්කයට ලැබුණෙ. අද ඉඩම් නැති ප්‍රශ්නය මාතර දිස්ත්‍රික්කයට බරපතල ප්‍රශ්නයක් වෙලයි තියෙන්නෙ. උඩ වලවේ යෝජනා ක්‍රම යෙන් මාතර දිස්ත්‍රික්කයෙ ජනතාව ඉඩම් ඉල්ලා තියෙනව. අමාත්‍යාංශය කියනව ලබන වර්ෂයෙදි සලකා බලනවය කියා. දැනටමත් උඩ වලවේ යෝජනා ක්‍රමයෙන් ඉඩම් වෙන් කර තිබෙනව නම් ඒ කුමන ප්‍රදේශ සඳහාද කියා මා අහනව. එසේම මාතර දිස්ත්‍රික්කයටත් මේ අයිතිවාසිකම දෙනවාද කියා පැහැදිලි වශයෙන් පිළිතුරක් දෙන ලෙස මා ඉල්ලා සිටිනව.

**එම්. සිවසිතම්පරම් මයා.**

*(திரு. எம். சிவசிதம்பரம்)*

(Mr. M. Sivasithamparam)

Mr. Speaker, I wish to bring to the notice of the Hon. Minister of Agriculture, Food and Fisheries, that about thousand workers who were in the habit of working at the Kankesanturai harbour unloading food cargo ships have been unemployed because the Food Ministry has not diverted any ships during the last month or so to Kankesanturai harbour. I think it was almost the habit in the past to at least send one ship to the Kankesanturai harbour; and I think it must be said to the credit of the workers of the Kankesanturai harbour that they almost created a world record in the discharge of cargo from ships in spite of the very adverse conditions prevailing in that harbour.

I would ask the Hon. Minister to see that he continues the old habit of sending at least one ship every month to the Kankesanturai harbour, whereby the Government naturally would be saving because all the food sent by train from Colombo to Kankesanturai, Jaffna and other adjoining areas, could be sent by ship to Kankesanturai. This would not only result in a saving to the Government but about five to six hundred people will also be usefully employed, and every body will be happy.

**ගරු පී. බී. ජී. කලුගල්ල (අධ්‍යාපන ඇමති)**

*(கௌரவ பீ. பி. ஜீ. கலுகல்ல—கல்வி அமைச்சர்)*

(The Hon. P. B. G. Kalugalla—Minister of Education)

කථානායකතුමනි, වැලිමඩ ගරු මන්ත්‍රී තුමා (කේ. එම්. පී. රාජරත්න මයා.) ඇසූ ප්‍රශ්නය ගැන සොයා බැලීමට මම පොරොන්දු වෙනව.

ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය ඩබ්ලිව්. දහනායක) ප්‍රශ්නයක් නගා සඳ හන් කළා, ධවල පත්‍රිකාවේ තිබෙන යෝජනා ගැන සාකච්ඡා කරන්නට ප්‍රථම ක්‍රියාත්මක කරන්න යන බවට සැකයක් තිබෙනවය කියා. ධවල පත්‍රිකාවෙ තිබෙන යෝජනා අධ්‍යාපනය සම්බන්ධයෙන් මුළු රටටම බල පාන යෝජනා නිසා පාර්ලි මේන්තුවේ ඒ ගැන විවාදයක් නොකර, ගරු මන්ත්‍රීවරුන්ගේ අදහස් නොවිමසා ඒ යෝජනා ක්‍රියාත්මක කරන්න මම බලා පොරොත්තු වන්නෙ නැති බව මම කියන්න කැමතියි.

**ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා (මුදල් ඇමති)**

*(கௌரவ கலாநிதி என். எம். பெரேரா—நிதி அமைச்சர்)*

(The Hon. Dr. N. M. Perera—Minister of Finance)

The hon. Member for Galle (Dr. W. Dahanayake) was kind enough to give me timely notice about the two questions he was going to ask and I am therefore in a position to answer him a little fully.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

So far as Saman Press is concerned, the hon. Member is wrong. The sale actually had almost gone through when I first came to know about it. Only the deed had to be signed when I first came to know about it. I intervened at that stage and I am still in the process of trying to prevent that sale. Whether I will succeed or not, I cannot tell you. But there are legal complications because apparently implied contract is there. Whether I can break it or not is a different matter.

I want to assure him that I had in mind Saman Press. I do not want to give out all the Budget secrets, but you will get fairly satisfactory news in the Budget with regard to the school text-books. That is all I can tell you. I had in mind Saman Press not for publishing school text-books but because they have got, as I understood, a good colour litho-printing process and I wanted to use that for background reading for children, at least to have good nice pictures for the Kindergarten and so on. That is why I wanted that. But anyhow there are little obstacles. I am hoping to get over these obstacles if I can.

Now with regard to the other matter, it is a little more serious as the hon. Member for Galle says. I agree, but may I appeal to him to do one thing ? I know something about this and I am going very closely into this matter. Perhaps the hon. Member for Galle is not aware of the amount of racketeering that is going on under the guise of exporting gems. I am at the moment going into this whole question, and may I inform him that the thing is so bad that some of the officers of the Exchange Control Department cannot now be found. They have done the vanishing trick, not only themselves but also with the documents they had in their possession. That is the position in which I am placed. I am going into the whole question and I hope to make an announcement in the Budget on this whole question of the gem trade.

With regard to this particular dispute, that there is a dispute there is not the slightest doubt. We do not levy any duty on gems. There is no export duty on gems. So the officers quite rightly say that that is not their business. Appraisers can only value goods on which we levy a duty. That is the difficulty. Therefore they say, " We are not obliged to do so ". As a favour they might do so, but there is a difficulty in that. When they value, they also take a responsibility because on that the Exchange Control works and therefore they are not prepared to take that additional responsibility involved therein. It is a little complicated matter.

I will only remind the hon. Member for Galle about one thing if he can remember it. If you take your mind back, there was one person about whom you intervened about some gems some months back—may be a year or two back, if I remember right. Does the hon. Member for Galle know now that he was a fraud, that we have caught him, that he has been smuggling and making this country lose a large sum of money ? This is a big racket, this whole question of gems, and I have devoted some time—I have been here only a month—to unravel and ensure for this country its full foreign exchange that we should get on the export of gems. I will leave it at that. I will give you a full account of this whole business in the course of the Budget Debate. I hope satisfactory remedies will be forthcoming as a result of the steps I am taking. That is all. I want to tell the hon. Member for Galle, please do not press this because there is more in it than appears on the surface.

The hon. Member for Kamburupitiya (Mr. Percy Wickremasinghe) raised a question about rubber prices. Well, that is also worrying me a lot because I am losing foreign exchange. I am losing a considerable amount of foreign exchange, but there is nothing that I can do except to fight internationally to prevent the United States Government unloading its stockpile.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා]

The recent information that I have is that even England is unloading a certain amount of its rubber stock-pile, and this is tending to depress prices.

We are trying our best to see whether we can have a Government-to-Government agreement in order to sell at a slightly higher price.

I am very sorry about this because it effects the question of exchange.

**කථානායකතුමා**

*(சபாநாயகர்)*

(Mr. Speaker)

Is there a reply to the question addressed to the Minister of Food ?

**ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා**

*(கௌரவ கலாநிதி என். எம். பெரேரா)*

(The Hon. Dr. N. M. Perera)

About Kankesanturai, I agree with the hon. Member, because I myself saw unloading going on once.

Really the position is this. Since the Coalition Government came into existence, I am very glad to say, the output in the Colombo harbour has improved to a great extent. In fact, even today the Hon. Minister of Communications went round the harbour and satisfied himself. He appealed to the workers to give their fullest co-operation and I am told by him that the response was very heartening. I am very glad to hear that.

As a result of the improved position, we do not have to send ships to Kankesanturai now, but I shall keep this in mind.

It is my own personal view that it is very fair that we must try and develop all harbours ; there is no reason why we should develop only Colombo Harbour. We should develop all harbours ; that is one of the ways in which you develop the hinterland.

Our efforts must be to develop all harbours, and the hon. Member for Galle will be glad to know we are spending considerable money on the Galle Harbour, and you are going to have a breakwater for the Galle Harbour.

**වී. ටී. ජී. කරුණාරත්න මයා. (අධ්‍යාපන හා ගුවන් විදුලි පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. வீ. ரி. ஜீ. கருணாரத்ன—கல்வி, ஒலி பரப்பு அமைச்சரின் பாராளுமன்றக் காரிய தரிசி)*

(Mr. V. T. G. Karunaratne—Parliamentary Secretary to the Minister of Education and Broadcasting)

ගරු කථානායකතුමනි, උඩ වලවේ ව්‍යාපාරයෙන් මාතර දිස්ත්‍රික්කයේ අයට කොපමණ ඉඩම් ප්‍රමාණයක් ලැබුණාද කියා කඹුරුපිටියේ ගරු මන්ත්‍රීතුමා (පර්සි වික්‍රමසිංහ මයා.) අසන ලද ප්‍රශ්නය සම්බන්ධයෙන් සංඛ්‍යා විස්තර ඇතුළත් සම්පූර්ණ පිළිතුරක් මේ අවස්ථාවේදී දෙන්නට අමාරුයි. ඒ විස්තර සොයා බලා ගරු මන්ත්‍රීතුමාට පෞද්ගලිකව දන්වන්න බලාපොරොත්තු වෙනව. නමුත් එක් කරුණක් මේ අවස්ථාවේදී සඳහන් කරන්න කැමතියි. දැනට සති දෙකකට පමණ උඩදී ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ කම්කරුවන් 633 දෙනකුට ඉඩම් ලබා දී උඩ වලවේ ගං ඉවුරු ව්‍යාපාරයේ පදිංචි කෙරෙව්වා. ඒ පිරිස අතර මාතර දිස්ත්‍රික්කය ජන්ම භූමිය කරගෙන ඇති කම්කරු මහත්වරුන් කීප දෙනෙක්ම සිටි බව මට කියන්න පුළුවන්.

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

**මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව, අ. භා. 7.20 ට, 1964 ජූලි 24 වන සිකුරාදා පූ. භා. 10 වන තෙක් කල් ගියේ ය.**

*சபை, பி. ப. 7.20 இற்கு, 1964, ஜூலை 24, வெள்ளிக்கிழமை மு. ப. 10 மணி வரை ஒத்தி வைக்கப் பெற்றது.*

*The House adjourned at 7.20 p.m. until 10 a.m., on Friday, July 24, 1964.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සැ. යු.

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල ශුද්ධ කළ යුතු තැන් දක්වනු පිණිස මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන එහි වැරදි හරිගස්සා එම පිටපත ප්‍රධාන වාර්තාකරු හා හැන්සාඩ් සංස්කාරක වෙත

1964 ජූලි 31 වන සිකුරාදා

නොඉක්මවා ලැබෙන සේ එවිය යුතුයි.

---

குறிப்பு

அங்கத்தவர்கள் இறுதிப் பதிப்பிற் செய்ய விரும்பும் பிழை திருத்தங்களை அறிக்கையிற் றெளிவாகக் குறித்து பிழை திருத்தங்களைக் கொண்ட பிரதியை பிரதிநிதிகள் சபை பிரதம அறிக்கையாளர்—ஹன்சாட் பதிப்பாசிரியருக்கு

1964, ஜூலை 31, வெள்ளிக்கிழமைக்குப் பிந்தாமற்

கிடைக்கக்கூடியதாக அனுப்புதல் வேண்டும்.

---

NOTE

Corrections which Members suggest for the final Print should be clearly marked in this Report, and *the copy containing the corrections must reach* the Chief Reporter and Editor of HANSARD, House of Representatives,

not later than

Friday, 31st July, 1964

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දායක මුදල් : මුදල් ගෙවන දිනෙන් පසුව ඇරඹෙන මාසයේ සිට මාස 12ක් සඳහා රු. 32.00යි. අශෝධිත පිටපත් සඳහා නම් රු. 35.00යි. මාස 6කට ගාස්තුවෙන් අඩක්. පිටපතක් ශත 30යි. තැපෑලෙන් ශත 45යි. මුදල්, කොළඹ ශාඛ මුවදොර, මහලේකම් කාර්යාලයේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කලින් එවිය යුතුය.

1964

சந்தா : பணம் கொடுத்த தேதியை யடுத்துவரும் மாதம் தொடக்கம் 12 மாதத்துக்கு ரூபா 32.00 (திருத்தப்படாத பிரதிகள் ரூபா 35.00). 6 மாதத்துக்கு அரைக்கட்டணம் ; தனிப்பிரதி சதம் 30. தபால்மூலம் 45 சதம். முற்பணமாக அரசாங்க வெளியீட்டு அலுவலக அத்தியட்சரிடம் (த. பெ. 500, அரசாங்க கருமகம், கொழும்பு 1) செலுத்தலாம்.

1964

**Subscriptions** : 12 months commencing from month following date of payment Rs. 32.00 (uncorrected copies Rs. 35.00) Half rates for 6 months. Each part 30 cents, by post, 45 cents, payable in advance to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box 500, Colombo 1

1964

---

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි

இலங்கை, வாழைச்சேனை ஈஸ்ரேண் பேப்பர் மில்ஸ் கோப்பரேஷனுல் உற்பத்திசெய்யப்பட்ட காகிதத்தில், இலங்கை அரசாங்க அச்சகத்திற் பதிப்பிக்கப்பெற்றது

Printed at the Government Press, Ceylon, on paper manufactured at the Eastern Paper Mills Corporation, Valaichchenai, Ceylon

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org